# වාර්ෂික වාර්තාව 2022
# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**පස්සර පාර, බදුල්ල 90000**
**ශ්‍රී ලංකා**

Uva Wellassa University

## දැක්ම

ජාතික සම්පත් සමුදායට අගය එකතු කිරීම සඳහා වූ
විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම

## මෙහෙවර

ජාතික සම්පත් සඳහා අගය එකතු කිරීම කෙරෙහි
දැඩි අවධානයක් යොමු කරමින් ඉගැන්වීමෙහි,
ඉගෙනීමෙහි සහ පර්යේෂණයෙහි උත්කෘෂ්ඨත්වයට
පත්වන අතරම,ජාතික සංවර්ධනයට කැපී පෙනෙන
දායකත්වයක් ලබා දීම පිණිස දැනුමෙන්,
කුසලතාවලින්, සාරධර්මවලින් හා
ආකල්පයන්ගෙන් හෙබි බහුශ්‍රැත
සේවානියුක්තභාවයක් සහිත, තාක්ෂණතාන්ත්‍රික
හා ව්‍යවසායික උපාධිධාරීන් බිහිකිරීම

## උපකුලපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ ජාතික සම්පත් පදනමට අගය එකතු කිරීමේ විශිෂ්ඨ මධ්‍යස්ථානය බවට පත්වීම සිය දැක්ම කොටගෙන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2005 ජුනි මාසයේදී ස්ථාපිත කරන ලදී.

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සියලුම අධ්‍යයන වැඩසටහන් රටේ තිරසාර සංවර්ධනය සඳහා කැපී පෙනෙන දායකත්වයක් සැපයීමට අවශ්‍ය ආකල්ප, කුසලතා සහ දැනුම සහිතව මනාලෙස හැඩගැසුනු හා ඉහළ සේවානියුක්තභාවයකින් යුක්ත උපාධිධාරීන් බිහිකිරීම අරමුණු කර ගෙන සැළසුම් කර ඇත. ව්‍යවසායක විශ්ව විද්‍යාලයක් ලෙස, අපගේ උපාධිධාරීන් රැකියා සොයා යන පිරිසකට වඩා රැකියා අවස්ථාවන් සපයන්නන් ලෙස දැකීම අපගේ අභිලාෂයයි.

අප අපගේ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ පවුල ලෙස සලකනු ලබන්නෙමු. ගෞරවය සහ ඉවසීම ඉලක්ක දිශානතිය සම අවස්ථා විනය සහ ව්‍යවසායකත්වය යන කාරණා අප පවුලේ මූලික හරය වේ.

ගෙවුණු කෙටි කාල පරිච්ඡේදය තුළ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් සුවිශේෂී ගුණාත්මක බවින් යුක්ත බව අපි ඔප්පු කර ඇති අතර ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන්ගේ ඉහළ සේවා නියුක්ති අනුපාතය ඒ සඳහා පැහැදිලි සාක්ෂි දරයි.

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සියලු දෙනාගේ ගෞරවයට පාත්‍ර වන අගය එකතු කිරීමේ විශිෂ්ටතා මධ්‍යස්ථානය බවට පත්වනු ඇති අතර රැකියා සොයා යන උපාධිධාරීන් පමණක් නොව සේවා යෝජකයින් බවට පත්වන උපාධිධාරීන් බිහිකිරීමටද අප විසින් අඛණ්ඩව කටයුතු කරනු ඇත්තේය.

මහාචාර්ය ජයන්තලාල් රත්නසේකර

# හැඳින්වීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ 14 වැනි ජාතික විශ්වවිද්‍යාලය ලෙස 2005 ජූනි 1 දින පිහිටුවන ලදි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය යනු ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ප්‍රථම ව්‍යවසායක විශ්වවිද්‍යාලය වන අතර එය රටේ ආර්ථික සංවර්ධනයට දායක වීම සඳහා විද්‍යාත්මක, තාක්ෂණික සහ ව්‍යවසායක දැනුම භාවිතා කිරීමේ හැකියාව ඇති උපාධිධාරීන් බිහි කරයි. එය පිහිටා ඇත්තේ බදුල්ල ප්‍රදේශයේ මනරම් දර්ශනීය දසුනක් සහිත විචිත්‍රවත් කඳුකර භූමියක වන අතර අක්කර 64ක භූමි ප්‍රමාණයක පැතිරී ඇත.

2006 වසරේ සිසුන් 153 දෙනෙකුගෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් 25 දෙනෙකුගෙන් සහ පීඨ 3කින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් 5කින් සමන්විතව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ආරම්භ විය. වර්තමානයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය තුළ සිසුන් 3581 දෙනෙකු අධ්‍යයන කටයුතු සිදු කරන අතර පීඨ 4කින් උපාධි පාඨමාලා 15 ක් පිරිනමනු ලබයි.

අධ්‍යයන පරිපාලන සහ සේවා අංශයන්හි ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 376 දෙනෙකු සේවය කරයි. මීට අමතරව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධි වැඩ සටහන් බාහිර උපාධි වැඩ සටහන් ඉල්ලුම මත පදනම් වූ සහතික සහ ඩිප්ලෝමා පාඨමාලා ගණනාවක් මෙන්ම විවෘත හා දුරස්ථ ඉගෙනුම් පාඨමාලා පිරිනමනු ලබයි.

කෙටි කාලයක් තුළ  ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය එහි යටිතල පහසුකම් ඉගෙනුම් පරිසරය භෞතික හා මානව සම්පත් වැඩිදියුණු කිරීම ජාතික සම්පත් පදනමට වටිනාකමක් එක් කරමින් පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් වැඩිදියුණු කරමින් උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කරමින් ප්‍රගතියක් ලබා ඇත.



# පටුන


| | | | | |
|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල පාලනය | | | | 01 |
| | I | පාලක සභාව | | 01 |
| | II | සනාථන සභාව | | 02 |
| | III | ආයතනික ව්‍යුහය | | 04 |
| 1. | උපකුලපතිතුමාගේ සමාලෝචනය | | | 05 |
| | 1.1 | කෙටි හැඳින්වීම | | 05 |
| | | 1.1.1 | ශිෂ්‍ය ප්‍රජාව සහ උපාධිධාරී නිමැවුම පිළිබඳ විස්තර | 06 |
| | | 1.1.2 | අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ සමස්ථ සටහන | 07 |
| | | 1.1.3 | මූල්‍ය සුවිශේෂීතා | 08 |
| | 1.2 | ජයග්‍රහණ | | 09 |
| | | 1.2.1 | යටිතල පහසුකම් | 09 |
| | | 1.2.2 | අධ්‍යයන හා පර්යේෂණ ජයග්‍රහණ | 09 |
| | | 1.2.3 | විදේශ සංචාර සහ ජාත්‍යන්තර සහයෝගීතා | 11 |
| | | 1.2.4 | ශිෂ්‍ය ජයග්‍රහණ | 12 |
| | | 1.2.5 | වැඩමුළු, සම්මන්ත්‍රණ සහ වෙනත් වැඩසටහන් | 14 |
| | | 1.2.6 | පරිසර ක්‍රියාකාරකම්/ වැඩසටහන් සඳහා දායකත්වය | 16 |
| | | 1.2.7 | දුරස්ථ අධ්‍යාපනය | 17 |
| | | 1.2.8 | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහන් | 19 |
| | | 1.2.9 | කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | 22 |
| | | 1.2.10 | පුස්තකාලය | 22 |
| | | 1.2.11 | ක්‍රීඩා කටයුතු | 24 |
| | | 1.2.12 | විනෝදාස්වාදය: සමබර ජීවිතයක් උදෙසා | 27 |
| | | 1.2.13 | ප්‍රජා සත්කාර වැඩසටහන් | 28 |
| | 1.3 | අනාගත සැලසුම් | | 29 |
| 2. | සිසුන් සහ සම්පත් | | | 31 |
| | 2.1 | සිසුන් හා මානව සම්පත් පිළිබඳ සාරාංශය | | 31 |
| | 2.2 | සිසුන් බඳවා ගැනීම | | 31 |
| | 2.3 | උපාධි නිමැවුම් 2022 | | 36 |
| | 2.4 | නේවාසිකාගාර | | 37 |

| | | | |
|---|---|---|---|
| **3.** | මානව සම්පත් | | **43** |
| | 3.1 | අධ්‍යයන කාර්ය මණ්ඩලය | **44** |
| | 3.2 | පරිපාලන කාර්ය මණ්ඩලය | **45** |
| | 3.3 | පුස්තකාල කාර්ය මණ්ඩලය | **46** |
| | 3.4 | අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | **46** |
| | 3.5 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | **47** |
| | 3.6 | අනධ්‍යයන කාර්ය මණ්ඩල ව්‍යාප්තිය | **48** |
| | 3.7 | විශ්වවිද්‍යාල නිලධාරීන්ගේ පත්වීම් | **49** |
| | 3.8 | විශ්වවිද්‍යාල අංශ ප්‍රධානීන් පත්කිරීම | **50** |
| **4.** | පර්යේෂණ හා සංවර්ධන | | **51** |
| | 4.1 | පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන | **51** |
| | 4.2 | වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු | **52** |
| | 4.3 | ලැබුණු සම්මාන පිළිබඳ විස්තර | **53** |
| **5.** | ප්‍රාග්ධන වැඩ අංශය | | **54** |
| | 5.1 | ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති හා ප්‍රගතිය පිළිබඳ විස්තර | **54** |
| | 5.2 | පුනරුත්ථාපන ව්‍යාපෘති පිළිබඳ විස්තර | **55** |
| **6.** | මූල්‍ය ප්‍රකාශන 2022 | | **56** |
| | ගණන්දීමේ නිලධාරීගේ සහතිකය | | **56** |
| | 6.1 | එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම | **57** |
| | 6.2 | මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශය | **58** |
| | 6.3 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | **60** |
| | 6.4 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | **62** |
| | 6.5 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **63** |
| | 6.6 | ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | **65** |
| | 6.7 | මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය | **66** |
| | 6.8 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | **74** |
| | 6.9 | 2022 වර්ෂය සඳහා කාර්යසාධන (පාලන) වාර්තාව | **96** |
| | 6.10 | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් විශ්ලේෂණය | **97** |
| | 6.11 | වැඩසටහනේ සාරාංශය සහ ව්‍යාපෘති ප්‍රකාර පුනරාවර්තන වියදම් | **100** |

| | | | |
|---|---|---|---|
| **7.** | විගණකාධිපති වාර්තාව | | **102** |
| | 7.1 | විගණකාධිපති වාර්තාව | **102** |
| | 7.2 | විගණකාධිපති වාර්තාව තුල මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු | **112** |
| **8.** | තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම | | **123** |

# විශ්වවිද්‍යාල පාලනය

## I පාලක සභාව

1985 අංක 07 දරන (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්තියෙන් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්තිය ප්‍රකාරව 2022 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| නම | තනතුර | පත්කරන ලද දිනය |
|---|---|---|
| මහාචාර්ය ජේ.එල්.රත්නසේකර | උපකුලපති | නිල බලයෙන් පත්වන ලද සාමාජිකයින් |
| මහාචාර්ය එච්.එම්.එස්.කේ. හේරත් | පීඨාධිපති / සත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය | |
| මහාචාර්ය එච්.එම්.ජේ.සී. පිටවල | පීඨාධිපති/ ව්‍යවහාරික විද්‍යා පීඨය | |
| මහාචාර්ය කේ.බී. විජේසේකර | පීඨාධිපති/ තාක්ෂණ අධ්‍යයන පීඨය | |
| ජී.එච්. අබේවීර මහතා | පීඨාධිපති/ කළමනාකරණ පීඨය | |
| මහාචාර්ය කේ.ජී.සී. සේනාරත්න | සනාතන සභා නියෝජිත | 2022 සැප්තැම්බර් 30 |
| ආචාර්ය ඒ.පී හේනගමගේ | සනාතන සභා නියෝජිත | 2021 අප්‍රේල් 30 |
| මහාචාර්ය ඊ.ඩී.එන්.එස්. අබේරත්න | සනාතන සභා නියෝජිත | 2020 ජූනි 26 |
| එම්. රුබවතනන් මහතා | සනාතන සභා නියෝජිත | 2020 ජූනි 26 සිට 2022 ජූනි 29 දක්වා |
| **වි.වි.ප්‍ර.කො. සභාව පත්කළ සාමාජිකයන්** | | |
| චතුරංග ඒකනායක මහතා | නීතිඥ | 2020 පෙබ. 14 |
| ආචාර්ය සුසිල් දෙනගම | වෛද්‍ය නිලධාරි | 2020 පෙබ. 14 |
| අනුජක රණසිංහ මහතා | වරලත් ගණකාධිකාරී | 2020 පෙබ. 14 සිට 2022 සැප්තැම්බර් 30 දක්වා |
| ගාමිණී මහින්දපාල ජොපියස් මහතා | ශ්‍රී.ලං.ප.සේ. නිලධාරි | 2020 පෙබ. 14 |
| එස්.සී.ආර්.ඒ. උපාලි නිශ්ශංක ගුණසේකර මහතා | නීතිඥ | 2020 පෙබ. 14 |
| නිමල් අබේසිරි මහතා | හිටපු දිස්ත්‍රික් ලේකම්, බදුල්ල | 2020 පෙබ. 14 |
| නිමල් දාබරේ මහතා | බදුල්ල ව්‍යාපාරික සංගමයේ සභාපති | 2020 පෙබ. 14 |
| සම්මානිත මහාචාර්ය කේ.ඒ. නන්දසේන | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 2020 පෙබ. 14 |
| එම්.එෆ්. හිබතුල් කරීම් මහතා | ලේඛකාධිකාරී /පාලක සභාවේ ලේකම් | |

## II සනාතන සභාව

1985 අංක 07 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වැනි වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කරන ලද සනාතන සභාව 2022 වර්ෂයෙ දී පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| අංකය | නම | තනතුර |
|---|---|---|
| උපකුලපති | | |
| 1 | මහාචාර්ය ජේ. එල්. රත්නසේකර | උපකුලපති- සභාපති |
| පීඨාධිපතිවරුන් | | |
| 2 | මහාචාර්ය එච්.එම්.එස්.කේ. හේරත් | පීඨාධිපති/ සත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 3 | මහාචාර්ය එච්.එම්.ජේ.සී. පිටවල | පීඨාධිපති/ ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 4 | ජී.එච්. අබේවීර මහතා | පීඨාධිපති /කළමනාකරණ පීඨය |
| 5 | මහාචාර්ය කේ.බී. විජේසේකර | පීඨාධිපති / තාක්ෂණ අධ්‍යයන පීඨය |
| මහාචාර්යවරුන් | | |
| 6 | මහාචාර්ය ඩී.කේ.ඩී. ඩී.ජයසේන | සත්ව පාලන විද්‍යා අධ්‍යයන අංශය/ සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 7 | මහාචාර්ය ඊ.ඩී.එන්.එස්. අබේරත්න | සත්ව පාලන විද්‍යා අධ්‍යයන අංශය/ සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 8 | මහාචාර්ය ජී.කේ. ප්‍රේමතිලක | අපනයන කෘෂිකර්ම අධ්‍යයන අංශය/ සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 9 | මහාචාර්ය පී.ඊ. කාලියදාස (2022 අප්‍රේල් 20 සිට බලපැවැත්වෙන පරිදි) | අපනයන කෘෂිකර්ම අධ්‍යයන අංශය/ සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 10 | මහාචාර්ය පී.එම්. සිරිමාන්න | විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය/ ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 11 | මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර | විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය/ ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 12 | මහාචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු | කළමනාකරණ විද්‍යා අධ්‍යයන අංශය/ කළමනාකරණ පීඨය |
| 13 | මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.එම්. හේරත් | කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ පීඨය |
| 14 | මහාචාර්ය පී.බී. රත්නවීර | විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 15 | මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.පී. විජේසිංහ | අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය, සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 16 | මහාචාර්ය පී.එච්.ටී. කුමාර | රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය, කළමනාකරණ පීඨය |
| අංශාධිපතිවරුන් | | |
| 17 | ආචාර්ය ඩී.සී මුදන්නායක | සත්ව විද්‍යා අධ්‍යයනාංශය |
| 18 | මහාචාර්ය ඒ.එම්.ඩබ්ලිව්.කේ. සෙනෙවිරත්න | අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය |
| 19 | එම් රුබවතනන් මහතා (2022 ජනවාරි 19 සිට 2022 ජූලි 20 දක්වා) | රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය |
| 20 | ගරු. පී වාචිස්සර හිමි (2022 අගෝස්තු සිට මේ දක්වා) | රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය |
| 21 | ආචාර්ය කේ.එම්.එම්.සී.බී. කුලතුංග | කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය |

| | | |
|---|---|---|
| 22 | ආචාර්ය ජේ.පී.ආර්.සී. රණසිංහ | සංචාරක අධ්‍යයන අධ්‍යයනාංශය |
| 23 | ආචාර්ය ඒ.ඒ.කේ.කේ. ජයවර්ධන (2022 ජනවාරි 19 සිට 2022 සැප්තැම්බර් 21 දක්වා) | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය |
| 24 | සී.ජේ.පී. කුලතිලක (2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් 21, 2022) | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය |
| 25 | ආචාර්ය ඒ.පී හේනගමගේ | විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය |
| 26 | එස්.ඩී.එච්.එස්. වික්‍රමරත්න මෙනවිය | පරිගණක විද්‍යා සහ තොරතුරු අධ්‍යයනාංශය |
| 27 | ආචාර්ය ඒ.එස්. රත්නායක | ව්‍යවහාරික ජෛවීව් විද්‍යා අධ්‍යයනාංශය |
| 28 | ආචාර්ය කේ.ජී.සී. සේනාරත්න | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය |
| 29 | ආචාර්ය එච්.එම්.සී.එම්. හේරත් | ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය |
| 30 | ඩබ්ලිව්.එම්.සී.ජේ.ටී. කිතුල්වත්ත | වැඩ බලන ප්‍රධානියා/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය |
| 31 | එම්.එෆ්. හිබතුල් කරීම් | ලේඛකාධිකාරී |
| 32 | ආචාර්ය කේ.එම්.ආර්.කේ. කුලතුංග (2022 මාර්තු 16 සිට 2022 දෙසැම්බර් 21 දක්වා) | වැඩ බලන පුස්තකාලයාධිපති |
| 33 | ඩී.පී.සී. විතාන මෙනවිය (2022 ජනවාරි 19 සිට 2022 පෙබරවාරි 23 දක්වා) | වැඩ බලන පුස්තකාලයාධිපති |
| පීඨ නියෝජිතයින් | | |
| 34 | ආචාර්ය ආර්.ඒ.පී.අයි.එස්. ධර්මදාස | සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 35 | එන්.පී.පී. ලියනගේ | සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය |
| 36 | ආචාර්ය අයි.ඩී. සිංහලගේ | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 37 | ආචාර්ය ඊ.එම්.යූ.ඩබ්ලිව්.ජේ.බී.ඒකනායක | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 38 | ආචාර්ය ජේ සියඹලාපිටිය (2022 ජනවාරි 19 සිට 2022 ජූලි 20 දක්වා) | කළමනාකරණ පීඨය |
| 39 | ඩබ්ලිව්.ජී.එස්.ආර්. විජේසුන්දර | කළමනාකරණ පීඨය |
| 40 | ආචාර්ය ජී.ඩබ්ලිව්.ආර්. කීර්තිවංශ | තාක්ෂණ අධ්‍යයන පීඨය |
| 41 | ජේ.ඒ.එල්. නවීන්ද්‍ර මහතා | තාක්ෂණ අධ්‍යයන පීඨය |
| 42 | ඒ.එම්.කේ. දේවගිරි මිය | සහකාර රෙජිස්ට්‍රාර්/විභාග අංශය- ලේකම් වෙනුවට |
| ආරාධනය මත | | |
| 43 | ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී. අත්තනායක | අධ්‍යක්ෂ,තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය |

# සංවිධාන ව්‍යුහය

## ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

ස.ලේ.- සහකාර ලේඛකාධිකාරී, ස.ලේ. (පු.සේ.) - සහකාර රෙජිස්ට්‍රාර් (පුස්තකාල සේවා), අ.ප.ප්‍ර. (අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන), නෛ.ප්‍ර. (නෛතික හා ප්‍රලේඛන), ප්‍රා.වැ (ප්‍රාග්ධන වැඩ), ස.මූ. සහකාර මූල්‍යාධිකාරී, ස.පු. සහකාර පුස්තකාලයාධිපති, ප්‍ර.ආ.නි. ප්‍රධාන ආරක්ෂක නිලධාරී, නි.මූ- නියෝජ්‍ය මූල්‍යාධිකාරී, නි.පු. - නියෝජ්‍ය පුස්තකාලයාධිපති, නි.ලේ.-නියෝජ්‍ය ලේඛකාධිකාරී, නි.ලේ. (සා.ප.) - සාමාන්‍ය පරිපාලනය, නි.ලේ. (ශි.ක.) - ශිෂ්‍ය කටයුතු, නි.ලේ.(මා.ස.) - මානව සම්පත්, අ.අං.ප්‍ර.- අධ්‍යයන අංශ ප්‍රධානී, ව්‍යා.ක.-ව්‍යාපෘති කළමනාකරු, - උපකුලපතිගේ පුද්ගලික ලේකම්, ශා.අ.- ශාරීරික අධ්‍යාපනය, ජේ.ස.ලේ- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ජේ.ස.මූ. - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී,, ජේ.ස.අ.වි.- ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, ජේ.ස.පු.- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, වි.වෛ.නි- විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී, වැ.ඉ.- වැඩ CODL - විවෘත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය



# 1 උපකුලපතිගේ සමාලෝචනය

## 1.1 කෙටි හැඳින්වීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පීඨ 4කින් සමන්විත වන අතර දේශීය හා ගෝලීය අවශ්‍යතා සපුරාලන උපාධි පාඨමාලා 15ක් විශ්වවිද්‍යාලය විසින් උපාධි අපේක්ෂකයින් වෙත පිරිනමනු ලබයි. සියලුම උපාධි වැඩසටහන් බහුවිෂයික විෂයධාරාවලින් සමන්විත වන අතර එමගින් ව්‍යවසායකත්ව අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කෙරේ.

| පීඨය | උපාධි වැඩසටහන |
|---|---|
| සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය | • සත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>• විද්‍යාවේදී ගෞරව අපනයන කෘෂිකර්මය උපාධිය<br>• විද්‍යාවේදී ගෞරව තේ තාක්‍ෂණය සහ අගය වැඩි කිරීම උපාධිය<br>• විද්‍යාවේදී ගෞරව ජලජ සම්පත් තාක්‍ෂණය උපාධිය<br>• විද්‍යාවේදී ගෞරව ෆාම් සහ ක්‍ෂීර තාක්‍ෂණය හා අගය වැඩි කිරීම උපාධිය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | • විද්‍යා හා තාක්ෂණවේද තාක්ෂණවේදී ගෞරව උපාධිය<br>• කාර්මික තොරතුරු තාක්ෂණවේදී ගෞරව උපාධිය<br>• පරිගණක විද්‍යාව හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය<br>• ඛනිජ සම්පත් හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය |
| කළමනාකරණය පීඨය | • ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව ව්‍යවසායකත්ව හා කළමනාකරණය උපාධිය<br>• ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව ආගන්තුක සත්කාර, සංචාරක කර්මාන්ත සහ වැඩසටහන් කළමනාකරණය උපාධිය<br>• මානව සම්පත් සංවර්ධනය ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය |
| තාක්ෂණික අධ්‍යයන පීඨය | • යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය<br>• ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය<br>• තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය |

ගෝලීය කොවිඩ් – 19 වසංගතය හේතුවෙන් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ වුවද, 2022 වර්ෂයේදී, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් මාර්ගගත ප්‍රවේශයන්ට අනුවර්තනය වෙමින් සහ සෞඛ්‍ය රෙගුලාසිවලට අනුකූලව භෞතිකව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යමින් විශ්වවිද්‍යාල ප්‍රජාවට ඉගැන්වීම, ඉගෙනීම, රාජකාරී කටයුතු ඉටුකිරීමට සහ වෙනත් සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට වගබලා ගන්නා ලදී.

### 1.1.1 ශිෂ්‍ය ප්‍රජාව පිළිබඳ විස්තර සහ උපාධිධාරී නිමැවුම

2022 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක ශිෂ්‍ය ගහනය අඛණ්ඩව ඉහළ ගිය අතර එය මෙම වර්ෂයේ දී 4198ක් දක්වා වර්ධනය විය. 2022 වර්ෂයේ සිසුන්ගේ සමෝධායන වැඩසටහන සහ අධ්‍යයන කටයුතු මාර්ගගතව පවත්වන ලද අතර එමගින් ඉගැන්වීම සහ ඉගෙනීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලටය හැකි විය.




*රූපසටහන **1.1.** ශිෂ්‍ය සංඛ්‍යාව*

තවද, විකල්ප ඇගයීම් ක්‍රම ලෙස අධ්‍යයන ක්‍රියාකාරකම් සහ විභාග මාර්ගගතව පැවැත්වීමේ මාර්ගගත ක්‍රම තවදුරටත් පවත්වාගෙන යන ලදී. මීට අමතරව, අවසාන වසරේ සිසුන්ගේ සහ පශ්චාත් උපාධි සිසුන්ගේ රසායනාගාර ප්‍රායෝගික සැසි සහ පර්යේෂණ ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ භෞතිකව අඛණ්ඩව සිදු කරන ලද අතර එය සිසුන්ට තම උපාධිය කඩිනමින් සම්පූර්ණ කරීම සඳහා ඉවහල් විය.
උපාධිධාරී කාණ්ඩ එකොළහක් විවිධ අංශවල රැකියා සඳහා පහසුවෙන් අන්තර්ග්‍රහණය කරන ලද අතර, 2022 වසරේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පීඨ හතරෙන්ම උපාධිධාරීන් 692 දෙනෙක් උපාධිය ලැබූහ.

*වගුව **1.1.** උපාධිධාරී නිමැවුම – 2013-2022*

| උපාධි වැඩසටහන | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සත්ව පාලන විද්‍යාව | 36 | 50 | 35 | 42 | 31 | 62 | 46 | 45 | 33 | 46 | 426 |
| අපනයන කෘෂිකර්ම | 38 | 37 | 31 | 43 | 34 | 44 | 48 | 48 | 42 | 49 | 414 |
| තේ තාක්‍ෂණය සහ අගය වැඩි කිරීම | 40 | 42 | 37 | 43 | 19 | 39 | 30 | 38 | 22 | 29 | 339 |
| ජලජ සම්පත් තාක්‍ෂණය | - | 47 | 39 | 39 | 26 | 44 | 36 | 50 | 36 | 45 | 362 |
| තාල සහ ක්ෂීර තාක්‍ෂණය හා අගය වැඩි කිරීම | - | 39 | 38 | 44 | 17 | 33 | 36 | 36 | 24 | 36 | 303 |
| විද්‍යා හා තාක්ෂණය | 38 | 35 | 41 | 35 | 51 | 52 | 40 | 48 | 29 | 44 | 413 |
| පරිගණක විද්‍යාව හා තාක්ෂණය | 43 | 39 | 40 | 42 | 68 | 50 | 50 | 50 | 55 | 64 | 501 |
| කාර්මික තොරතුරු තාක්ෂණය | 41 | 40 | 43 | 40 | 31 | 52 | 50 | 56 | 55 | 58 | 466 |
| ඛනිජ සම්පත් හා තාක්‍ෂණය | 49 | 36 | 34 | 31 | 39 | 45 | 51 | 47 | 34 | 39 | 405 |
| ව්‍යවසායකත්ව හා කළමනාකරණය | 52 | 47 | 47 | 49 | 44 | 54 | 57 | 61 | 59 | 61 | 531 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආගන්තුක සත්කාරය, සංචාරක කර්මාන්ත හා වැඩසටහන් කළමනාකරණය | - | 32 | 51 | 42 | 50 | 48 | 57 | 62 | 59 | 59 | 460 |
| ඉංජිනේරු තාක්ෂණය | - | - | - | - | - | - | - | - | 56 | 84 | 140 |
| ජෛව පද්ධති තාක්ෂණය | - | - | - | - | - | - | - | - | 80 | 78 | 158 |
| **එකතුව** | **337** | **444** | **436** | **450** | **410** | **523** | **501** | **541** | **584** | **692** | **4918** |

උපාධි ප්‍රදානෝත්සවය - 2020 වැඩසටහන 2023 මාර්තු 25 වන දින මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය (MRICC) පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්විණි. මේ අනුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සිය උපාධිධාරීන්ට ඉහළ සේවා නියුක්තියක් සහිත දීප්තිමත් අනාගතයක් සහතික කෙරුණි.

### 1.1.2 අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ සමාලෝචනය

ඌවවෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් කුලපතිවරුන් තිදෙනෙකු සහ උපකුලපතිවරුන් සිව් දෙනෙකු විශවවිද්‍යාලය සඳහා පත් කර තිබේ. 2022 වර්ෂයේ දී අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහාය හා සේවා අංශයන්හි ව්‍යාප්තව සිටි ඌවවෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 389 ක් විය.

***වගුව 1.2. මුළු ස්ථිර කාර්යමණ්ඩලය - 2014-2022***

| ඛාණ්ඩය | | වර්ෂය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2014** | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | මහාචාර්ය | - | - | 2 | 6 | 6 | 8 | 8 | 15 | 18 |
| | සහාය මහාචාර්ය | - | - | - | - | - | - | - | 1 | 3 |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 21 | 38 | 45 | 53 | 51 | 60 | 73 | 82 | 81 |
| | කථිකාචාර්ය/ කථිකාචාර්ය (ආධුනික.) | 66 | 63 | 69 | 92 | 78 | 85 | 80 | 89* | 87 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | | 16 | 16 | 16 | 21 | 21 | 24 | 22 | 23 | 24** |
| පුස්තකාල කාර්ය මණ්ඩලය | | 3 | 3 | 3 | 3 | 4 | 3 | 3 | 3 | 3 |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | | - | - | - | - | - | - | - | - | 9 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 4 | 40 | 73 | 130 | 133 | 152 | 151 | 163 | 164 |
| එකතුව | | **110** | **160** | **208** | **309** | **289** | **332** | **337** | **376** | **389** |

**සටහන: * වි.වි.ප්‍ර.කො. චක්‍රලේඛය 935 යටතේ බඳවාගත් තාවකාලික කථිකාචාර්යවරුන් 03 දෙනෙකු මෙහි ඇතුළත් වේ.**

**සටහන** තාවකාලික පදනමමත සහකාර මුල්‍යාධිකාරී 02දෙනෙකු, 01 අර්ධකාලීන පදනම මත 1 ව්‍යාපෘති කළමනාකරුවෙකු සහ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වෙනුවට පැවරුම් පදනම මත ආරක්ෂක පරීක්ෂකවරයෙකු.**

### 1.1.3 මූල්‍ය සුවිශේෂීතා

2022 වර්ෂය තුළ සිදුකරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්වල මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ. ඒ අනුව, පුනරාවර්තන වියදම් අතුරින්, මුළු වියදමෙන් 70% ක්ම පෞද්ගලික පඩිනඩි සඳහා වැය කර ඇති අතර ඉතිරි මුදල වෙනත් වියදම් පියවා ගැනීම සඳහා වැයවී ඇත. ප්‍රාග්ධන වියදම්වලින් 41%ක් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යොදවා ඇත.







2022 වර්ෂය සඳහා වන මූල්‍ය සුවිශේෂීතාවන්හි සාරාංශය මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් දත්ත මූලාශ්‍රවලින් ලබාගත් විවිධ පරාමිතීන් අනුව ඉදිරිපත් කෙරේ.

පසුගිය වසර පහ තුළ එක් සිසුවෙකු සඳහා වූ පිරිවැය පහත වගුවේ සාරාංශ කර දැක්වේ.

***වගුව 1.3. ඒක ශිෂ්‍ය පිරිවැය - 2018-2022 ශිෂ්‍ය ගහනය***

| වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| ශිෂ්‍යයින් සංඛ්‍යාව | 2502 | 2701 | 2908 | 3581 | 4198 |
| පුනරාවර්තන වියදම් (රු. 000) | 1,090,613 | 1,300,169 | 1,358,590 | 1,469,525 | 1,755,119 |
| ප්‍රාග්ධන වියදම් (රු. 000) | 458,035 | 457,755 | 280,944 | 624,992 | 459,026 |
| ඒක ශිෂ්‍ය පිරිවැය- පුණරාවර්තන (රු. 000) | 436 | 481 | 467 | 410 | 418 |
| ඒක ශිෂ්‍ය පිරිවැය - ප්‍රාග්ධන (රු .000) | 183 | 169 | 97 | 175 | 109 |

## 1.2 ජයග්‍රහණ

ගෝලීය වසංගතය හේතුවෙන් ඇතිවූ බලපෑම් මධ්‍යයේ වුවද 2022 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පහත විස්තර කර ඇති පරිදි යටිතල පහසුකම්, ඉගෙනුම් සහ ඉගැන්වීම්, පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්, භෞතික හා මානව සම්පත් සහ ප්‍රජා සත්කාරක සේවා යන අංශයන් තුළ ජයග්‍රහණ අත්කර ගැනීමට සමත් විය. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් අත්කර ගන්නාලද විශිෂ්ට ජයග්‍රහණයවූකලී, විපත්තිවලට මුහුණ දීම සහ අදාළ කාර්යය ඉටු කිරීම පිණිස ප්‍රායෝගික ලෙස අධිෂ්ඨානයකින් යුතුව අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය සහ සිසුන් විසින් දක්වන ලද කැපවීම සහ සම්පත්දායකත්වය පිළිබඳ මනා සාක්ෂියකි.

### 1.2.1 යටිතල පහසුකම්

#### 1.2.1.1 නව පුස්තකාල ගොඩනැගිල්ල

අභිනවයෙන් ඉදිකරන ලද පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය 2022 දෙසැම්බර් 05 වන දින පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර මහතා ඇතුළු සම්භාවනීය ආරාධිතයන් රැසක් සහභාගි වූහ.

### 1.2.2 අධ්‍යයන හා පර්යේෂණ ජයග්‍රහණ

#### 1.2.2.1 එකොළොස් වැනි උපාධි ප්‍රධානෝත්සවය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 11 වන උපාධි ප්‍රධානෝත්සවය 2022 මාර්තු 25 වන දින මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානයේදී සාර්ථකව පැවැත්විණි. මෙහිදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති ත්‍රිපිටකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී සුමංගල රතනපාල ධම්මරක්ඛිත අතිපූජ්‍ය බෙංගමුවේ ශ්‍රී ධම්මදින්න නාහිමිපාණන් වහන්සේ විසින් උපාධිධාරීන් 584 දෙනෙකු සඳහා ප්‍රථම උපාධි ප්‍රදානය කරන ලදී. මෙම මෙම අවස්ථාව සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මහතා ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයින් රැසක් සහභාගී වූහ.

#### 1.2.2.2 හය වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRCUWU) 2022

" Elevating the Quest for Resilience to Spring Forward " යන තේමාව යටතේ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ 6 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2022 ජුලි 28-29 දිනවල මාර්ගගත සම්මන්ත්‍රණයක් ලෙස පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණය සඳහා ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා සිටින පර්යේෂකයින් විසින් සාරාංශ 489 කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් කරනලද අතර පුළුල් සමපදස්ථ සමාලෝචන ක්‍රියාවලියකින් අනතුරුව තේමාත්මක ක්ෂේත්‍ර දහයක් යටතේ ඉදිරිපත් කිරීම සඳහා පත්‍රිකා 221 ක් තෝරා ගන්නා ලදී. දකුණු කොරියාවේ චුන්ග්නම් ජාතික විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යාව පිළිබඳ කීර්තිමත් මහාචාර්යවරයෙකු වන මහාචාර්ය ජන්ග් මින් හියෝ විසින් මෙම සමුළුවේ ප්‍රධාන දේශනය පවත්වන ලද අතර විවිධ වාචික සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම්, මණ්ඩල සාකච්ඡා සහ වැඩමුළු යනාදියද මෙම සම්මන්ත්‍රණයට ඇතුළත්වූ අංග අතර විය. තිරසාර කෘෂිකර්මාන්තය සඳහා නව තාක්ෂණයන්, ව්‍යාපාර කළමනාකරණය සඳහා නව්‍ය ප්‍රවේශයන් සහ දේශගුණික විපර්යාස සහ ආපදාවලට ඔරොත්තු දීම සම්බන්ධයෙන් සිදුකරන පර්යේෂණවල නැගී එන ප්‍රවණතා යනාදී වශයෙන් වූ පුළුල් පරාසයක මාතෘකා මෙම ඉදිරිපත් කිරීම් මගින් ආවරණය කරන ලදී. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව පර්යේෂකයන්ට ඔවුන්ගේ නවතම සොයාගැනීම් හුවමාරු කර ගැනීමට සහ ලොව පුරා විසිරී සිටින සම පර්යේෂකයන් සමඟ සබඳතා ගොඩනගා ගැනීමට සාර්ථක වේදිකාවක් නිර්මාණය කරන ලද අතර එමගින්

පර්යේෂණ විශිෂ්ටත්වය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම යන විශ්වවිද්‍යාලයේ මෙහෙවරටද දායකත්වයක් සැපයීය.

### 1.2.2.3 පොත් ප්‍රකාශන -"ශිල්ප උගනී කුමරු සොඳවා"

ශාස්ත්‍රීය සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ සුවිශේෂී දායකත්වයක් සනිටුහන් කරමින් සහාය මහාචාර්ය වයි.එන්.එස්. විජේවර්ධනයන් විසින් 2022 ජුනි මාසයේදී -"ශිල්ප උගනී කුමරු සොඳවා" යන නමින් යුත් ග්‍රන්ථය පළකරන ලදී. පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් මහාචාර්යවරයාගේ කැපවීම පිළිබඳ සාක්ෂි දරන මෙම ප්‍රකාශනය, ශාස්ත්‍රීය ප්‍රජාව මනා අවබෝධයකින් පොහොසත් කරන අතර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය කටයුතු ඉටුකිරීම සම්බන්ධයෙන් සුවිශේෂී සන්ධිස්ථානයක් එමගින් සනිටුහන් කරයි.

### 1.2.2.4 LinkedEng - ඉංග්‍රීසි කඳවුර 2022

"LinkedEng - English Camp 2022" නමින් පැවැත්වූ වැඩසටහනේදී ව්‍යවහාරික ජෛවීය විද්‍යා අධ්‍යයනාංශයේ ඩබ්.ඒ.පී වීරකෝන් මහතා ඉංග්‍රීසි විවාද තරගයේ ප්‍රථම ස්ථානය ලබා ගන්නා ලද අතර එමගින් ඔහුගේ භාෂාමය කෞශල්‍යය සහ පරිපූර්ණ ශිෂ්‍ය සංවර්ධනය උදෙසා පීඨය විසින් දක්වන ලද කැපවීම මනාව විද්‍යාමාන විය.

### 1.2.2.5 ලෝකයේ ඉහළම පර්යේෂකයන් 2% අතරට පැමිණීම

මහාචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන 2019 වසරේ උපුටා දැක්වීම් බලපෑම මත පදනම්ව Elsevier BV සහ ඇමරිකා එක්සත් ජනපදයේ ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලය විසින් සකස් කරන ලද 2021 විශිෂ්ට පර්යේෂකයන්ගේ ලැයිස්තුවේ ලොව හොඳම පර්යේෂකයින්ගෙන් 2% අතරට ශ්‍රේණිගත විය.

### 1.2.2.6 අධ්‍යයන සැසිය 2022

සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය විසින් "කෘෂිකර්මාන්තයේ නැගී එන පර්යේෂණවල ශක්තිය උපයෝගී කර ගැනීම" යන තේමාව යටතේ අධ්‍යයන සැසිය 2022 මාර්ගගත වැඩසටහනක් ලෙස 2022 සැප්තැම්බර් 01 වැනි දින පවත්වන ලදී.

### 1.2.2.7 පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය-2022 වැඩසටහනේ "හොඳම පත්‍රිකා සම්මානය"

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ආචාර්ය ජයලත් ඒකනායක මහතා 2022 වර්ෂයේදී, පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය -2022 හිදී "හොඳම පත්‍රිකා සම්මානය" දිනාගනිමින් ගෞරවයට පාත්‍ර වූ අතර එමගින් පර්යේෂණ සහ අධ්‍යයන කටයුතුවල විශිෂ්ටත්වය උදෙසා විශ්වවිද්‍යාලයේ කැපවීම පිළිබිඹු විය.

### 1.2.2.8 මැණික් සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ (CODL) සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කරමින් ආචාර්ය ඒ.ඒ.ජී.ඩී.අමරසූරිය සිය අධ්‍යයන චාරිකාවේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ව්‍යවහාරික විද්‍යා පීඨයේ විශේෂයෙන් ව්‍යවහාරික ජෛවීය විද්‍යා අධ්‍යයනාංශය තුළ අධ්‍යයන ප්‍රමිතීන් ඉහළ

නැංවීම සඳහා අඛණ්ඩව ඉගෙනීමේ නියැලීම සම්බන්ධයෙන් වූ ආචාර්ය අමරසූරියගේ කැපවීම මෙම ජයග්‍රහය තුළින් පෙන්නුම් කරයි.

### 1.2.2.9 MERCON 2022 හොඳම පත්‍රිකාව සඳහා සම්මානය" - ආචාර්ය ඩබ්ලිව්.ඩී.සී.සී. විජේරත්න

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ක්ෂේත්‍රයේ තවත් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් එහි විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශයේ ආචාර්ය ඩබ්ලිව්.ඩී.සී.සී. විජේරත්න මොරටුව විශ්වවිද්‍යාලයේ කීර්තිමත් "MERCON 2022 හොඳම පත්‍රිකාව සඳහා සම්මානය " සම්මානයෙන් පිදුම් ලැබීය. මෙම ජයග්‍රහණය ආචාර්ය විජේරත්නගේ අති නවීන පර්යේෂණ සිදුකිරීම සඳහා ඇති කැපවීම පිළිබිඹු කරනවා පමණක් නොව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය හා පර්යේෂණ ක්ෂේත්‍රවල පවතින විශිෂ්ටත්වයේ ගමන්මග අවධාරණය කරයි. ශාස්ත්‍රීය විශිෂ්ටත්වයේ පහන් ටැඹක් ලෙස තම ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කර ගන්නා එවැනි ජයග්‍රහණ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ ඇත්තේ ඉමහත් ආඩම්බරයකි.

## 1.2.3 විදේශ සංචාර සහ ජාත්‍යන්තර සහයෝගීතා

### 1.2.3.1 සත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණ උපාධිධාරීන් සඳහා දකුණු කොරියාවේ සන්චියොන් ජාතික විශ්වවිද්‍යාලයෙහි පශ්චාත් උපාධි අවස්ථා

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර ප්‍රවේශයේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2022 පෙබරවාරි මාසයේදී දකුණු කොරියාවේ සන්චියොන් ජාතික විශ්වවිද්‍යාලය (SCNU) සමඟ සහයෝගීතාවයක් ගොඩනගා ගන්නා ලදී. මෙම සහයෝගීතාවය නිසා විශේෂයෙන් අපගේ සත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණ උපාධිධාරීන් සඳහා උපාධිධාරීන් සඳහා නව පශ්චාත් උපාධි අවස්ථා විවරවී ඇත. මෙම සහයෝගීතාවයේ විභවතාවය සහ පොරොන්දුව ඉස්මතු කරමින්, අපගේ විශිෂ්ට සත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය පිළිබඳ උපාධිධාරිනියක් වන නදීමා දිසානායක මහත්මිය සන්චියොන් ජාතික විශ්වවිද්‍යාලයේ සිය ශාස්ත්‍රපති උපාධිය ආරම්භ කරමින් සිය අධ්‍යයන චාරිකාව ආරම්භ කළාය. එවැනි ජාත්‍යන්තර සහයෝගීතාවන් අපගේ සිසුන් සඳහා අධ්‍යයන විශිෂ්ටත්වයට සහ අධ්‍යයන කටයුතු සඳහා නිරාවරණය වීමට මග පාදනවා පමණක් නොව ආයතන අතර ගෝලීය සබඳතා සහ අන්‍යෝන්‍ය අවබෝධය ශක්තිමත් වීමට උපකාරී වේ. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මෙම නිම්වළලු පුළුල් කිරීමට, ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීමට සහ අපගේ සිසුන්ට ලෝක මට්ටමේ අධ්‍යාපන අත්දැකීමක් ලබා දීමට ඇප කැපවී කටයුතු කරයි.

### 1.2.3.2 දකුණු කොරියාවේ චුංග්නම් ජාතික විශ්වවිද්‍යාලය (CNU) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම

2022 පෙබරවාරි මාසයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දකුණු කොරියාවේ චුංග්නම් ජාතික විශ්වවිද්‍යාලය (CNU) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹෙමින් සිය ගෝලීය සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගත්තේය. නුවන් චතුරංග මහතා චුංග්නම් ජාතික විශ්වවිද්‍යාලයෙහි සිය ශාස්ත්‍රපති අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමත් සමඟ මෙම සහයෝගීතාවය වහා ඵල දැරීය. මෙම සහයෝගීතාවය මගින් සිසුන් ජාත්‍යන්තරයට නිරාවරණය කිරීමට සහ ලෝක මට්ටමේ අධ්‍යාපන අවස්ථා ලබා දීමට විශ්ව විද්‍යාලය දරන කැපවීම මනාව අවධාරනය කරයි.

### 1.2.3.3 විදේශ විශ්වවිද්‍යාලයන්හි බාහිර දේශක පත්වීම් - මහාචාර්ය ඊ.ඩී.එන්.එස්. අබේරත්න

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඊ.ඩී.එන්.එස්. අබේරත්න ඔහුගේ සප්තවාර්ෂික නිවාඩු කාලය අතරතුර 2021 අප්‍රේල් සිට 2022 අප්‍රේල් දක්වා දකුණු කොරියාවේ සන්චියොන් ජාතික විශ්වවිද්‍යාලයේ බාහිර

මහාචාර්යවරයකු ලෙස සේවය කළේය. මෙම සහයෝගීතාවය ගෝලීය අධ්‍යයන හුවමාරුව සහ අන්‍යෝන්‍ය දැනුම බෙදාගැනීම සඳහාවන අපගේ කැපවීම මනාව පිළිබිඹු කරයි.

### 1.2.3.4 එඩ් විදුලි පරීක්ෂණය (ඩුබායි)

ආචාර්ය එච්.එම්.සී.එම් හේරත් මහතා ඩුබායි හි පැවති " එඩ් විදුලි පරීක්ෂණය" පිළිබඳ විශේෂිත පුහුණුවකට සහභාගී වෙමින් සිය වෘත්තීය සංවර්ධනයේ තවත් පියවරක් පෙරට තැබීය. උසස් පරීක්ෂණ ශිල්පීය ක්‍රම කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම සම්බන්ධයෙන් වඩා ප්‍රචලිත මෙම පුහුණුව තුළින් ආචාර්ය හේරත් වැනි වෘත්තිකයන් තම ක්ෂේත්‍රයේ නවතම ප්‍රවනතා සමඟ යාවත්කාලීනව සිටීමට දක්වන කැපවීම සහ අධ්‍යයන සහ වෘත්තීය ප්‍රජාව වෙත වැඩිදියුණු කළ ප්‍රවීණත්වය නැවත ගෙන ඒමට ඇති හැකියාව අවධාරණය කරයි.

### 1.2.3.5 සහසක් නිමැවුම් ඇගයීම් මණ්ඩලය

ඉංජිනේරු පී.ජී.එස්.ආර්. විජේතුංග මහතා අන්තර්ජාලය මගින් පවත්වන ලද "සහසක් නිමැවුම්" වැඩසටහනේ ඇගයුම් මණ්ඩලයේ සාමාජිකයෙකු බවට පත්වෙමින් සිය විශේෂඥතාව ප්‍රකට කළේය. කමිටු සාමාජිකයෙකු ලෙස ඔහුගේ මෙම සහභාගීත්වය ක්ෂේත්‍රයේ පළපුරුදු වෘත්තිකයෙකු ලෙස ඔහුගේ පිළිගැනීම සහ පුළුල් ප්‍රජාව තුළ නවෝත්පාදන සහ නිර්මාණශීලිත්වය පෝෂණය කරන ක්‍රියාකාරකම්වලට දායක වීම සම්බන්ධයෙන් ඔහු තුළ ඇති කැපවීම පැහැදිළි කරයි.

## 1.2.4 ශිෂ්‍ය ජයග්‍රහණ

### 1.2.4.1 ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ 2022 වර්ෂයේ මිනිත්තු තුනේ නිබන්ධන තරඟය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය තම සිසුන්ගේ විශිෂ්ට පර්යේෂණ ඉදිරිපත් කිරීම් දැකබලාගනිමින් එහි මිනිත්තු තුනේ නිබන්ධනය තරඟය 2022 ඔක්තෝම්බර් 31 වන දින පැවැත්වීය. මෙම තරගයේ ප්‍රථමස්ථානය අවසන් වසරේ ශිෂ්‍යාවක වන සී.කේ. වල්හේන මෙය විසින් දිනාගන්නා ලදී. "ශ්‍රී ලංකා සාම්ප්‍රදායික තේ වෙන්දේසිය විද්‍යුත් වෙන්දේසියක් බවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් සැපයුම් දාමයේ කොටස්කරුවන්ගේ තෘප්තිමත්භාවයේ මට්ටම පිළිබඳ අධ්‍යයනය" යන මාතෘකාවෙන් සිය ඉදිරිපත් කිරීම සිදු කරමින් ඇය විනිශ්චය මණ්ඩලයේ සිත් ඇද බැඳ තබාගත්තාය. ආචාර්ය එම්.කේ.එස්.එල්.ඩී. අමරතුංග විසින් අධීක්ෂණය කරන ලද මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තේ වෙන්දේසි ක්‍රමවල සමකාලීන විපර්යාසය සහ සැපයුම් දාමයේ පාර්ශ්වකරුවන් කෙරෙහි එහි ඇති බලපෑම් පැහැදිළි කරයි.

### 1.2.4.2 ENG HACK 2022 තරඟයේදී ටීම් රොලෙක්ස් පළමු ස්ථානය දිනාගැනීම

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යා කණ්ඩායම විසින් මාර්ගගත තරඟයක් වන ENG HACK 2022 තරඟයෙහි පළමු ස්ථානය ලබා ගනිමින් සිය සුවිශේෂී කුසලතා ප්‍රදර්ශනය කරන ලදී. "ටීම් රොලෙක්ස් " ලෙස තරඟ වදින ඔවුන්ගේ මෙම විජයග්‍රහණය තාක්ෂණය සහ නවෝත්පාදන යන අංශ පිළිබඳ විශ්ව විද්‍යාලයේ ප්‍රවීණත්වය පිළිබිඹු කරයි.

### 1.2.4.3 ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ 2022 එක්ස්පෝ තරඟ ජයග්‍රහණය

බොහෝ දෙනෙකු අපේක්ෂාවෙන් සිටි ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ EXPOUWU වැඩසටහන අධ්‍යයන හා පර්යේෂණ ජයග්‍රහණ රාශියක් ප්‍රදර්ශනය කරමින් 2022 ඔක්තෝම්බර් 28 වෙනි දින පවත්වන ලදී. ආචාර්ය සසිත මහතාගේ මගපෙන්වීම යටතේ පර්යේෂණ සිදුකළ ශිෂ්‍යයකුට 'හොඳම පෝස්ටර්' සම්මානය පිරිනැමීම එහි කැපී

පෙනෙන විශේෂත්වයක් විය. මෙම පිළිගැනීම ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය විසින් සිදු කරන ලද දැඩි පර්යේෂණ ප්‍රයත්නයන් පිළිබඳව අවධාරනය කරන අතර මනා කැපවීමකින් යුතුව පීඨය විසින් වැඩි දියුණු කරන ලද ශාස්ත්‍රීය විශිෂ්ටත්වයට එමගින් සැමරුම් ලබයි.

### 1.2.4.4 විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ ශ්‍රී ලංකා ජාතික නවෝත්පාදන 2022 තරගය

සුවිශේෂී වැඩසටහනක් වූ "IEEE ශ්‍රී ලංකා ජාතික නවෝත්පාදන 2022" තරඟයේ දී, අනුශූරතාවය දිනා ගනිමින් කණ්ඩායම ප්‍රශංසනීය ස්ථානයක් ලබා ගත් අතර එතුළින් ඔවුන්ගේ නවෝත්පාදන දක්ෂතාවය සහ තාක්ෂණික අභිවෘද්ධිය සඳහා වූ කැපවීම මනාව විද්‍යාමාන කළේය.

### 1.2.4.5 තිරසාර නගර සහ ප්‍රජාවන් සඳහා ජී17 තානාපති

විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශයේ සිසුන් තිරසාර නගර සහ ප්‍රජාවන් සඳහා වන ජී17 තානාපතිවරයා "හොඳම නවෝත්පාදන ව්‍යාපෘතිය" සහ "හොඳම බලපෑම් සහිත ව්‍යාපෘතිය" ඇතුළු සම්මාන කිහිපයකින් පිදුම් ලැබීය. තිරසාර නාගරික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා එහි කැපවීම අගයමින් "ඉලක්කගත තිරසාර නගර සහ ප්‍රජාවන්ගේ හොඳම ව්‍යාපෘතිය" සඳහාද ඔවුන් සම්මානයට පාත්‍ර විය.

### 1.2.4.6 විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ කලාපීය ආදර්ශවත් ශිෂ්‍ය ශාඛා සම්මානය 2022

විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ කලාපීය ආදර්ශවත් ශිෂ්‍ය ශාඛා සම්මානය 2022 වැඩසටහනේ දී විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශයේ සිසුන් ගෞරවාදරයට පාත්‍ර විය. මෙම සම්මානය තුළින් විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ විශිෂ්ටත්වයට සහ එහි මෙහෙවරට අනුකූලව පෙළගැස්ම සඳහා අධ්‍යයනාංශයේ කැපවීම ඉස්මතු කරමින් විශිෂ්ට මෙහෙයුම් ක්‍රියාවලියක් ප්‍රදර්ශනය කළ IEEE ශිෂ්‍ය ශාඛා සඳහා මහජන පිළිගැනීමක් ලබා දෙයි.

### 1.2.4.7 ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමයේ ජාතික දක්ෂතා සම්මාන

ශ්‍රී ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමයේ ජාතික දක්ෂතා සම්මාන උළෙලේදී, තො.තා./ව්‍යා.ක්‍රි.කළමනාකරණ අංශයේ හොඳම UN17 SDG ආරම්භක/මෘදුකාංග විසඳුම" සඳහා "Trash For Trade" වැඩහටහන විශාල පිළිගැනීමකට ලක් වූ අතර එම කාණ්ඩයේ අනුශූරතාවය ලබා ගත්තේය. මෙම ජාතික මට්ටමේ පිළිගැනීම මගින් " Trash For Trade" වැඩසටහන තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ පෙළගැස්වීම පිළිබඳව සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යා.ක්‍රි.කළමනාකරණ අංශයේ බලපෑම්කාරී වෙනසක් ඇති කරන්නාවූ නව්‍ය ප්‍රවේශය පිළිබඳව අවධාරනය කරයි

### 1.2.4.8 IEEE Boost වීඩියෝ තරඟය

ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශයේ සිසුහු IEEE Boost වීඩියෝ තරඟයේ "ජයග්‍රාහකයා" වශයෙන් ඉහළම ස්ථානය දිනා ගනිමින් සුවිශේෂී පිළිගැනීමකට පාත්‍රවූහ. මෙම ජයග්‍රහණය තුළින් වීඩියෝ නිෂ්පාදනය සම්බන්ධයෙන් ඔවුන් සතු සුවිශේෂී කුසලතා සහ IEEE ප්‍රජාව තුළ විශිෂ්ටත්වය සඳහා ඔවුන් තුළ ඇති කැපවීම පිළිබඳව අවධාරනය කරයි.

### 1.2.5 වැඩමුළු, සම්මන්ත්‍රණ සහ වෙනත් වැඩසටහන්

#### 1.2.5.1 ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා තත්ත්ව ප්‍රමිතිකරණය පිළිබඳ වැඩමුළුව

2022 ඔක්තෝම්බර් 27 වන දින යහපත් කෘෂිකාර්මික පිළිවෙත්, ජානමය වෙනස්කිරීම්, උපද්‍රව විශ්ලේෂණය සහ තීරණාත්මක පාලන අවස්ථා සහ, ප්‍රමිතකරනය පළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ තත්ත්ව ප්‍රමිතිකරණය යන කාරණා කෙරෙහි අවධානය යොමු කරන ලද වැඩමුළුවක් පවත්වමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසායකයන්ගේ (SMEs) නිපුණතා ඉහළ නැංවීම පිණිස ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. මෙම ප්‍රයත්නය මඟින් කර්මාන්තයන්හි ප්‍රමිතීන් ඉහළ නැංවීමට සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල අභියෝගවලට මුහුණදීම සඳහා රට තුළ සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දැනුම ඉහළ නැංවීම පිණිස විශ්වවිද්‍යාල සිදුකළ කැපවීම අවධාරනය කරයි.

#### 1.2.5.2 ආහාර ස්වස්ථතාවය සහ පුද්ගලික ස්වස්ථතාවය පිළිබඳ වැඩමුළුව

බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කරමින් " ස්වස්ථතාවය සහ පුද්ගලික ස්වස්ථතාවය " පිළිබඳ අවධානය යොමු කරන වැඩමුළුවක් 2022 අගෝස්තු 16 වන දින පවත්වන ලදී.

#### 1.2.5.3 ප්‍රථම ගොවිපල සත්ව අභිජනනය සහ ප්‍රජනන සංසදය

2022 මාර්තු 15 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් "ගොවිපල සත්ව අභිජනන සහ ප්‍රජනන සංසදයේ" සමාරම්භක වැඩසටහන පැවැත්වනු ලැබීය. පර්යේෂකයන්ට, ගොවීන්ට සහ කර්මාන්ත වෘත්තිකයන්ට ඵලදායී සාකච්ඡාවල නිරත වීමට සහ දැනුම හුවමාරු කර ගැනීමට වේදිකාවක් සපයමින් ගොවිපළ සත්ත්ව අභිජනනය සහ ප්‍රජනන ශිල්පීය ක්‍රමවල නවතම දියුණුව මෙම වැඩසටහනේ දී ඉදිරිපත් කෙරිණි.

#### 1.2.5.4 කිරිගව පෝෂණය සහ සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය යටතේ පවතින සත්ව විද්‍යා අධ්‍යයනාංශය විසින් "කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවීන් සඳහා කිරි ගව පෝෂණය සහ සෞඛ්‍ය කළමනාකරණය" යන මැයෙන් වැඩමුළුවක් 2022 නොවැම්බර් 22 දින ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී. ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ එක්ව සංවිධානය කරන ලද මෙම වැඩමුළුව මෙම ගොවීන්ට කිරි නිෂ්පාදනය ප්‍රශස්ත කිරීමට සහ තම ගවයින්ගේ යහපැවැත්ම පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය අවබෝධය සහ යහපත් භාවිතයන් පිළිබඳ දැණුම ලබා දීම අරමුණු කර ගෙන පවත්වා ඇත.

#### 1.2.5.5 ගෑස් වෙල්ඩින් පුහුණු වැඩමුළුව

ආචාර්ය ජී.ඩබ්ලිව්.ආර්.කීර්තිවංශ මහතා යාන්ත්‍රික අංගනයේ පැවති "ගුරු කාර්යමණ්ඩල පුහුණුව - ගෑස් වෙල්ඩින් පුහුණු වැඩමුළුව" සඳහා ක්‍රියාකාරීව සහභාගී විය. ආචාර්ය මණ්ඩලයේ නිපුණතා ඉහළ නැංවීම සඳහා සංවිධානය කර ඇති මෙම වැඩමුළුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනඥයින් ප්‍රායෝගික විශේෂඥතාව අතින් ඉදිරියෙන්ම සිටින බවට සහතික කිරීමට දක්වන කැපවීම පිළිබඳ අගනා සාක්ෂියකි. ආචාර්ය කීර්තිවංශගේ මැදිහත්වීම අඛණ්ඩ ඉගෙනීම සඳහා ඔහුගේ කැපවීම පිළිබිඹු කරනවා පමණක් නොව එතුළින් ඔහුගේ ගුරුහරුකම් යටතේ සිසුන්ගේ ඉගෙනුම් පරිසරය ද පොහොසත් කරයි.

### 1.2.5.6 ඌව පළාත් ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන 2022

2022 දී සහාය මහාචාර්ය වයි.එන්.එස්. විජේවර්ධන ඌව පළාත් ආපදා අවදානම් අවම කිරීමේ (DRR) වැඩසටහන සඳහා ක්‍රියාකාරී දායකත්වය සැපයීය. ප්‍රාදේශීය සංවර්ධන සහ ආපදා අවම කිරීමේ උපාය මාර්ග පිළිබඳ ශාස්ත්‍රීය විශේෂඥතාවේ වැදගත්කම ඔහුගේ සහභාගීත්වය තුළින් ඉස්මතු විය. ප්‍රධාන දායකයෙකු ලෙස සහාය මහාචාර්ය විජේවර්ධන මහතා ප්‍රජාව තුළ දරාගැනීමේ හැකියාව සහ තිරසාර සංවර්ධනය පෝෂණය කිරීම සඳහා වටිනා අවබෝධයක් ලබා දෙමින් ඒ සඳහා ක්‍රමවේදයන් ඉදිරිපත් කළ අතර ඒ සම්බන්ධයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කැපවීම මෙහිදී විද්‍යාමාන විය.

### 1.2.5.7 ව්‍යවසායකත්ව සංවර්ධනයේ ප්‍රමුඛයා ඔබයි (TOT) - ඔක්තෝබර් 2022

මහාචාර්ය කේ.ජී.සී. සේනාරත්න 2022 ඔක්තෝබර් මස 10 වැනි දින සිට 14 වැනි දින දක්වා " ව්‍යවසායකත්ව සංවර්ධනයේ ප්‍රමුඛයා ඔබයි" යනුවෙන් පැවැති පුහුණුකරුවන් පුහුණු කිරීමමේ වැඩසටහන සඳහා ක්‍රියාකාරීව සහභාගී විය. ඔහුගේ සහභාගීත්වය තුළින් ව්‍යවසායකත්ව සංවර්ධන ක්ෂේත්‍රය තුළ ශාස්ත්‍රීය විශේෂඥතාවේ වැදගත්කම විද්‍යාමාන කළේය. මෙම ප්‍රයත්නය සඳහා මහාචාර්ය සේනාරත්නගේ මැදිහත්වීම මගින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ නව ව්‍යවසායකයින් බිහිකිරීම, ආර්ථික වර්ධනය සඳහා දායකවීම  සහ නව්‍යකරණයන් සඳහා ඇති කැපවීම පිළිබිඹු වේ.

### 1.2.5.8 ජලාපවහන ද්‍රෝණි සංරක්ෂණය -සහාය මහාචාර්ය ඩී.ටී උඩගෙදර

" ජලාපවහන ද්‍රෝණි සංරක්ෂණය" නමින් වූ වැදගත් වැඩසටහනක් 2022 ජනවාරි මාසයේදී බදුල්ල සහ මොණරාගල ප්‍රදේශවල පැවැත්විණි. ව්‍යවහාරික ඍජීවී විද්‍යා අධ්‍යයනාංශයේ සහාය මහාචාර්ය ඩී.ටී. උඩගෙදර විසින් මෙහෙයවන ලද මෙම වැඩමුළුව එ.ජා.සං.වැඩසටහන සමග සහයෝගීතාවෙන් යුතුව පැවැත්වූ වැඩසටහනක් වූ අතර, පාරිසරික සමතුලිතතාවය සහ තිරසාර සංවර්ධනය සඳහා ජලාපවහන ද්‍රෝණි සංරක්ෂණය කිරීමේ වැදගත්කම මෙහිදී අවධාරණය කළේය. මෙම වැංසටහනේදී මහාචාර්ය උඩගෙදරගේ විසින් ඊට දෙන ලද නායකත්වය සහ විශේෂඥභාවය පාරිසරික සංරක්ෂණය සම්බන්ධයෙන්  අධ්‍යයනාංශයේ කැපවීම සහ කලාපීය පාරිසරික අභියෝගවලට මුහුණ දීම සම්බන්ධයෙන් වන එහි ක්‍රියාකාරී භූමිකාව හොවාදක්වයි.

### 1.2.5.9 ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන - ඩබ්ලිව්.ඒ.පී.පී. ක්‍රිස්ටෝපර් මහතා

ඔක්තෝබර් සහ නොවැම්බර් යන මාසවලදී ඌව පළාතේ ආපදා කළමනාකරණ කමිටු විසින් සංවිධානය කරන ලද "ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන" සඳහා ඩබ්ලිව්.ඒ.පී.පී. ක්‍රිස්ටෝපර් මහතා දායක වූ අතර එහිදී සිදුවිය හැකි ආපදා අවම කිරීම සඳහා සූදානම් වීමේ වැදගත්කම සහ සාමූහික ප්‍රයත්නවල වැදගත්කම ඔහු අවධාරණය කළේය.

### 1.2.5.10 ඇසිඩ් පතල් ජලාපවහනය සහ විරළ ඍජීවී මූලද්‍රව්‍ය අවම කිරීම- ඩී.ජේ කෝට්ටහේවා මෙනවිය.

2022 මැයි මාසයේදී ඩී.ජේ. කෝට්ටහේවා "ඇසිඩ් පතල් ජලාපවහනය සහ විරළ ඍජීවී මූලද්‍රව්‍ය අවම කිරීම" යන මාතෘකාව යටතේ අදහස් දක්වමින් පෘතුගාලයේ ලිස්බන් නුවර ජාත්‍යන්තර වේදිකාවක දී ඇයගේ විශේෂඥතාව විද්‍යාමාන කළාය. පාරිසරික අභියෝග පිළිබඳ ගෝලීය සාකච්ඡාවල වැදගත්කම සහ දැවෙන ගෝලීය ගැටලුවලට

විසඳුම් ලබාදීමේදී කෝට්ටේහේවා වැනි වෘත්තිකයන්ගේ කාර්යභාරයේ වැදගත්කම ඇයගේ සහභාගිත්වයෙන් අවධාරණය කරයි.

### 1.2.5.11 DiffAbs සඳහා SOLEIL Synchrotron Beamtime- ඩී.ජේ කෝට්ටහේවා මෙනවිය

ඩී.ජේ. කෝට්ටහේවා මහත්මිය 2022 සැප්තැම්බර් මාසයේදී ප්‍රංශයේ ඉතා වැදගත් පර්යේෂණයක් ආරම්භ කළ අතර එහිදී ඇය විශේෂයෙන් DiffAbs අධ්‍යයනය සඳහා SOLEIL synchrotron beamtime යොදාගැනීම පිළිබඳ පර්යේෂණයේ ක්‍රියාකාරීව නිරත වූවාය. පුරෝගාමී පර්යේෂණ සඳහා ඇයගේ කැපවීම සහ විද්‍යාත්මක විමර්ශනයේ සීමාවන් පුළුල් කිරීම සඳහා SOLEIL synchrotron වැනි උසස් ගෝලීය පහසුකම් භාවිතා කිරීමේ වැදගත්කම ඇයගේ මැදිහත්වීම තුළින් අවධාරනය කරයි. ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ පර්යේෂණ ඉදිරිපත් කිරීම.

### 1.2.5.12 විරළ පෘථිවි මූලද්‍රව්‍යයන් පිළිබඳ (පරිසර) ධූලක විද්‍යාව - ඩී.ජේ කෝට්ටහේවා මෙනවිය

නොවැම්බර් මාසයේදී ජර්මනියේ හැම්බර්ග් නුවරදී " විරළ පෘථිවි මූලද්‍රව්‍යයන් පිළිබඳ (පරිසර) ධූලක විද්‍යාව " යන මාතෘකාව යටතේ ඉදිරිපත්කිරීමක් සිදුකරමින් ඩී.ජේ කෝට්ටහේවා මෙනවිය සිය පර්යේෂණ ගමන්මග පුළුල් කළාය. ඇයගේ මැදිහත්වීම හරහා මෙම වැදගත් විෂය සම්බන්ධයෙන් ඇයගේ විශේෂඥතාව ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්වන අතර විරළ පෘථිවි මූලද්‍රව්‍යයන්ගේ පාරිසරික සබඳතාවය පිළිබඳව පවතින ගෝලීය සාකච්ඡාවල වැදගත්කම තවදුරටත් ශක්තිමත් කරයි.

### 1.2.5.13 Going Global Partnerships: UNICYCLE ව්‍යාපෘතිය

2022 ජනවාරි සිට සැප්තැම්බර් 26 දක්වා "UNICYCLE" ව්‍යාපෘතිය මගින් Going Global Partnerships යටතේ ක්‍රියාකාරී පුරවැසි ගෝලීය ආදි සිසු ප්‍රජාව වෙත උපාධි අපේක්ෂකයින් 46ක් එක් කරමින් සැලකිය යුතු ජයග්‍රහණයක් අත්කර ගත්තේය. ශ්‍රී ලංකා බ්‍රිතාන්‍ය කවුන්සිලය, එක්සත් රාජධානියේ ග්ලාස්ගෝ කැලිඩෝනියානු විශ්වවිද්‍යාලය සහ දේශීය හවුල්කාර විශ්වවිද්‍යාල දෙකක් අතර ක්‍රියාත්මක වූ සහයෝගී ප්‍රයත්නයක් හේතුවෙන් මෙම සාර්ථකත්වය ඇති විය. මෙම හවුල්කාරිත්වය තුළින් ගෝලීය පුරවැසිභාවය ශක්තිමත් කිරීම සහ දේශීය සිසුන්ගේ දැණුම් නිම් වළලු පුළුල් කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවයේ විභවයන් පෙන්නුම් කළේය.

### 1.2.5.14 පරිසරය ක්‍රියාකාරකම්/වැඩසටහන් සඳහා දායකත්වය දැක්වීම

### 1.2.5.15 විශ්වවිද්‍යාල පරිසර කමිටුවේ සාමාජිකත්වය

සහාය මහාචාර්ය වයි.එන්.එස් විජේවර්ධන මිය සමස්ථ ආයතනික සංවර්ධනය උදෙසා වන ඇයගේ අඛණ්ඩ කැපවීම තුළින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල පරිසර කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියාකාරීව සේවය කරමින් පාරිසරික තිරසාරත්වය සහ භාරකාරත්වය සඳහා ආයතනයේ කැපවීම මැනවින් අවධාරණය කළාය.

### 1.2.5.16 වනාන්තර ප්‍රතිසංස්කරණ වැඩසටහන - උඩකිරුව, ලුණුගල

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය පරිසර සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කළ ප්‍රශංසනීය වැඩසටහනක ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේය. උඩකිරුව, ලුණුගල ශාන්ත පරිසරයක ක්‍රියාත්මක කර ඇති වන ප්‍රතිසංස්කරණ වැඩසටහන තිරසාර භාවිතයන් සහ පාරිසරික සමතුලිතතාවය සම්බන්ධයෙන් වන අධ්‍යයනාංශයේ කැපවීම පිළිබඳ මනා සාක්ෂියකි. එවැනි ප්‍රයත්නයන් මගින් විශ්වවිද්‍යාලය තම අධ්‍යයන හා

තාක්‍ෂණික දියුණුව සඳහා පමණක් නොව අපේ කාලයේ පවතින දැවෙන පාරිසරික අවශ්‍යතා සඳහා ද කැපවී කටයුතු කරන බව අවධාරනය කරයි.

### 1.2.5.17 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්වයං ප්‍රවේශ මධ්‍යස්ථානයක් බවට පත්වීම

ව්‍යවහාරික පෘථිවි විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ඒ.ඒ.ජී.ඩී.අමරසූරිය විසින් දරන ලද වෑයමක ප්‍රතිපලයක් ලෙස 2022 නොවැම්බර් 22 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ස්වයං ප්‍රවේශ මධ්‍යස්ථානය අත්‍යවශ්‍ය පාරිසරික සාකච්ඡා සඳහා කේන්ද්‍රස්ථානයක් බවට පත් විය. සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරමින් ආචාර්ය අමරසූරිය මහතා "පර්යේෂණ ආචාර ධර්ම සහ කොල්ලකෑම්" පිළිබඳ අවධානය යොමු කළ සැසියකට නායකත්වය දුන්නේය. මෙම වැඩසටහන හරහා ඔහු පාරිසරික පර්යේෂණවල ඒකාග්‍රතාව පවත්වා ගැනීමේ වැදගත්කම සහ සදාචාර විරෝධී භාවිතයන්ගේ ප්‍රතිවිපාක පිළිබඳ අවධාරණය කළ අතර, පාරිසරික විද්‍යා ක්ෂේත්‍රයේ සදාචාරාත්මක සලකා බැලීම් පිළිබඳ ගැඹුරු අවබෝධයකින් සහභාගිවන්නන් තුළ ඇති කළේය.

### 1.2.6 දුරස්ථ අධ්‍යාපනය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අධ්‍යාපන මධ්‍යස්ථානය 2022 දී අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවේශ විය හැකි ප්‍රමුඛ ස්ථානයක් බවට පත්වෙමින් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. වර්ෂය පුරාවටම මෙම මධ්‍යස්ථානය දුරස්ථ අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් සැලසීමට, අති නවීන තාක්‍ෂණය සහ අධ්‍යාපනික ක්‍රම යෙදවීමට නව්‍ය ක්‍රමවේදවලට නායකත්වය දුන්නේය. මාර්ගගත පාඨමාලා, වැඩමුළු සහ පාඨමාලා බාධාවකින් තොරව සංවිධානය කරන ලද අතර ආකර්ශනීය සහ ක්‍රියාශීලී අතථ්‍ය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරන ලදී. එය උසස් ප්‍රමිතියේ අධ්‍යාපනයක් සහතික කරමින් ඩිජිටල් සම්පත් සහ පුළුල් උපකාරක සේවාවන් ඒකාබද්ධ කිරීම තුළින් මධ්‍යස්ථානය විශිෂ්ටත්වය කරා ළගාවීමට දක්වන කැපවීම සඳහා මනා නිදසුන් විය. සිසුන්ගේ භූගෝලීය පිහිටීම නොතකා සියලුම සිසුන් වැඩසටහන් සඳහා ඇතුළත් කර ගැනීම සහතික කරමින් වෙනස්වන තත්වයන්ට මධ්‍යස්ථානයේ අනුවර්තනය වීම සැලකිය යුතු කරුණකි. 2022 දී දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පරිවර්තනීය සහ ප්‍රවේශ විය හැකි අධ්‍යාපනය ලබා දීමේ මෙහෙවරේ ප්‍රධාන ගාමක බලවේගයක් ලෙස ඉස්මතු විය.

### 1.2.7 බාහිර උපාධි වැඩසටහන්

මෙම මධ්‍යස්ථානය විසින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සෙවන යටතේ ක්‍රියාත්මක වෙමින් අධ්‍යාපන විෂය පථය පුළුල් කරමින් පහත සඳහන් බාහිර උපාධි වැඩසටහන් පවත්වනු ලබයි.

### 1.2.8 ව්‍යාපාර කළමනාකරණ උපාධිය (BBM) සාමාන්‍ය (බාහිර) - 1 වන බඳවා ගැනීම

ව්‍යාපාර කළමනාකරණ උපාධිය (BBM) සාමාන්‍ය (බාහිර) වැඩසටහන එහි ආරම්භක පළමු ශිෂ්‍ය බඳවා ගැනීම සඳහා වසර මැද විභාග සාර්ථකව පවත්වන ලදී. 2022 නොවැම්බර් 06 සිට නොවැම්බර් 27 දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී භෞතිකව පැවති පරීක්ෂණ සඳහා සුදුසුකම් ලත් සිසුන් 62 දෙනෙකු සහභාගී විය. මෙම සන්ධිස්ථානය සිසුන්ගේ අධ්‍යයන ගමනට ඔවුන් දක්වන කැපවීම පෙන්නුම් කරනවා පමණක් නොව බාහිර සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා විශ්වවිද්‍යාලයේ ඵලදායී පරිපාලන දායකත්වය සහ කැපවීමද පිළිබිඹු කරයි.

### 1.2.9 ව්‍යාපාර කළමනාකරණ උපාධිය (BBM) සාමාන්‍ය (බාහිර) - 2 වන බඳවා ගැනීම

ව්‍යාපාර කළමනාකරණ උපාධිය (BBM) සාමාන්‍ය (බාහිර) වැඩසටහනේ දෙවන බඳවා ගැනීම 2022 ඔක්තෝම්බර් 16 වන දින වූ පළමු වසරේ දෙවන භාගය සඳහා භෞතික සහ මාර්ගගත පන්ති වශයෙන් දෙමුහුන් ඉගෙනුම්

ආකෘතියක් අනුව සිදුකෙරුණි. විවිධ අවස්ථාවනට අනුවර්තනය වීමේ හැකියාව සහ ගුණාත්මක අධ්‍යාපන අත්දැකීමක් සහතික කිරීම සඳහා විශ්ව විද්‍යාලයේ කැපවීම නිදර්ශනය කිරීමින් නියමිත කාලසටහනට අනුකූලව සියළු කටයුතු ඉටුකෙරුණි. මෙම ප්‍රවේශය ගතික අධ්‍යාපනික වැඩසටහන සඳහා වන ප්‍රතිචාර දැක්වීම පිළිබිඹු කරන අතර සිසුන් සඳහා වඩා දියුණු ඉගෙනුම් අවස්ථා ලබා දීමේ දීමේ හැකියාව පෙන්නුම් කරයි.

### 1.2.10 සහතිකපත්‍ර පාඨමාලා සහ ඩිප්ලෝමා

2022 දී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සිය සහතික පත්‍ර පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා විවිධාංගීකරණයට ලක් කරමින් ඉංග්‍රීසි ප්‍රවීණතාවය සහ කළමනාකරණයේ සිට නැනෝ තාක්‍ෂණය සහ රොබෝ තාක්ෂණය වැනි අති නවීන ක්ෂේත්‍ර දක්වා විශේෂිත අධ්‍යාපනයක් පිරිනැමීය. එහි මගපෙන්වීම යටතේ පවත්වනු ලබන පාඨමාලා පහත පරිදි වේ.

- පාසල් හැර ගිය අය සඳහා ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව (වසර 2022 – 9 වන කණ්ඩායම)
- කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- නැනෝ තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- රොබෝ විද්‍යාව සහ ආර්ඩුයිනෝ ක්‍රමලේඛනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- මැණික් සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ශාක පටක රෝපණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
- කෘෂි ආහාර සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- කුඩා හා මධ්‍යම කෘෂිකාර්මික කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව
- තේ සහ රබර් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- තේ සහ රබර් වැවිලි භෝග කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව
- ප්‍රජා නායකත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

### 1.2.11 ඉදිරි බාහිර උපාධි වැඩසටහන්

මීට අමතරව, දුරස්ථ අධ්‍යාපන ඒකකය විසින් නුදුරු අනාගතයේ දී පහත සඳහන් උපාධි වැඩසටහන් ආරම්භ කරනු ඇත.

#### 1.2.11.1 තොරතුරු තාක්ෂණය පිළිබඳ BIT (බාහිර) උපාධිය

2022 දෙසැම්බර් 9 වන දින වි.වි.ප්‍ර.කො. සභාවේ ස්ථාවර කමිටුව වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු තාක්ෂණ උපාධිය (BIT) බාහිර උපාධිය සඳහා වූ යෝජනාව මගින් සැලකිය යුතු ඉදිරි පියවරක් සනිටුහන් කරයි. අනුවර්තනය වීමේ හැකියාව සහ නවෝත්පාදන සඳහා විශ්වවිද්‍යාලයේ ඇති කැපවීම පිළිබිඹු කරමින් මෙහි සම්බන්ධීකාරක විසින් වැඩසටහනේ වැදගත්කම ඵලදායී ලෙස ඒත්තු ගන්වන ලදී. මෙම ප්‍රයත්නය තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් බාහිරව හැදෑරීමට අපේක්ෂිත පුද්ගලයන්ට නම්‍යශීලී මාවතක් විවරකර දෙන අතර එමගින් මෙම විකාශනය වන අධ්‍යාපනික ක්ෂේත්‍රයට පිවිසීමට මග පාදයි. තොරතුරු තාක්ෂණ උපාධිය (බාහිර) උපාධිය වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම මගින් ගුණාත්මක අධ්‍යාපනය සඳහා ප්‍රවේශය තවදුරටත් පුළුල් කරමින් අපේක්ෂා සහගත තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් වන විශ්වවිද්‍යාලයේ කැපවීම ඉස්මතු කරයි

### 1.2.11.2 විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය (බාහිර) උපාධිය

විද්‍යාවේදී සාමාන්‍ය (BSc) බාහිර උපාධිය පිළිබඳ යෝජනාව වි.වි.ප්‍ර.කො.සභාවේ කළමනාකරණ කමිටුව විසින් සුවිශේෂී ලෙස පරීක්ෂාවට ලක් කරන ලද අතර උපාධියේ නම සහ සුදුසුකම් පිළිබඳ ගැටළු කෙරෙහි එහිදී විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඊට ප්‍රතිචාර වශයෙන් ව්‍යවහාරික විද්‍යා පීඨයේ සම්බන්ධීකාරක සහ පීඨාධිපති යන දෙදෙනාම වි.වි.ප්‍ර.කො.සභාව විසින් මතු කරන ලද අදහස් සම්බන්ධයෙන් ක්‍රියාකාරීව කටයුතු කළහ. මෙම ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ ඒවා විසඳීම අරමුණු කරගත් ඔවුන්ගේ සහයෝගී ප්‍රයත්නයන් මගින් ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට සහ නියාමන කාර්යයන්ට ප්‍රතිචාර දැක්වීමට විශ්ව විද්‍යාලයේ ඇති කැපවීම අවධාරනය කරයි. මෙම අන්තර්ක්‍රියා වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම තුළින් විනිවිදභාවය සහ අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා වූ විශ්වවිද්‍යාලයේ කැපවීම පිළිබිඹු වේ.

### 1.2.11.3 නව පශ්චාත් උපාධි MSc වැඩසටහන ආරම්භ කිරීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඒකකය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය අතර පැවැති සාර්ථක සහයෝගීතාවයක් හරහා පාරිසරික තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන 2022 මැයි 7 දින සාර්ථකව ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන මගින් භෞතික සහ මාර්ගගත ඉගෙනුම් අවස්ථා යන ක්‍රමවේද දෙකම ඒකාබද්ධ කරමින් දෙමුහුන් ආකෘතියකින් දේශන ඉදිරිපත් කරයි.

## 1.2.12 වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහන්

### 1.2.12.1 විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් පවත්වනු ලබන වැඩසටහන්

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) අධ්‍යයන කටයුතු සහ වෘත්තීය කටයුතු අතර පවතින ගැටළු විසඳීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යයන ජීවිතයේ සිට වෘත්තිය ක්ෂෙත්‍රයට පිවිසීම සැලකිය යුතු සන්ධිස්ථානයක් බව හඳුනා ගනිමින්, වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය රාජකාරී ජීවිතයේ අභියෝග සහ අවස්ථාවන් සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා අවැසි කටයුතු සලසා දෙයි. වැඩමුළු, පුහුණු වැඩසටහන් සහ එකින් එක පවත්වන උපදේශන සැසි මාලාවක් හරහා තරඟකාරී රැකියා වෙළඳපොලේ හැසිරීමට අවශ්‍ය කුසලතා, දැනුම සහ මානසිකත්වය මෙම ඒකකය විසින් සිසුන්ට ලබා දෙයි. තවද, කර්මාන්ත ක්ෂෙත්‍රයේ ප්‍රමුඛයන්, සංස්ථා සහ ආදි ශිෂ්‍යයන් සමඟ සහයෝගීතාවයන් වර්ධනය කිරීම මගින් වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය විසින් සිසුන්ට නැගී එන කර්මාන්ත ප්‍රවණතා පිළිබඳව මනා දැනුමක් ලබා දීම පමණක් නොව සීමාවාසික පුහුණුව, රැකියා ස්ථානගත කිරීම් සහ සම්බන්ධීකරණය සඳහා ඕනෑ තරම් අවස්ථා ඇති බව සහතික කරයි. සාරාංශයක් ලෙස, වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සිසුන් කර්මාන්ත ක්ෂෙත්‍රයට සූදානම් වෘත්තිකයන් සහ විශ්වාසවන්ත අනාගත නායකයින් බවට පත් කිරීමට කැපවී කටයුතු කරයි. අනාගත පරපුරේ වෘත්තීය මාර්ගෝපදේශන මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා මෙම ඒකකය විසින් සංවිධානය කරනු ලබන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

| දිනය | වැඩමුළුව/වැඩසටහන | ස්ථානය / සංවිධායක |
|---|---|---|
| **2022** මාර්තු | | |
| 2022/03/ 22 | ආතති කළමනාකරණය සහ මතක වර්ධනය | හාලි ඇල මධ්‍ය මහා විද්‍යාලය |
| 2022/03/27 | දහම් පාසල් ගුරුවරුන් සඳහා ඉගැන්වීම පිළිබඳ උපදෙස් | බෙල්ලන්විල රජ මහා විහාරය |

| | | |
|---|---|---|
| **2022 අප්‍රේල්** | | |
| 2022/04/ 01 | නායකත්ව පුහුණු වැඩසටහන | බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය |
| 2022/04/05 | සමාජ ආකර්ශනීය පුද්ගලයෙකු වන්නේ කෙසේද? | ව්‍යවහාරික විද්‍යා පීඨයේ අවසාන වසර සිසුන් |
| 2022/04/ 07 | නායකත්ව පුහුණු වැඩසටහන | උතුරු පළාත් පුහුණු මධ්‍යස්ථානය |
| **2022 මැයි** | | |
| 2022/05/31 | 'මෝටිව්ඩොට්ස්' හෞතික සැසිය 2022 | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය |
| **2022 ජූනි** | | |
| 2022/06/29 | නායකත්වය සහ නිපුණතා සංවර්ධනය හරහා ඵලදායිතා මාර්ගය | නැගෙනහිර පළාතේ MDTU මගින් ත්‍රිකුණාමලයේ සේවය කරන රජයේ සංවර්ධන නිලධාරීන් |
| 2022/06/29 | ආර්ථික අර්බුදයකදී ආතතිය කළමනාකරණය කිරීම | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තීරණ විද්‍යා අධ්‍යයනාංශය |
| **2022 ජූලි** | | |
| 2022/07/ 01 | වෘත්තීය මාර්ගෝපදේශනය සහ නිපුණතා සංවර්ධනය | අපනයන කෘෂිකර්ම සහ සත්ව විද්‍යා පීඨයේ අවසාන වසර සිසුන් සඳහා |
| | 'Vitaclicks' 2022 ඡායාරූප තරඟය | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ශිෂ්‍ය උපකාරක මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදී |
| 2022/07/ 15 | ආත්ම අභිමානය වර්ධනය කිරීම සහ සමාජ ආකර්ශනීය පුද්ගලයෙකු වන්නේ කෙසේද | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨය විසින් සංවිධානය කරන ලදී |
| **2022 අගෝස්තු** | | |
| 2022/08/09 | වෘත්තීය කළමනාකරණය සහ සංවර්ධනය | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලාවේ 3 වසර උපාධි අපේක්ෂකයින් |
| 2022/08/30 | 'උපදේශන මනෝවිද්‍යාව' පිළිබඳ සැසිය | බොරලන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණු නිලධාරීන් වෙත |
| **2022 සැප්තැම්බර්** | | |
| 2022/09/12 | ඵලදායී සන්නිවේදන කුසලතා | නැගෙනහිර පළාතේ MDTU මගින් ත්‍රිකුණාමලයේ සේවය කරන |

| | | |
|---|---|---|
| | | රජයේ සංවර්ධන නිලධාරීන් වෙත |
| 2022/08/5 සහ06 | උපාධිධාරී ව්‍යවසායකත්ව උදානය 2022 | සම්පත් දායක: ඩී.බී. ජයතිලක මහතා (ප්‍රධාන පුහුණුකරු) සහ පී.කේ. සුරේන් මහතා (සහාය පුහුණුකරු). සම්පත් දායකත්වය - ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් |
| **ඔක්/නොවැ 2022** | | |
| 2022/11/11 | ළමා අපයෝජනය වැලැක්වීම | රතු කුරුස වැඩසටහන |
| 2022/11/11 | ආතති කළමනාකරණ වැඩසටහන | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දෙවන වසරේ සිසුන් සඳහා |
| 2022/11/10,11සහ14 | විශ්වවිද්‍යාල නවක වදයේ මනෝවිද්‍යාත්මක යාන්ත්‍රණය | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර සිසුන් සඳහා |
| 2022/10/04,05 සහ 06 | බොරලන්ද පොලිස් පුහුණු පාසලේ වැඩමුළුව | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අවසන් වසරේ සිසුන් සඳහා |

### 1.2.12.2 පීඨ විසින් සංවිධානය කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහන්

#### 1.2.12.2.1 වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව - බොරලන්ද

බොරලන්ද වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුවට ආචාර්ය ජී.ඩබ්ලිව්.ආර්.කීර්තිවංශ මහතා දායක වූ අතර එමගින් ඵලදායි වෘත්තීය ක්ෂේත්‍ර වෙත සිසුන් යොමු කිරීම සම්බන්ධයෙන් තාක්ෂණ අධ්‍යයන පීඨයේ කැපවීම පිළිබිඹු විය.

#### 1.2.12.2.2 පීඨ වෘත්තීය මාර්ගෝපදේශ උපදේශක

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අධ්‍යයන පීඨයේ සහාය මහාචාර්ය වයි.එන්.එස්. විජේවර්ධන මහතා 2022 වර්ෂයේ දී පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකවරයා වශයෙන් වැදගත් කාර්ය භාරයක් ඉටුකරමින් සිසුන් ඵලදායී වෘත්තීය මාවතකට යොමු කිරීම සඳහා සිය කැපවීම ප්‍රකට කළේය.

#### 1.2.12.2.3 මනෝවිද්‍යාත්මක උපදේශනය - ශිෂ්‍ය උපදේශක

ඉංජිනේරු පී.ජී.එස්.ආර්. විජේතුංග මහතා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අධ්‍යයන පීඨයේ මනෝවිද්‍යාත්මක උපදේශක වශයේන සිය සේවා ලබා දෙමින් ශිෂ්‍ය උපදේශකවරයාගේ භූමිකාවට සක්‍රීයව දායක වූ අතර එමගින් සිසුන්ගේ මානසික යහපැවැත්මට සහාය වීම සඳහා වන ඔහුගේ කැපවීම මැනවින් අවධාරණය කළේය.

### 1.2.12.2.4 AD වික්ටෝරියා 2022, සාර්ථකත්වයට පියවර

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සංවිධානය කරන ලද "AD Victoria 2022, සාර්ථකත්වයට පියවර" වැඩසටහන 2022 ඔක්තොම්බර් මස 04 වන දින වැලිමඩ බොරලන්ද පොලිස් පුහුණු පාසලේදී පැවැත්විණි. විශ්වවිද්‍යාලයේ තාක්ෂණික අධ්‍යයන පීඨයේ අවසන් වසරේ සිසුන් සඳහාම විශේෂයෙන් සකස් කර ඇති මෙම වැඩසටහන උපාධිය ලැබීමෙන් පසු වෘත්තීය සාර්ථකත්වය කරා යන මාවතකට යොමු කිරීම සඳහා සහභාගිවන්නන්හට ඉතා වැදගත් දැනුමෙන් සහ කුසලතාවලින් සන්නද්ධ කිරීම අරමුණු කර පවත්වා ඇත.

### 1.2.12.2.5 මූලික බාධක අවම කිරීම පිළිබඳ වැඩමුළුව

ආචාර්ය ඒ.ඒ.ජී.ඩී. අමරසූරිය විසින් 2022 ජුනි මස 24 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨ දේශන ශාලාවේදී "මූලික බාධක අවම කිරීම " යන මැයෙන් අත්‍යවශ්‍ය වැඩමුළුවක් "ඔබේම ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ කෙසේද" යන මාතෘකාව කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදී. ව්‍යවහාරික ජෛවී විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ඒ.ඒ.ජී.ඩී. අමරසූරියගේ මූලිකත්වයෙන් පැවැති මෙම සැසියේ අරමුණ වූයේ ව්‍යවසායකත්වයේ මූලික අභියෝගවලට මුහුණදීමට අවශ්‍ය දැනුම සහ මෙවලම්වලින් සිසුන් සන්නද්ධ කිරීමයි. අධ්‍යයන දැනුම ලබා දීමට පමණක් නොව සිසුන්ගේ වෘත්තීය ගමන් මඟ සඳහා ප්‍රායෝගික මගපෙන්වීම් ලබාදීමට ද පීඨයේ කැපවීම මෙවැනි ප්‍රයත්නයන් තුළින් යළි යළිත් අවධාරණය කරයි.

## 1.2.13 කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

### 1.2.13.1 විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු සහ විනය පටිපාටි පිළිබඳ වැඩමුළු

කාර්ය මණ්ඩල සංවර්ධනය වැඩි දියුණු කිරීම සහ විශ්වවිද්‍යාල ක්‍රියා පටිපාටිවල පැහැදිලිතාවයක් ඇතිකිරීම සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා "විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු සහ විනය පටිපාටි" පිළිබඳ වැඩමුළු දෙකක් ලේඛකාධිකාරී එම්.එෆ්.හිබතුල් කරීම් මහතා විසින් පවත්වන ලදී. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අනුග්‍රහය යටතේ 2022 ජූනි 08 සහ ජූනි 22 යන දිනවල පැවැති මෙම වැඩමුළු මගින් වඩාත් දැනුවත් සහ කාර්යක්ෂම විශ්වවිද්‍යාල ශ්‍රම බලකායක් ඇති කරමින් නිවාඩු ප්‍රතිපත්ති සහ විනය පටිපාටි පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙන ලදී.

## 1.2.14 පුස්තකාලය

### 1.2.14.1 පුස්තකාල එකතුව

වර්තමානයේ සිසුන් සහ කාර්ය මණ්ඩලය ඇතුළු 4600 කට අධික පරිශීලකයින් සඳහා පුස්තකාලය පහසුකම් සපයයි. පුස්තකාල පරිශීලක ප්‍රජාවට ගුණාත්මක සේවාවන් සපයන අතරම ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරය සඳහා කාර්යක්ෂම ආකාරයෙන් නිවැරදි තොරතුරු වෙත ප්‍රවේශය සපයයි.

වර්තමාන පුස්තකාල එකතුව මුද්‍රිත සහ මුද්‍රණය නොකළ අයිතම 25,000කට අධික ප්‍රමාණකින් සමන්විත වේ. පරිගණක විද්‍යාව, දර්ශනය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය, සංචාරක, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිත විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තාක්‍ෂණය, කෘෂිකර්මය, සත්ව විද්‍යාව, ජලජීවී වගාව, ධීවර කර්මාන්තය වැනි විෂය ක්ෂේත්‍ර විශාල ප්‍රමාණයක් ආවරණය වන පරිදි එම එකතුව සැකසී ඇත.

පොත් වර්ගීකරණය කිරීම සඳහා Dewey Decimal Classification (DDC) 23 වැනි සංස්කරණය පුස්තකාලය භාවිතා කරයි. පුස්තකාලය ස්ථිර විමර්ශන අංශය, බැහැර දීමේ අංශය, සගරා අංශය සහ විද්‍යුත් සම්පත් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය, විශේෂ එකතු අංශය, කියවීම් ශාලාව සහ පොදු තොරතුරු සහ ඉගෙනුම් යනාදි

අංශ හරහා සේවා සපයයි. පරිශීලකයින්ගේ කාලය ඉතිරි කිරීම සහ වඩා හොඳ පුස්තකාල සේවා සැපයුමක් සහතික කිරීම අරමුණු කොටගෙන පුස්තකාල දත්ත සමුදා කළමනාකරණ පද්ධතිය (KOHA විවෘත මූලාශ්‍ර පද්ධතිය) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරන ලදී.

### 1.2.14.2 පුස්තකාල භාවිතය

| මාසය | සිසුන් විසින් බැහැර දීමේ අංශය භාවිතය | කාර්ය මණ්ඩලය විසින් බැහැර දීමේ අංශය භාවිතය | ස්ථිර පරිශීලන අංශය | විද්‍යුත්-සම්පත් සහ තො.සං.තා. අංශය භාවිතය | පුස්තකාල චාරිකා | තොරතුරු සහ ඉගෙනුම් පොදු අංශය සම්පූර්ණ භාවිතය |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 24 | 63 | 47 | 12 | 157 | **497** |
| පෙබරවාරි | 48 | 61 | 141 | 6 | 164 | **302** |
| මාර්තු | 39 | 95 | 152 | 8 | 389 | **355** |
| අප්‍රේල් | 75 | 51 | 172 | 8 | 215 | **173** |
| මැයි | 220 | 51 | 207 | 19 | 285 | **656** |
| ජූනි | 417 | 71 | 297 | 37 | 585 | **1250** |
| ජූලි | 14 | 52 | 30 | 11 | 165 | **270** |
| අගෝස්තු | 32 | 111 | 85 | 16 | 145 | **320** |
| සැප්තැම්බර් | 461 | 92 | 159 | 18 | 290 | **402** |
| ඔක්තෝම්බර් | 902 | 71 | 82 | 27 | 160 | **395** |
| නොවැම්බර් | 0 | 0 | 0 | 0 | 305 | **301** |
| දෙසැම්බර් | 889 | 70 | 204 | 20 | 1800 | **280** |
| උප එකතුව | **3121** | **788** | **1571** | **182** | **4660** | **5201** |

### 1.2.14.3 විශ්වවිද්‍යාල පුස්තකාලයේ දී පවත්වන ලද තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ වැඩමුළුව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර මහතා විසින් 2022.05.23 දින "කාර්යාල ආචාර විධි" පිළිබඳ වැඩමුළුවක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ විශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පවත්වන ලදී.

මෙම වැඩමුළුව පුස්තකාල තත්ත්ව සහතික ඒකකයේ සම්බන්ධීකාරක ආචාර්ය කේ.එම්.ආර්.කේ.කුලතුංග විසින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගීතාවයෙන් යුතුව සංවිධානය කරන ලදී.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී එම්.එෆ්. හිබතුල් කරීම් මහතා විසින් 2022.05.24 දින "විශ්වවිද්‍යාල පරිපාලන ක්‍රියාපටිපාටි" පිළිබඳ වැඩමුළුවක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ විශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගීතාවයෙන් යුතුව මෙම වැඩමුළුව පුස්තකාල තත්ත්ව සහතික ඒකකයේ සම්බන්ධීකාරක ආචාර්ය කේ.එම්.ආර්.කේ.කුලතුංග විසින් සංවිධානය කරන ලදී.

### 1.2.14.4 ශිෂ්‍ය සහාය සේවා

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් පාසල් සිසුන් සඳහා පුස්තකාලය පිළිබඳ මූලික හඳුන්වාදීමේ වැඩසටහන පහත සඳහන් පාසල් සඳහා පවත්වන ලදී

- බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය, බදුල්ල
- සුජාතා බාලිකා ජාතික පාසල, ගලගෙදර, මහනුවර
- කතළුව මධ්‍ය මහා විද්‍යාලය, ගාල්ල

### 1.2.14.5 පුස්තකාලය පිළිබඳ විශේෂ වැඩමුළු සහ පුහුණු වැඩසටහන්

"පුස්තකාල ගෘහ භාණ්ඩ සඳහා තීරු කේත අංකය උත්පාදනය කරන්නේ කෙසේද" යන්න පිළිබඳ පුහුණු වැඩසටහනක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 1 වන වසරේ පරිගණක විද්‍යා ශිෂ්‍යාවක වන එච්.ඒ.අයි කෞශල්‍යා විසින් 2022 ජූනි 27 වන දින පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

## 1.2.15 ක්‍රීඩා කටයුතු

### 1.2.15.1 ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපකුලපති අභියෝග කුසලාන බැඩ්මින්ටන් තරඟාවලිය - 2022

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් සංවිධානය කරන ලද උපකුලපති අභියෝග කුසලාන බැඩ්මින්ටන් තරඟාවලිය 2022 මාර්තු 15 දින පවත්වන ලදී. එය අඛණ්ඩව දෙවන වසරටත් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ගෘහස්ථ බැඩ්මින්ටන් පිටියේදී පැවැත්විණි. මෙම අභියෝගතා කුසලානය සබරගමුව විශ්වවිද්‍යාලයට එරෙහිව පැවැති අතර එහිදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය තරග 15 න් එකොළහක් ජය ගෙන විශිෂ්ට ජයක් හිමිකර ගත්තේය.

### 1.2.15.2 වෙල්ලස්ස එල්ලේ සටන - 2022

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් 2022 ජූනි 26 වැනි දින වෙල්ලස්ස එල්ලේ සටන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ක්‍රීඩා පිටියේදී සංවිධානය කරන ලදී. පිරිමි කණ්ඩායම් හතක් සහ කාන්තා කණ්ඩායම් හතරක් මෙයට සහභාගී වූහ.

| ශූරතාව | ජයග්‍රාහකයන් |
|---|---|
| පිරිමි - ශූරතාව | කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය සහ සංචාරක අධ්‍යයනාංශයේ දෙපාර්තමේන්තුවේ සිසුන් |
| පිරිමි - අනුශූරතාව | ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශයේ සිසුන් |
| ගැහැණු - ශූරතාව | තාක්ෂණ අධ්‍යයන පීඨ සිසුන් |
| ගැහැණු - අනුශූරතාව | ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් |

### 1.2.15.3 රන් කුසලාන සහ රිදී කුසලාන පාපන්දු ශූරතාව - 2022

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පාපන්දු ලීගය විසින් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සහයෝගීතාවයෙන් යුතුව 2022 රන් කුසලාන සහ රිදී කුසලාන පාපන්දු ශූරතාවලිය සංවිධානය කරන ලදී. මෙහිදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පාපන්දු කණ්ඩායමට 2022 රන් කුසලාන ශූරතාවලියේ සිව්වන ස්ථානය හිමි විය.



### 1.2.15.4 23න් පහළ කනිෂ්ඨ ජාතික පැසිපන්දු ශූරතාවලිය 2022

ඉහත කී ශූරතාවලිය සඳහා ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල පැසිපන්දු කණ්ඩායම තෝරා ගැනීම පිණිස ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයෙහි පැසිපන්දු අනුකමිටුව විසින් පැසිපන්දු තේරීම් පරීක්ෂණය සංවිධානය කරන ලදී. මෙම තේරීම් පරීක්ෂණය 2022 ඔක්තෝම්බර් 14 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි. මෙහිදී කළමනාකරණ පීඨයේ එම්.ඕ.ආර්. මාකවිට, (UWU/THE/21/067) ඒකාබද්ධ විශ්වවිද්‍යාල පැසිපන්දු කණ්ඩායම සඳහා තෝරාගෙන ඇත.

### 1.2.15.5 සුබ්රා සුපර් සෙවන්

සුබ්රා සුපර් සෙවන් ආරාධිත රගර් තරඟාවලිය 2022 ඔක්තෝබර් 15 වන දින සබරගමුව විශ්ව විද්‍යාලයේ දී පැවැත්විණි. මෙම තරඟාවලිය සඳහා විශ්ව විද්‍යාල 11 ක් සහභාගී විය. ඌව වෙල්ලස්ස රගර් කණ්ඩායම විසින් මෙම තරඟාවලියේ අනුශූරතාවය දිනා ගන්නා ලදී.

### 1.2.15.6 කැරම් තරඟාවලිය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් GRAND SLAM කැරම් තරඟාවලිය 2022 ඔක්තෝබර් 15 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කායවර්ධන මධ්‍යස්ථාන ශාලාවේදී සංවිධානය කර තිබුණි. මෙම තරඟාවලිය සඳහා සියලුම අධ්‍යයනාංශවල සිසුන් සහභාගී විය. ග්‍රෑන්ඩ් ස්ලෑම් තරගාවලිය සඳහා පිරිමි කණ්ඩායම් හතරක් සහ කාන්තා කණ්ඩායම් හතරක් සහභාගි වූහ.

### 1.2.15.7 අන්තර් විශ්වවිද්‍යාල ටයිකොන්ඩෝ ශූරතාවලිය - 2022

අන්තර් විශ්වවිද්‍යාල ටයිකොන්ඩෝ -2022 ශූරතාවලිය 2022 දෙසැම්බර් 10 සහ 11 යන දිනවල මොරටුව විශ්වවිද්‍යාලයේ නව ව්‍යායාම ශාලාවේදී පැවැත්විණි. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ටයිකොන්ඩෝ පිරිමි සහ කාන්තා කණ්ඩායම් ඊට සහභාගී වූ අතර කි.ග්‍රෑ. 57 - 62 බර කාණ්ඩයේ කාන්තා තෙවන ස්ථානය එල්.එන්. එදිරිසිංහ (UWU/PLT/18/064) සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය) විසින් දිනා ගන්නා ලදී.

### 1.2.15.8 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය උපකුලපති අභියෝග කුසලාන බැඩ්මින්ටන් තරගාවලිය - 2022

අග්නිදිග විශ්වවිද්‍යාලයීය ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් 2022 ඔක්තෝබර් 18 වන දින උපකුලපති අභියෝග කුසලාන බැඩ්මින්ටන් තරගාවලිය සංවිධානය කරන ලදී. මෙම තරගාවලිය අග්නිදිග විශ්ව විද්‍යාලයේ ගෘහස්ථ බැඩ්මින්ටන් පිටියේදී පැවැත්විණි. මෙම අභියෝගතා කුසලාන තරගය අග්නිදිග විශ්වවිද්‍යාලයට එරෙහිව පැවැති අතර මෙහිදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට විශිෂ්ට ජයක් හිමිවිය.

### 1.2.15.9 ජාතික කාන්තා පාපන්දු කණ්ඩායම් මාධ්‍ය කළමනාකරු විසින් රට නියෝජනය කිරීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් ශාරීරික අධ්‍යාපන උපදේශක එම්.සී.එම්.රිස්වි මහතා 2022 සාෆ් ශූරතාවලිය සඳහා වන ශ්‍රී ලංකා ජොෂ්ය ජාතික කාන්තා පාපන්දු කණ්ඩායමේ මාධ්‍ය කළමනාකරු ලෙස පත් කර ඇත. එම තරගාවලිය 2022 සැප්තැම්බර් 6 සිට 19 දක්වා නේපාල කත්මණ්ඩු හිදී පැවැත්විණි.

### 1.2.15.10 මාධ්‍ය නිලධාරීන්ගේ සම්මන්ත්‍රණය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් ශාරීරික අධ්‍යාපන උපදේශක එම්.සී.එම්.රිස්වි මහතා දකුණු ආසියානු පාපන්දු සම්මේලනය විසින් සංවිධානය කරන ලද ප්‍රථම කළාපීය මාධ්‍ය නිලධාරි සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගීවී ඇත. එම සම්මන්ත්‍රණය 2022 සැප්තැම්බර් 4 වන දින නේපාලයේ කත්මණ්ඩු නුවරදී පැවැත්විණි.



### 1.2.16 සමබර ජීවිතයක් සඳහා විනෝදාස්වාදය









## 1.2.17 බාහිර ප්‍රජා සත්කාර වැඩසටහන්

### 1.2.17.1 යෞවන ප්‍රජාව කෘෂි ව්‍යවසායකයින් ලෙස සවිබල ගැන්වීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2022 ඔක්තෝම්බර් 27 වන දින කුඹල්වෙල ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී "යෞවනයින් කෘෂි ව්‍යවසායකයින් ලෙස සවිබල ගැන්වීම" යන වැඩසටහනට මූලිකත්වය දෙමින් ප්‍රජා සත්කාරක ක්‍රියාකාරකම්හි ප්‍රශංසනීය පියවරක් තැබුවේය. කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP) සමඟ සහයෝගයෙන් යුතුව සංවිධානය කරන ලද මෙම අවස්ථාව සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ-ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියේ (UWU-ICDP) සියලුම පාර්ශවකරුවන්ගේ සක්‍රිය සහභාගීත්වය දක්නට ලැබිණි. මෙම වැඩසටහන තුළින් කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායක කුසලතා වර්ධනය කිරීම සහ තිරසාර ප්‍රජා සංවර්ධනය අරබයා කටයුතු කිරීම සඳහා විශ්ව විද්‍යාලයේ ඇති කැපවීම පිළිබඳ විධ්‍යාමාන වේ.

### 1.2.17.2 සංයුක්ත ගණිතය විෂය කෙරෙහි අවධානය යොමු කර 2022 අ.පො.ස උසස් පෙළ කණ්ඩායම සඳහා පැවැති සම්මන්ත්‍රණ

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශයේ සිසුන් ප්‍රජා සත්කාර සහ අධ්‍යාපනය සවිබල ගැන්වීම අරබයා සිය කැපවීම පසක් කරමින් වැඩසටහන් සිදුකළ අතර ඒ අනුව සැම්බර් 7 වැනිදා බදුල්ල විශාකා ම.වි.හිදීද, පසුව දෙසැම්බර් 19 වැනි දින වැල්ලවාය මල්වත්තවල ම.ම.වි.හිදීද 2022 අ.පො.ස උ/පෙළ කණ්ඩායම සඳහා සංයුක්ත ගණිතය කෙරෙහි අවධානය යොමු කරමින් සම්මන්ත්‍රණ පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණ පැවැත්වීම විශ්වවිද්‍යාලය තුළ පවතින ශාස්ත්‍රීය විශේෂඥතාව පිළිබඳව සාක්ෂියක් වූවා පමණක් නොව එමගින් පුළුල් ප්‍රජාව තුළ අධ්‍යාපනික වර්ධනයක් ඇති කිරීම සඳහා ආයතනයේ කැපවීම ඉස්මතු කළේය. ආයතනික දැනුම සහ ප්‍රජාවගේ අධ්‍යාපන අභිලාෂයන් අතර පරතරය සමනය කරමින් සිසුහු සමාජ තලය නගා සිටුවීම සඳහා වන ඔවුන්ගේ අව්‍යාජ කැපවීම ප්‍රදර්ශනය කළහ.

### 1.2.17.3 අධ්‍යාපනික හා තාක්ෂණික එකතුව: තේ වැවිලිකරුවන් සවිබල ගැන්වීම

2022 නොවැම්බර් 14 වන දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පහතරට තේ වැවිලිකරුවන්ගේ සංගමයේ සාමාජිකයින් සඳහා ඉතා හරවත් "අධ්‍යාපනික හා තාක්ෂණික හමුවක්" පවත්වන ලදී. තේ වගා කළමණාකරණය සහ නිෂ්පාදන අගය එකතු කිරීම සම්බන්ධයෙන් වැවිලිකරුවන්ගේ නිපුණතා ඉහළ නැංවීමේ අරමුණින් තේ වතු හිමියන් සහ ඌව වෙල්ලස්ස විද්‍යායතනය අතර ගතික සංවාද මෙම හමුව තුළ ඉස්මතු විය. එපමනක් නොව මෙමගින් මෙම කර්මාන්තයේ වෘත්තිකයින්ට තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය හදාරන තෙවන වසරේ උපාධි අපේක්ෂකයින් සමඟ තම වටිනා අත්දැකීම් බෙදාහදා ගැනීමට සුවිශේෂී වේදිකාවක් නිර්මාණය විය. මෙම සහයෝගී ප්‍රයත්නය මගින් අධ්‍යයන ක්‍රමවේද සහ කර්මාන්තයේ භාවිතයන් අතර පරතරය පියවා ගත්තා පමණක් නොව පරිපූර්ණ ඉගෙනුම් අත්දැකීමක් සඳහා විවිධ ප්‍රවීණයන් ද එක් කළේය.

### 1.2.17.4 පශු සම්පත් ගොවිතැන පිළිබඳ මූලික සමීක්ෂණය: ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියේ (UWU-ICDP) අනුග්‍රහය යටතේ පශු සම්පත් ගොවිතැන පිළිබඳ ඉතා වැදගත් මූලික සමීක්ෂණයක් 2022 නොවැම්බර් 22 වැනි දින ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී. මෙම සමීක්ෂණය, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සහ ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) අතර සහයෝගී ප්‍රයත්නයකින් ක්‍රියාත්මක කළ අතර ව්‍යාපෘතියේ අරමුණු

සහ ප්‍රජාව තුළ පශු සම්පත් ගොවිතැනෙහි අනාගත මැදිහත්වීම් සඳහා අත්‍යවශ්‍ය මඟ පෙන්වීම සඳහා වන දත්ත සහ ඥාණය එක්රැස් කිරීම අරමුණු කර ගෙන ඇත.

### 1.2.17.5 කෘෂි ගොවිපල සායනය සහ මූලික සමීක්ෂණය

ප්‍රජා කේන්ද්‍රීය "කෘෂි ගොවිපල සායනය සහ මූලික සමීක්ෂණය" වැඩසටහන 2022 අගෝස්තු 17 වන දින කුඹල්වෙල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියේ (UWU-ICDP) මගපෙන්වීම යටතේ සංවිධානය කරන ලද මෙම වැඩසටහන, ප්‍රජාව ක්‍රියාශීලීව සම්බන්ධ කර ගැනීම, තීරණාත්මක දැණුම එක්රැස් කිරීම සහ ව්‍යාපෘතියේ අරමුණු දේශීය ගොවි ජනයාගේ මූලික අවශ්‍යතා සහ අභිලාෂයන් සමඟ සමපාත වන බව සහතික කිරීම අරමුණු කර ගෙන ක්‍රියාත්මක කර ඇත.

## 1.3 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂය සඳහා අනාගත සැලැස්ම:

1. <u>ප්‍රාදේශීය සංවර්ධනය</u>:

- ප්‍රාදේශීය ආර්ථික වර්ධනය, සමාජ සංවර්ධනය සහ පාරිසරික තිරසාරත්වය අරබයා වැඩසටහන් දියත් කරමින් ඌව පළාතේ උපාය මාර්ගික හවුල්කරුවෙකු ලෙස ක්‍රියාකාරීව කටයුතු කිරීම.

2. <u>ශාස්ත්‍රීය විශිෂ්ටත්වය</u>:

- පිළිගත් ජාතික සහ ජාත්‍යන්තර වෘත්තීය ආයතනවලින් ප්‍රතීතන ලබාගැනීම හරහා දැනට පවතින උපාධි වැඩසටහන්වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම.
- වෙළඳපල ඉල්ලුමට සහ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව අවම වශයෙන් නව බහු-විෂයීක පාඨමාලා දෙකක් සහ/හෝ උපාධි වැඩසටහන් ආරම්භ කිරීම.

3. <u>පීඨ සහ කාර්ය මණ්ඩල සංවර්ධනය</u>:

- වර්ධනය වන අධ්‍යයන ඉල්ලීම් සපුරාලීම සඳහා මූලික විෂයයන් සඳහා අවම වශයෙන් 10% අතිරේක සුදුසුකම් ලත් පීඨ සාමාජිකයින් බඳවා ගන්න.
- පවතින ශ්‍රම බලකාය රඳවා තබා ගැනීමට සහ ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

4. <u>ජාත්‍යන්තර සහයෝගිතා</u>:

- ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ ඒකාබද්ධ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම පිණිස අවම වශයෙන් ජාත්‍යන්තර විශ්ව විද්‍යාල තුනක් සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම.
- සහයෝගීතා පර්යේෂණ සහ දැනුම හුවමාරුවට ප්‍රමුඛත්වය දෙමින් විදේශ පර්යේෂණ ආයතන සමඟ අවම වශයෙන් අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් කිරීම.

5. <u>යටිතල පහසුකම් සහ පහසුකම් සංවර්ධනය</u>:

- කෘෂිකාර්මික සහ සත්ව පාලන ගොවිපළ ඉදිකිරීම ආරම්භ කිරීම සහ ක්‍රීඩා සංකීර්ණය සඳහා අඩිතාලම දැමීම.
- අංග සම්පූර්ණ උපදේශන ඒකකයක් පිහිටුවීමට ප්‍රමුඛත්වය දීම.
- පරිසර හිතකාමී සැලසුම් සහ නවීන පහසුකම් කෙරෙහි අවධානය යොමු කරමින් නව නේවාසිකාගාර

සංකීර්ණ සංවර්ධනය කිරීම ආරම්භ කිරීම.

6. <u>තාක්ෂණය සහ පද්ධති ඒකාබද්ධ කිරීම</u>:

- විශ්වවිද්‍යාල සම්පත් සැලසුම් (URP) පහසුකම සහිත වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හඳුන්වා දීම.
- කළමනාකරණ තොරතුරු පද්ධතිය(MIS) සහ විශ්වවිද්‍යාල සම්පත් සැලසුම් (URP) පද්ධති කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා කාර්ය මණ්ඩලය සහ පීඨ පුහුණුව සඳහා ප්‍රමුඛත්වය දීම.

7. <u>ඉඩම් අත්පත් කර ගැනීම සහ පුළුල් කිරීම</u>:

- කාර්ය මණ්ඩල නවාතැන් පහසුකම් සඳහා සැළසුම් කර ඇති අක්කර 2ක ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම.
- අත්පත් කර ගත් අක්කර 5ක භූමි ප්‍රමාණයේ යෝජිත වෛද්‍ය පීඨය සඳහා මූලික යටිතල පහසුකම් කටයුතු ආරම්භ කිරීම.

8. <u>වෛද්‍ය පීඨයේ ප්‍රගතිය</u>:

- වෛද්‍ය විද්‍යාවේදී වැඩසටහනේ විෂය මාලාව අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම.
- විෂය මාලාව අනුමත වූ පසු වෛද්‍ය පීඨය පිහිටුවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ සම්පත් වෙන් කිරීම ආරම්භ කිරීම.

9. <u>සිසු ජීවිතය සහ සුබසාධනය</u>:

- මානසික සෞඛ්‍යය, වෘත්තීය මාර්ගෝපදේශනය සහ විෂය බාහිර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් පුළුල් ශිෂ්‍ය සුබසාධන වැඩසටහනක් දියත් කිරීම.
- විද්‍යා, තාක්ෂණ, කෘෂිකර්ම සහ කළමනාකරණ පීඨ කෙරෙහි අවධානය යොමු කරමින් විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමේ උපාය මාර්ග මත ක්‍රියාකාරීව කටයුතු කිරීම.

# 2 ශිෂ්‍යයින් සහ සම්පත්

## 2.1 සිසුන් සහ මානව සම්පත් පිළිබඳ සාරාංශය

| පීඨය | උපාධි වැඩසටහන | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| සත්ව විද්‍යාව සහ අපනයන කෘෂිකර්ම | සත්ව විද්‍යාව | 265 | 72 | 31 |
| | අපනයන කෘෂිකර්මය | 250 | | |
| | තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම | 288 | | |
| | ජලජ සම්පත් තාක්ෂණය | 175 | | |
| | පාම් සහ රබර් කිරි තාක්ෂණය සහ අගය එකතු කිරීම | 211 | | |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාව සහ තාක්ෂණය | 226 | 64 | 23 |
| | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | 332 | | |
| | කාර්මික තොරතුරු තාක්ෂණය | 316 | | |
| | ඛනිජ සම්පත් සහ තාක්ෂණය | 260 | | |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | 325 | 32 | 04 |
| | ආගන්තුක සත්කාරය, සංචාරක ව්‍යාපාරය සහ වැඩසටහන් කළමනාකරණය | 187 | | |
| | මානව සම්පත් සංවර්ධනය | 347 | | |
| තාක්ෂණික අධ්‍යයන | ඉංජිනේරු තාක්ෂණය | 414 | 23 | 14 |
| | ජෛව පද්ධති තාක්ෂණය | 416 | | |
| | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | 186 | | |
| **එකතුව** | | **4198** | **191** | **72** |

## 2.2 සිසුන් බඳවා ගැනීම

2022 වර්ෂයේ දී උපාධි වැඩසටහන් මාලාව හරහා සිසුන් බඳවා ගැනීමේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ (UWU) ප්‍රගමනය තවදුරටත් අවධාරනය කරන ලදී. සෑම වැඩසටහනක්ම සඳහාම සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් ආකර්ශනය කර ගැනීමේ ප්‍රවණතාව පවත්වාගෙන ගිය අතර, බොහෝ බඳවා ගැනීම් සිසුන් 100 ඉක්මවා තිබේ. මෙම ප්‍රගතිය හරහා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය 2022 වර්ෂයේ දී උසස් ප්‍රමිතියේ අධ්‍යාපනයක් ලබා දීමට සහ එහි වර්ධනය වන ශිෂ්‍ය ප්‍රජාවගේ අධ්‍යයන අභිලාෂයන් ඉටු කිරීමට දක්වන ලද කැපවීම පිළිබිඹු කළේය.

### 2.2.1 අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා සමස්ථ දේශීය සිසුන් බඳවා ගැනීම (2022.12.31 දිනට)

| පීඨය | උපාධි වැඩසටහන | මාධ්‍යය | 1 වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **සත්ව විද්‍යාව සහ අපනයන කෘෂිකර්ම** | සත්ව විද්‍යාව | ඉංග්‍රීසි | 83 | 82 | 54 | 46 | **265** |
| | අපනයන කෘෂිකර්මය | | 80 | 75 | 49 | 46 | **250** |
| | තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම | | 92 | 80 | 59 | 57 | **288** |
| | ජලජ සම්පත් තාක්ෂණය | | 40 | 57 | 43 | 35 | **175** |
| | පාම් සහ රබර් කිරි තාක්ෂණය සහ අගය එකතු කිරීම | | 59 | 62 | 50 | 40 | **211** |
| **ව්‍යවහාරික විද්‍යා** | විද්‍යාව සහ තාක්ෂණය | | 76 | 67 | 41 | 42 | **226** |
| | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | | 100 | 109 | 59 | 64 | **332** |
| | කාර්මික තොරතුරු තාක්ෂණය | | 103 | 94 | 64 | 55 | **316** |
| | ඛනිජ සම්පත් සහ තාක්ෂණය | | 81 | 83 | 51 | 45 | **260** |
| **කළමනාකරණ** | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | | 103 | 99 | 60 | 63 | **325** |
| | ආගන්තුක සත්කාරය, සංචාරක ව්‍යාපාරය සහ වැඩසටහන් කළමනාකරණය | | 103 | 84 | - | - | **187** |
| | මානව සම්පත් සංවර්ධනය | | 122 | 102 | 64 | 59 | **347** |
| **තාක්ෂණික අධ්‍යයන** | ඉංජිනේරු තාක්ෂණය | | 117 | 123 | 87 | 87 | **414** |
| | ජෛව පද්ධති තාක්ෂණය | | 124 | 126 | 82 | 84 | **416** |
| | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | | 94 | 92 | - | - | **186** |
| | එකතුව | | **1,377** | **1,335** | **763** | **723** | **4,198** |

## 2.2.2 2022 අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා නව ඇතුළත්වීම් - දේශීය සිසුන්

| පීඨය | උපාධි වැඩසටහන | බඳවා ගත් වර්ෂය | යෝජිත බඳවා ගැනීම | සත්‍ය බඳවා ගැනීම |
|---|---|---|---|---|
| සත්ව විද්‍යාව සහ අපනයන කෘෂිකර්ම | සත්ව විද්‍යාව (ANS) | 2019/2020 | 108 | 85 |
| | අපනයන කෘෂිකර්මය (EAG) | | 105 | 93 |
| | තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම (TEA) | | 112 | 59 |
| | ජලජ සම්පත් තාක්ෂණය (AQT) | | 114 | 82 |
| | පාම් සහ රබර් කිරි තාක්ෂණය සහ අගය එකතු කිරීම (PLT) | | 104 | 41 |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාව සහ තාක්ෂණය (SCT) | | 107 | 82 |
| | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය (CST) | | 101 | 100 |
| | කාර්මික තොරතුරු තාක්ෂණය (IIT) | | 100 | 103 |
| | ඛනිජ සම්පත් සහ තාක්ෂණය (MRT) | | 106 | 83 |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය (ENM) | | 101 | 103 |
| | ආගන්තුක සත්කාරය, සංචාරක ව්‍යාපාරය සහ වැඩසටහන් කළමනාකරණය (HTE) | | 107 | 122 |
| | මානව සම්පත් සංවර්ධනය (HRD) | | 85 | 102 |
| තාක්ෂණික අධ්‍යයන | ඉංජිනේරු තාක්ෂණය (BET) | | 121 | 124 |
| | ජෛව පද්ධති තාක්ෂණය (BBST) | | 118 | 117 |
| | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | | 100 | 93 |
| එකතුව | | | 1589 | 1389 |

### 2.2.3 බාහිර උපාධි උපාධි වැඩසටහන් සඳහා සමස්ථ බඳවා ගැනීම් සහ නව ප්‍රවේශයන් (2022.12.31 දිනට)

| අධ්‍යයන වැඩසටහන | අධ්‍යයන වර්ෂය | නව බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2022) | | | සිසුන් බඳවා ගැනීම (සම්පූර්ණ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව) | | |
|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව |
| ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය (BBM) | 2019/2020 | - | - | - | 83 | 88 | 171 |
| ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය (BBM) | 2021/2022 | 87 | 146 | 233 | 170 | 234 | 404 |

## 2.2.4 පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දේශීය සිසුන් ඇතුළත් කර ගැනීම (2022.12.31 දිනට)

| පීඨය | අධ්‍යයන වර්ෂය | නව බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2022) | | | සිසුන් බඳවා ගැනීම (සම්පූර්ණ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව) | | |
|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව |
| සත්ව විද්‍යාව සහ අපනයන කෘෂිකර්ම | කෘෂිකාර්මික නිෂ්පාදන හා සැකසුම් පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | 2 | 8 | 10 |
| | කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව, ව්‍යාප්ති සහ කෘෂිකර්ම කළමනාකරණය පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | 1 | 1 | 2 |
| | ජලජීවී වගාව සහ ධීවර කටයුතු පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | 1 | 1 | 2 |
| | ආහාර විද්‍යාව හා තාක්‍ෂණය පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | - | 4 | 4 |
| ව්‍යවහාරික විද්‍යා | පාරිසරික තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 16 | 7 | 23 | - | - | - |
| | ජීවන විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය | - | 2 | 2 | 2 | 5 | 7 |
| | භෞතික විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | 2 | 4 | 6 |
| | පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය | 2 | 1 | 3 | - | 1 | 1 |
| | පෘථිවි විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | 1 | 1 | 2 |
| | ජීවන විද්‍යාව පිළිබඳ දර්ශණශූරී උපාධිය | - | -- | - | 1 | - | 1 |
| කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 13 | 9 | 22 | 31 | 27 | 58 |
| | ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය | 1 | 1 | 2 | - | - | - |
| | ව්‍යවසායකත්වය පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | - | 1 | 1 |
| තාක්ෂණික අධ්‍යයන | ශාක විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය | - | - | - | - | - | - |
| | උත්ප්‍රේරක නැනෝ ව්‍යුහයේ සංශ්ලේෂණ | - | 4 | 4 | - | 2 | 2 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ද්‍රව්‍ය පිළිබඳ දර්ශනපති උපාධිය | | | | | | |
| | දර්ශනශූරී උපාධිය | 1 | - | 1 | 1 | - | 1 |
| **එකතුව** | | **33** | **24** | **57** | **42** | **55** | **97** |

## 2.3 උපාධි ප්‍රදානය - 2022 (2022.03.25 දින පැවති 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී)

| පීඨය | උපාධි වැඩසටහන | 2021 වර්ෂය | | |
|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව |
| සත්ව විද්‍යාව සහ අපනයන කෘෂිකර්ම | සත්ව විද්‍යාව (ANS) | 14 | 19 | **33** |
| | අපනයන කෘෂිකර්මය (EAG) | 16 | 26 | **42** |
| | තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම (TEA) | 8 | 14 | **22** |
| | ජලජ සම්පත් තාක්ෂණය (AQT) | 7 | 29 | **36** |
| | පාම් සහ රබර් කිරි තාක්ෂණය සහ අගය එකතු කිරීම (PLT) | 2 | 22 | **24** |
| **උප එකතුව** | | **47** | **110** | **157** |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාව සහ තාක්ෂණය (SCT) | 13 | 16 | **29** |
| | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය (CST) | 25 | 30 | **55** |
| | කාර්මික තොරතුරු තාක්ෂණය (IIT) | 17 | 38 | **55** |
| | ඛනිජ සම්පත් සහ තාක්ෂණය (MRT) | 20 | 14 | **34** |
| **උප එකතුව** | | **75** | **98** | **173** |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය (ENM) | 19 | 40 | **59** |
| | ආගන්තුක සත්කාරය, සංචාරක ව්‍යාපාරය සහ වැඩසටහන් කළමනාකරණය (HTE) | 29 | 30 | **59** |
| **උප එකතුව** | | **48** | **70** | **118** |
| තාක්ෂණික අධ්‍යයන | ඉංජිනේරු තාක්ෂණය (BET) | 38 | 18 | **56** |
| | ජෛව පද්ධති තාක්ෂණය (BBST) | 10 | 70 | **80** |
| **උප එකතුව** | | **48** | **88** | **136** |
| **එකතුව** | | **218** | **366** | **584** |

- සමස්තයක් වශයෙන්, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2021 වර්ෂයේ දී උපාධිධාරීන් 584ක් බිහි කළ අතර එහිදී උපාධිධාරීන් 173ක් බිහි කරමින් ව්‍යවහාරික විද්‍යා පීඨය ප්‍රමුඛ ස්ථානයට පත්විය. අනතුරුව සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය උපාධිධාරීන් 157 දෙනෙකු බිහිකිරීමට දායක විය. මේ අතර තාක්ෂණ අධ්‍යයන හා කළමනාකරණ යන පීඨ විසින් පිළිවෙළින් උපාධිධාරීන් 136ක් සහ 118ක් දායාද කරන ලදී. විශ්වවිද්‍යාලයේ ඇතුළත් අධ්‍යාපනික ප්‍රවේශය සහ විවිධ විෂයයන් සඳහා ශිෂ්‍යාවන්ගේ වර්ධනය වන උනන්දුව ඉස්මතු කරමින්, බොහෝ වැඩසටහන් තුළ පිරිමි උපාධිධාරීන් හා සසඳන විට කාන්තා උපාධිධාරීන් වැඩි සංඛ්‍යාවක් දක්නට ලැබීම කැපී පෙනෙන ලක්ෂණයක් විය. උපාධිධාරී සංඛ්‍යාවේ මෙම අඛණ්ඩ වර්ධනය තුළින් ජාතියට ගුණාත්මක උසස් අධ්‍යාපනයක් ලබාදීම සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අචල කැපවීමයි මනාව පිළිබිඹු කරයි.

## 2.4 නේවාසිකාගාර

### 2.4.1 විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාර

| නම | ස්ථානය | ධාරිතාවය | | | එක් සිසුවෙකු සඳහා ගාස්තු වසරකට (රු.) |
|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | |
| කොරල් බියුටි | විශ්වවිද්‍යාල පරිශ්‍රය | 140 | - | 224 | 5,000.00 |
| සිල්වර් ටිප්ස් | | 84 | - | | |
| බ්ලූ ෂැෆායර් | | - | 140 | 280 | |
| කැට්ලියා | | - | 140 | | |

- වර්තමානයේ විශ්වවිද්‍යාලය විසින් 1 වසර, 3 වසර සහ 4 වසර සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ. සිසුන් 504 දෙනෙකුට විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර තුළ නවාතැන් පහසුකම් සලසා ඇති අතර අනෙකුත් සිසුන්ට කුලියට ලබාගත් නේවාසිකාගාර ලබා දෙනු ලැබේ.

- කුලියට ගත් ශිෂ්‍ය නේවාසිකාගාර ලැයිස්තුව සහ එම නේවාසිකාගාරවල ශිෂ්‍ය ධාරිතාව 2.4.2 වගුවේ දක්වා ඇත. අභ්‍යන්තර නේවාසිකාගාර තුළ නවාතැන් ගන්නා සිසුවෙකු සඳහා නේවාසිකාගාර ගාස්තුව වසරකට රු. 5000ක් වන අතර පිටතින් කුලියට ලබා ගත් නේවාසිකාගාරවලින් නවාතැන් පහසුකම් ලබා දෙන සිසුන්ගෙන් රු. 3500 ක ගාස්තුවක් අයකරනු ලැබේ.

## 2.4.2 විශ්වවිද්‍යාලය විසින් කුලියට ලබාගත් නේවාසිකාගාර

| අංකය | ස්ථානය | වසරකට කුලී පිරිවැය | 2022 දෙසැම්බර් 31 වැනි දිනට නවාතැන් ගෙන සිටින සංඛ්‍යාව | | | සිසුන් සඳහා/වසරකට ගාස්තු |
|---|---|---|---|---|---|---|
| | | | **පිරිමි** | **ගැහැණු** | **එකතුව** | |
| 1 | එල්.ජී.එස්. රෝහණ මහතා, අංක C 192/1, බදුලුපිටිය, බදුල්ල | 882,000 | | 21 | 21 | 3,500 |
| 2 | වයි.එම්. දයානන්ද මහතා, මධුර, කජුවත්ත, රඹුක්පොත, බදුල්ල | 529,200 | 15 | | 15 | 3,500 |
| 3 | ඌව අධ්‍යාපන සමූපකාර සංගමය, අංක 24, රෙස්කුස් පාර, බදුල්ල | 642,600 | 22 | | 22 | 3,500 |
| 4 | පී.කේ. සෝමතිලක මහතා, අංක 79/3, මඩවත්ත, රඹුක්පොත, බදුල්ල | 1,140,000 | 25 | | 25 | 3,500 |
| 5 | එම්.ජී. සනත් මහතා අංක 25A, ජල ටැංකි පාර, හිඳගොඩ, බදුල්ල | 480,000 | | 18 | 18 | 3,500 |
| 6 | ඩබ්ලිව්.එච්.ඩී.වී.ටී මධුරංගි මහත්මිය, අංක 73 ඒ, බී, බදුලුසිරිගම, බදුල්ල | 925,500 | 22 | | 22 | 3,500 |
| 7 | ඒ.ජේ.එම්. ඉල්ලියාස් අංක 125/21, පස්සර පාර, බදුල්ල | 2,100,000 | 45 | | 45 | 3,500 |
| 8 | කේ.කේ.ඩී.ජී.එස් ලංකා මහතා, අංක 03, බණ්ඩාරපුර, පස්සර පාර, බදුල්ල | 1,260,000 | | 27 | 27 | 3,500 |
| 9 | එස්.ජේ.එම්.එන්.යූ.කේ. සමරකෝන් මහතා ,මැටි කුඹුර, 2 කණුව, පස්සර පාර, බදුල්ල | 1,386,000 | | 27 | 27 | 3,500 |
| 10 | ඒ.එම්. කරුණාරත්න ටී බණ්ඩාර මහතා, කලායතනය, බටවත්ත, රඹුක්පොත, බදුල්ල | 396,900 | 12 | | 12 | 3,500 |
| 11 | එම්.ජේ.කේ.සී. අනුරුද්ධික මහතා, අංක 07, සිරිමල්ගොඩ ඇල පාර, හිඳගොඩ, බදුල්ල | 540,000 | | 15 | 15 | 3,500 |
| 12 | ඩබ්ලිව්.එස්.ඒ වික්‍රමාරච්චි මිය, අංක 37/ඒ/1/1, උයන්වත්ත, හංවැල්ල, බදුල්ල | 1,159,200 | | 34 | 34 | 3,500 |
| 13 | ඒ.එම්.එස්.අත්තනායක මහතා, No4A, ජල ටැංකි පාර, හිඳගොඩ, බදුල්ල | 660,000 | | 24 | 24 | 3,500 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | බී.සී.රොද්‍රිගු මහතා, නො. 243, මහියංගන පාර, බදුල්ල | 504,000 | | 21 | 21 | 3,500 |
| 15 | එන්.සී නදීශානි මෙනවිය, පරණ කොළඹ පාර, ජයගම | 1,653,750 | 37 | | 37 | 3,500 |
| 16 | ඩබ්ලිව්.එස්.එම්.එන්.ඩී.කේ. ගුණසේකර මෙනවිය, අංක 61/2, පස්සර පාර, උඩවෙල, බදුල්ල | 1,986,000 | 50 | | 50 | 3,500 |
| 17 | එම්.එම්.මලවිපතිරණ මහත්මිය, නො. 61,2/1, සේතපුම, උඩවෙල, පස්සර පාර, බදුල්ල | 3,300,000 | 64 | | 64 | 3,500 |
| 18 | ඩී.එම්.එස්.එම්.බී. දිසානායක, අංක 70, බදුලුසිරිගම, බදුල්ල | 720,000 | | 28 | 28 | 3,500 |
| 19 | එස්.එච්.ටී දසන්ත ද සිල්වා මහතා, අංක 79/2, රඹුක්පොත, බදුල්ල | 1,680,000 | 33 | | 33 | 3,500 |
| 20 | ඩී.එස්.එම්. රොද්‍රියෝගෝ මහත්මිය, අංක 82/2, රඹුක්පොත, පන්සල අසල, වලව්වත්ත, රඹුක්පොත | 730,800 | | 15 | 15 | 3,500 |
| 21 | ඒ.එච්.ආර් සිල්වා මහතා, අංක 62/1, බදුලුසිරිගම, බදුල්ල | 528,000 | | 17 | 17 | 3,500 |
| 22 | පී.ආර්.සී. නිශාන්ත මහතා, අංක 54, මොරගහ ඇල්ල, රඹුක්පොත, බදුල්ල | 756,000 | 16 | | 16 | 3,500 |
| 23 | ඩී.එම්.බී.ජේ.ටී.අබේරත්න මහතා, 1/80, පන්සල පාර, රඹුක්පොත, බදුල්ල | 2,816,000 | | 55 | 55 | 3,500 |
| 24 | එච්.ඒ.ආර්. කුමාරි මිය, සම්පත් සෙවණ, වලව්වත්ත, රඹුක්පොත, බදුල්ල | 2,778,300 | | 52 | 52 | 3,500 |
| 25 | එම්.ආර්.එස්. අත්තනායක මහත්මිය, කැදැල්ල නේවාසිකාගාරය, වත්ත, රඹුක්පොත | 3,540,600 | | 60 | 60 | 3,500 |
| 26 | කේ.ඒ.පියල් මහතා, පියල් මෝටෝ ඉංජිනේරු, නුගයාය, වැල්ලවාය | 1,680,000 | 30 | | 30 | 3,500 |
| 27 | ඩී.එම්.එම්.හේමලතා මෙනවිය, අංක 358/27, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල | 2,310,000 | 46 | | 46 | 3,500 |
| 28 | ඩී. තෙන්නකෝන් මෙනවිය, අංක 29/බී, හංවැල්ල පාර, බදුල්ල | 348,000 | | 16 | 16 | 3,500 |
| 29 | ඒ.එම්. ධනපාල අත්තනායක මහතා, නො. 18 හිත මිතුරු මෝටර්ස්, පස්සර පාර, බදුල්ල | 900,000 | | 24 | 24 | 3,500 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 30 | එම්.එම්. රංජිත් මහතා අංක 7, ගල්කොටුව වත්ත, රඹුක්පොත, බදුල්ල | 546,000 | 15 | | 15 | 3,500 |
| 31 | ආර්.ආර්. ජයතිලක මහතා, අංක 3, කජුවත්ත, රඹුක්පොත, බදුල්ල | 756,000 | | 16 | 16 | 3,500 |
| 32 | ඉඩරිස් මුහාරිස් කමලාදීන් මහතා, අංක 09, තෙල්බද්ද පාර, පස්සර පාර, බදුල්ල | 1,058,400 | 26 | | 26 | 3,500 |
| 33 | ඩී.පී.එම් වීරසිංහ මහතා, කජුවත්ත, රඹුක්පොත, බදුල්ල | 1,455,300 | | 33 | 33 | 3,500 |
| 34 | ජේ.එම්.ඩී කුෂාන් මලින්ද මහතා, අංක 62, බදුලුසිරිගම, බදුල්ල | 1,008,000 | | 27 | 27 | 3,500 |
| 35 | ඩී.එම්.කුසුමාවතී මහත්මිය, අංක 46, ෆොරස්ට් ලේන්, ජයගම, පස්සර පාර, බදුල්ල | 466,200 | 10 | | 10 | 3,500 |
| 36 | ඩබ්ලිව්.එච්.ඩී.අයි. ප්‍රසාද් මහතා, අංක 421, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල | 1,953,000 | 38 | | 38 | 3,500 |
| 37 | ඒ.එම්.එන්.එස්.අත්තනායක මෙනවිය, අංක 471, /ඒ, සිරිමල්ගොඩ ඇල පාර, බදුල්ල | 1,958,040 | | 42 | 42 | 3,500 |
| 38 | ටී.ජේ. සිල්වා මහතා, අංක 23, බෝගහකුඹුර, රඹුක්පොත, බදුල්ල | 979,020 | 20 | | 20 | 3,500 |
| 39 | ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය, සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථානය, අංක 47, ස්ප්‍රිංවැලි පාර, බදුල්ල | 1,165,500 | | 25 | 25 | 3,500 |
| 40 | ඩබ්ලිව්.පී.ඩබ්ලිව්.ආර්. වර්ණකුලසූරිය, අංක 64/3, බණ්ඩාරපුර, පස්සර පාර, බදුල්ල | 1,146,600 | | 27 | 27 | 3,500 |
| 41 | වී.පී.ඒ ඉරෝෂන් මහතා, අංක 48, රඹුක්පොත, බදුල්ල | 2,106,000 | | 45 | 45 | 3,500 |
| 42 | ටී.එම්.ඩිංගිරිබණ්ඩාර මහතා, අංක 15/ඒ, ජලටැංකියපාර, හිඳගොඩ, බදුල්ල | 318,000 | | 12 | 12 | 3,500 |
| 43 | ඩී.පී.එස්.පී පීරිස් මහතා, අංක 58, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල | 3,120,000 | | 65 | 65 | 3,500 |
| 44 | ඒ.එම්.එම්. පත්මකර මහතා, වනසංරක්ෂණ පටුමග, ජයගම, බදුල්ල | 2,160,000 | | 40 | 40 | 3,500 |

## 2.5 ශිෂ්‍යත්ව

### 2.5.1 මහපොළ සහ ශිෂ්‍යාධාර – 2022

| පීඨය | බඳවා ගත් වර්ෂය | අධ්‍යයන වර්ෂය | ලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | මහපොළ | ශිෂ්‍යාධාර |
| සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | 2019/2020 | 1 | 49 | 142 |
| | 2018/2019 | 2 | 6 | 139 |
| | 2017/2018 | 3 | 21 | 111 |
| | 2016/2017 | 4 | 12 | 111 |
| ව්‍යවහාරික විද්‍යාව | 2019/2020 | 1 | 107 | 89 |
| | 2018/2019 | 2 | 54 | 58 |
| | 2017/2018 | 3 | 45 | 72 |
| | 2016/2017 | 4 | 54 | 62 |
| කළමනාකරණ | 2019/2020 | 1 | 50 | 120 |
| | 2018/2019 | 2 | 32 | 48 |
| | 2017/2018 | 3 | 20 | 63 |
| | 2016/2017 | 4 | 59 | 27 |
| තාක්ෂණික අධ්‍යයන | 2019/2020 | 1 | 149 | 102 |
| | 2018/2019 | 2 | 91 | 33 |
| | 2017/2018 | 3 | 80 | 50 |
| | 2016/2017 | 4 | 101 | 27 |
| එකතුව | | | **930** | **1254** |

- රජය විසින් මෙහෙයවන ලද වැඩසටහනක් වන මහපොළ ශිෂ්‍යත්වය මගින් සිසුන්ට මූල්‍ය අවහිරතාවලින් තොරව සිය උපාධි අධ්‍යාපනය හැදෑරීමට අවැසි සහාය ලබා දෙමින් සුදුසුකම් ඇති සිසුන් රැසකට මූල්‍යමය ආධාර ලබා දෙන ලදී. මහපොළ ශිෂ්‍යත්වය මහපොළ භාරකාර අරමුල විසින් පිරිනමන ලද රු. 2,600 (කුසලතා) හෝ රු. 2,550 (සාමාන්‍ය) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමන ලද රු. 2450 වශයෙන් ඒකාබද්ධ දායකත්වයකින් සැකසී ඇත. එබැවින්, සමස්තයක් වශයෙන්, ශිෂ්‍යයෙකුට කුසලතා සඳහා වාරිකයකට රුපියල් 5050 ක මුදලක් සහ රු. සාමාන්‍ය ශිෂ්‍යත්වයට 5000ක මුදලක් හිමිවේ.

- තවද, ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දෙන සිසුන් සඳහා ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව පිරිනමන ලද අතර, මූල්‍ය අවහිරතා හේතුවෙන් කිසිදු සිසුවෙකුට අපහසුවක් නොවන බවට වගබලාගන්මින් ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය යටතේ සිසුන්ට රු. 4000 සම්පූර්ණ ලෙස සහ රු. 3,900 අර්ධ ශිෂ්‍යත්වයක් ලෙස ශිෂ්‍යාධාර ගෙවීම සිදුකරනු ඇත . ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය විශ්වවිද්‍යාලය විසින් සිදු කරනු ලබන අතර අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

- මෙම ශිෂ්‍යත්ව ගෙවීම් දෙකම එක් අධ්‍යයන වර්ෂයකට වාරික 10 කින් සිදු කෙරේ. තවද, මෙම ශිෂ්‍යත්ව මගින් සිසුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ඇති ආර්ථික බර ලිහිල් කරනවා පමණක් නොව, එමගින් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අපගේ විශ්ව විද්‍යාලයේ මූලික හර වටිනාකම ද ශක්තිමත් කර ඇත.

### 2.5.2 අනෙකුත් ශිෂ්‍යත්ව – 2022

| ශිෂ්‍යත්වයේ නම – 2022 | පීඨය | ලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| උපකුලපති ශිෂ්‍යත්වය | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | 2 |
| | ව්‍යවහාරික විද්‍යාව | 1 |
| | කළමනාකරණ | 2 |
| | තාක්ෂණික අධ්‍යයන | 2 |
| විදේශ සිසුන් සඳහා ජනාධිපති ශිෂ්‍යත්වය | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | - |
| | ව්‍යවහාරික විද්‍යාව | - |
| | කළමනාකරණ | - |
| | තාක්ෂණික අධ්‍යයන | - |
| චීන තානාපති ශිෂ්‍යත්වය | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | - |
| | ව්‍යවහාරික විද්‍යාව | - |
| | කළමනාකරණ | - |
| | තාක්ෂණික අධ්‍යයන | - |
| ප්‍රදානිත ශිෂ්‍යත්ව | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | - |
| | ව්‍යවහාරික විද්‍යාව | - |
| | කළමනාකරණ | - |
| | තාක්ෂණික අධ්‍යයන | 1 |
| එකතුව | | **8** |

- 2022 දී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් පීඨ හතරක සිසුන් හත් දෙනෙකු සඳහා කුලපති ශිෂ්‍යත්වය පිරිනමන ලදී. විදේශ සිසුන් සඳහා ජනාධිපති ශිෂ්‍යත්ව සහ චීන තානාපති ශිෂ්‍යත්ව හඳුන්වා දුන් අතර මේ වසරේ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැත. මීට අමතරව, අධ්‍යයන විශිෂ්ටත්වය සහ පරිපූර්ණ අධ්‍යාපනයක් උසෙදා විශ්වවිද්‍යාලයේ කැපවීම අවධාරණය කරමින් තාක්ෂණ අධ්‍යයන පීඨයේ සිසුවෙකුට ප්‍රදානිත ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.

# 3 මානව සම්පත්

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මානව සම්පත ප්‍රවීණ අධ්‍යාපනඥයින්, පර්යේෂකයින් සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකකින් රැසකගෙන් සමන්විතවේ. ඔවුන්ගේ සාමූහික කුසලතා සහ කැපවීම අපගේ ආයතනයේ පදනම ශක්තිමත් කරන අතර එමගින් අධ්‍යයන හා විෂය බාහිර යන දෙඅංශයෙන්ම අපව නව තලයකට ඔසවා තබයි.

2022 වර්ෂයේ එක් එක් සේවා කාණ්ඩයට අයත් ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

| සේවා කාණ්ඩය | | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | **ජ්‍යෙෂ්ඨ** මහාචාර්යවරු | U-AC 5 | 253 | 1 *(උප කුලපති)* |
| | මහාචාර්යවරු / **ජ්‍යෙෂ්ඨ** මහාචාර්යවරු | U-AC 5 | | 15 |
| | සහාය මහාචාර්යවරු | U-AC 4 | | 1 |
| | කථිකාචාර්ය | U-AC 3 | | 171 * |
| | පුස්තකාල කාර්ය මණ්ඩලය | U-AC 3 | | 3 |
| | **ජ්‍යෙෂ්ඨ** විධායක නිලධාරීන් | U-EX 3 | 2 | 2 |
| | මධ්‍යම මට්ටමේ විධායකයින් | U-EX 2(a) | 13 | 3 |
| | මධ්‍යම මට්ටමේ විධායකයින් | U-EX 2 | | 3 |
| | ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U-MO 2 | 0 | 0 |
| | වෛද්‍ය නිලධාරී | U-MO 1 | 2 | 1 |
| **උප එකතුව** | | | **270** | **200** |
| **තෘතියික මට්ටම** | කනිෂ්ඨ විධායක/කළමනාකරුවන් | U-EX 1 | 17 | 10 |
| | අධ්‍යයන සහායක - 1 ඛාණ්ඩය | U-AS 2 | 8 | 9 |
| | අධ්‍යයන සහායක - 2 ඛාණ්ඩය | U-AS 1 | 2 | 0 |
| **උප එකතුව** | | | **27** | **19** |
| **ද්විතියික මට්ටම** | මාණ්ඩලික සහකාර/අධිශ්‍රේණි සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | U-MN 4 | 0 | 2 |
| | ආශ්‍රිත නිලධාරීන් - 1 ඛාණ්ඩය | U-MN 3 | 5 | 4 |
| | ආශ්‍රිත නිලධාරීන් - 2 ඛාණ්ඩය | U-MN 2 | 5 | 3 |
| | කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U-MN 1 | 78 | 70 |
| | කළමනාකරණ සහකාර - තාක්ෂණික | U-MT 1 | 41 | 27 |
| **උප එකතුව** | | | **129** | **106** |
| **ප්‍රාථමික මට්ටම** | ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | PL-3 | 8 | 4 |
| | ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු | PL-2 | 30 | 27 |
| | ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL-1 | 32 | 27 |
| **උප එකතුව** | | | **70** | **58** |
| **එකතුව** | | | **496** | **383** |

සටහන: *වි.වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ 935 යටතේ බඳවා ගන්නා ලද තාවකාලික කථිකාචාර්යවරුන් තිදෙනෙක් "කථිකාචාර්ය" කාණ්ඩය යටතේ ඇතුළත් වේ.

## 3.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පළපුරුදු අධ්‍යාපනඥයින් සහ ක්‍රියාශීලී තරුණ විද්වතුන්ගේ එකතුවක් නියෝජනය කරන අතර ඒ සෑම කෙනෙකුම සිය අද්විතීය ප්‍රවීණත්වය සහ අදාළ කුසලතා අපගේ අධ්‍යාපන පරිසරයට රැගෙන එයි. දැනුම ලබා දීම සඳහා ඔවුන්ගේ කැපවීම සහ පර්යේෂණ සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී මැදිහත්වීම විශ්වවිද්‍යාලය තුළ ශාස්ත්‍රීය විශිෂ්ටත්වයේ සහ නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කිරීමට මහෝපකාරී වේ. සිසුන්ගේ විමසිලිමත් මනස් හැඩගැස්වීමට සහ ගෝලීය අභියෝග සඳහා සිසුන් සූදානම් කිරීමට මොවුන් දරන අඛණ්ඩ උත්සාහයන් ලෝක මට්ටමේ අධ්‍යාපනය ලබා දීම උදෙසා වන ආයතනයේ කැපවීම මැනවින් අවධාරනය කරයි.

2022 වර්ෂයේ එක් එක් කාණ්ඩය යටතේ සේවය කළ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව පහත පරිදි වේ

| පීඨය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (SL) | | කථිකාචාර්ය | කථිකාචාර්ය (ආධුනික) | තාවකාලික කථිකාචාර්ය (TL)/ නිදර්ශක (TD)/උපදේශක | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ශ්‍රේණිය I | ශ්‍රේණිය II | | | TL | TD |
| **සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය** | ඉංග්‍රීසි | 0 | 7 | 0 | 8 | 27 | 7 | 24 | 3 | 36 |
| **ව්‍යවහාරික විද්‍යා** | ඉංග්‍රීසි | 0 | 5 | 2 | 8 | 16 | 4 | 29 | 6 | 25 |
| **කළමනාකරණ** | ඉංග්‍රීසි /සිංහල/ දෙමළ | 0 | 4 | 0 | 4 | 11 | 2 | 8 | 13 | 01 |
| **තාක්ෂණික අධ්‍යයන** | ඉංග්‍රීසි | 0 | 2 | 1 | 1 | 6 | 0 | 13 | 3 | 11 |
| එකතුව | | **0** | **21** | | **81** | | **13** | **74** | **98** | |

## 3.2 පරිපාලන කාර්ය මණ්ඩලය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩලය ආයතනයේ සුමට හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කරමින් විශ්වවිද්‍යාලයේ අත්‍යවශ්‍ය යාන්ත්‍රණය ලෙස සේවය කරයි. ඔවුන්ගේ භූමිකාවන් තුළ විශ්වවිද්‍යාල සම්පත් කළමනාකරණය සහ වැඩසටහන් සම්බන්ධීකරණය, ඇතුළත් කිරීම් සහ අධ්‍යයන වාර්තා හැසිරවීම දක්වා වන කාර්යයන් සියල්ල ඇතුළත් වේ. විශ්වවිද්‍යාලයේ ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට ඔවුන් දක්වන කැපවීම සහ සිසුන්ට සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා ඔවුන් ලබාදෙන අවල සහයෝගය ආයතනය බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහ එහි අධ්‍යයන හා විෂය බාහිර කටයුතුවලදී අඛණ්ඩව දියුණුව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා අතිශය වැදගත් වේ.

2022 වර්ෂය සඳහා එක් එක් කාණ්ඩය යටතේ සේවය කළ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| උප කුලපති | 01 | 01 |
| ලේඛකාධිකාරී | 01 | 01 |
| මූල්‍යාධිකාරී | 01 | 01 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරී | 01 | 00 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / නියෝජ්‍ය ලේඛකාධිකාරී | 05 | 03 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී | 04 | 01 |
| වෛද්‍ය නිලධාරී/ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී | 02 | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක/ සහකාර අභ්‍යන්තර විගණක | 01 | 01 |
| අධ්‍යක්ෂ / ශාරීරික අධ්‍යාපන | 01 | 01 |
| චීෆ් මාර්ෂල් | 01 | 00 |
| සහකාර ලේඛකාධිකාරී | 07 | 06 |
| සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවය) | 01 | 01 |
| සහකාර ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන) | 01 | 00 |
| සහකාර මූල්‍යාධිකාරී | 03 | 03* |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 01 | 01 |
| වැඩ ඉංජිනේරු | 01 | 01 |
| භාරකරු (පරිශ්‍රය) | 01 | 00 |
| ව්‍යාපෘති කළමනාකරු | 01 | 01** |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 01 | 01*** |
| **එකතුව** | **35** | **24** |

- තාවකාලික පදනම මත – 02
- ** අර්ධකාලීන පදනම මත – 01
- *** ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වෙනුවට පැවරුම් පදනම මත ආරක්ෂක පරීක්ෂක

### 3.3 පුස්තකාල කාර්ය මණ්ඩලය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පුස්තකාල කාර්ය මණ්ඩලය අපගේ අධ්‍යාපනික මාවතේ අසහාය වීරයන්ය. ඔවුහු සම්පත් වෙත ප්‍රවේශ විය හැකි බව, සංවිධානාත්මක බව සහ යාවත්කාලීන බව සහතික කරමින්, විශාල දැනුම් සමුදායක් කළමනාකරණය කරති. තොරතුරු ලබා ගැනීම සහ බෙදා හැරීම පිළිබඳ ඔවුන් සතු විශේෂඥතාවය සිසුන්ට සහ පීඨයට ඔවුන්ගේ පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු මනා ලෙස පවත්වාගෙන යාම සඳහා මහෝපකාරී වේ. තවද, පුස්තකාල පරිශ්‍රය තුළ හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට ඔවුන් දක්වන කැපවීම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සහය දැක්වීමේ ඔවුන්ගේ වැදගත් භූමිකාව හොවාදක්වයි.

2022 වර්ෂය සඳහා එක් එක් කාණ්ඩය යටතේ සේවය කරන පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| **පුස්තකාලයාධිපති** | 1 | 0 |
| **නියෝජ්‍ය පුස්තකාලයාධිපති** | 0 | 1 |
| **ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති** | 0 | 2 |
| **සහකාර පුස්තකාලයාධිපති** | 3 | 0 |
| **එකතුව** | **4** | **3** |

### 3.4 අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය අධ්‍යාපනික අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. පීඨය සහ සිසුන් අතර සබඳතාව ගොඩනගන අත්‍යවශ්‍ය පාලම ලෙස ක්‍රියා කරමින් ඔවුන් දේශන සම්බන්ධීකරණය කිරීමට, පන්ති කාමර සම්පත් කළමනාකරණය කිරීමට සහ සියලුම අධ්‍යයන ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි සූදානම් කර තැබීමට කටුතු කරයි. සැපයුම් සහ උපදේශන සහය සඳහා ඔවුන් විසින් ඉටුකරනු ලබන කාර්යයන් ඉගැන්වීම සහ ඉගෙනීමේ ක්‍රියාවලීන් බාධාවකින් තොරව පවත්වාගෙන යාමට උපකාරී වේ. මේ හේතුවෙන් සිසුන් බාධාවකින් තොරව ඉගෙනීමේ කටයුතුවල නියැලෙන අතර පීඨයට තම කටයුතු සුමටව පවත්වාගෙන යාමට ඉඩ සැලසේ.

2022 වර්ෂය සඳහා එක් එක් කාණ්ඩය යටතේ සේවය කරන ලද අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| **ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක** | 2 | 1 |
| **පරිගණක තාක්ෂණ උපදේශක** | 4 | 4 |
| **ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක** | 2 | 2 |
| **සහකාර ජාල කළමනාකරු** | 1 | 1 |
| **වෘත්තීය මාර්ගෝපදේශ උපදේශක** | 1 | 1 |
| **එකතුව** | **10** | **9** |

## 3.5 අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| මිලදී ගැනීමේ නිලධාරි | 01 | 00 |
| විනය පාලක | 01 | 01 |
| උප පාලක | 04 | 03 |
| විගණන සහකාර | 03 | 03 |
| තාක්ෂණික නිලධාරි (ශ්‍රව්‍ය දෘශ්‍ය) | 01 | 00 |
| තාක්ෂණික නිලධාරි | 31 | 23 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | 01 | 00 |
| කළමනාකරණ සහකාර | 59 | 56 |
| දුරකථන ක්‍රියාකරු සහ පිළිගැනීමේ නිලධාරියා | 02 | 00 |
| කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) | 02 | 02 |
| කළමනාකරණ සහකාර (පොත් තබන්නා) | 03 | 02 |
| කළමනාකරණ සහකාර (අයකැමි) | 03 | 03 |
| පුස්තකාල තොරතුරු සහකාර | 07 | 06 |
| හෙද නිලධාරියා | 02 | 01 |
| ආරක්ෂක පරීක්ෂක | 02 | 02 |
| වැඩ අධිකාරී | 01 | 00 |
| ගොවිපල අධීක්ෂක | 02 | 00 |
| අධීක්ෂක (සිවිල්) | 01 | 01 |
| අධීක්ෂක (විදුලි) | 01 | 01 |
| අධීක්ෂක (පරිශ්‍රය) | 01 | 01 |
| ඖෂධවේදී (පහළ ශ්‍රේණිය) | 01 | 01 |
| රසායනාගාර සහායක (පහළ ශ්‍රේණිය) | 25 | 24 |
| වඩු කාර්මිකයා | 01 | 00 |
| සවි කරන්නා | 01 | 00 |
| ජලනල කාර්මිකයා | 01 | 01 |
| විදුලි කාර්මිකයා | 02 | 02 |
| භාරකරු සහ අරක්ඇමි | 03 | 02 |
| වැඩ සහායක | 28 | 23 |
| ග්‍රවුන්ඩ්මන් | 01 | 01 |
| කායවර්ධන ශාලාවේ සහායක (පහළ ශ්‍රේණිය) | 01 | 01 |
| පුස්තකාල උපස්ථායක | 03 | 03 |
| උපස්ථායක - සෞඛ්‍ය සේවා (පහළ ශ්‍රේණිය) | 01 | 01 |
| රියදුරු | 03 | 00 |
| එකතුව | **199** | **164** |
| | | |

## 3.6 අනධ්‍යයන කාර්ය මණ්ඩල ව්‍යාප්තිය

| පීඨය/අංශය | වඩාත්ම ජ්‍යෙෂ්ඨ (වසර 10 කට වැඩි කාලයක් සේවය කර ඇති) | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (සේවා කාලය අවුරුදු 1-10) | සුළු සේවකයින් |
|---|---|---|---|
| උපකුලපති කාර්යාලය | - | 02 | 01 |
| රෙජිස්ට්‍රාර් කාර්යාලය | - | 04 | 01 |
| මූල්‍යාධිකාරී කාර්යාලය | - | 02 | 01 |
| සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය | 02 | 13 | 16 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 03 | 11 | 09 |
| කළමනාකරණ පීඨය | 01 | 03 | 00 |
| තාක්ෂණ අධ්‍යයන පීඨය | - | 08 | 06 |
| ශිෂ්‍ය කටයුතු අංශය | 02 | 04 | 01 |
| මානව සම්පත් අංශය | 02 | 05 | 02 |
| සාමාන්‍ය පරිපාලන අංශය | - | 06 | 03 |
| විභාග අංශය | 01 | 03 | 02 |
| ගබඩා සහ සැපයුම් අංශය | 03 | 02 | 01 |
| ගෙවීම් අංශය | - | 04 | 01 |
| වැටුප් හා ණය අංශය | 01 | 01 | - |
| වාර්තා අංශය | - | 02 | - |
| අභ්‍යන්තර විගණන අංශය | 00 | 03 | 01 |
| පුස්තකාලය | 02 | 04 | 03 |
| වෛද්‍ය මධ්‍යස්ථානය | - | 02 | 01 |
| ප්‍රාග්ධන වැඩ අංශය | - | 02 | 00 |
| නඩත්තු අංශය | - | 03 | 03 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 01 | 02 | 02 |
| ශාස්ත්‍රීය පර්යේෂණ සහ ප්‍රකාශන අංශය | - | 01 | 01 |
| දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | 01 | - | 01 |
| කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | - | - | 01 |
| පශ්චාත් උපාධි ඒකකය | - | 01 | - |
| **එකතුව** | **19** | **88** | **57** |

### 3.7 විශ්වවිද්‍යාල නිලධාරීන්ගේ පත්වීම් (උපකුලපති, පීඨාධිපති, ලේඛකාධිකාරී, පුස්තකාලාධිපති, මූල්‍යාධිකාරී)

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් නියම කර ඇති පරිදි ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ නිලධාරීන් ආයතනයේ ඒකාග්‍රතාව, අරමුණු සහ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කරන මූලික පරිපාලන හා ක්‍රියාකාරී ව්‍යුහය සකස් කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ දැක්ම නිරතුරුව අනුගමනය කිරීම සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සහතික කිරීමේ වගකීම නීත්‍යානුකූලව පත් කරන ලද මෙම නිලධාරීන් විසින් දරනු ලැබේ. පනතේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ භූමිකාවන් විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් සඳහා ව්‍යුහාත්මක මග පෙන්වීමක් සපයන අතර ඔවුන් එහි පාලනයේ වගවීම සහ විනිවිදභාවය පිළිබඳ පදනමක් ස්ථාපිත කරයි.

| නම | තනතුර | පත්වීමේ කාලසීමාව |
|---|---|---|
| මහාචාර්ය ජේ.එල් රත්නසේකර | උප කුලපති | **01.02.2017 – 27.01.2020** |
| | වැඩ බලන උපකුලපති | **28.01.2020 – 03.11.2020** |
| | උප කුලපති | **04.11.2020 – 03.11.2023** |
| ආචාර්ය එච්.එම්.ජේ.සී. පිටවල | **පීඨාධිපති**<br><br>**ව්‍යවහාරික විද්‍යා පීඨය** | **28.05.2020 – 27.05.2023** |
| මහාචාර්ය එච්.එම්.එස්.කේ. හේරත් | **පීඨාධිපති**<br><br>**සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය** | **29.05.2020 – 28.05.2023** |
| ජී.එච්. අබේවීර මහතා | **පීඨාධිපති**<br><br>**කළමනාකරණ පීඨය** | **25.08.2020 – 24.08.2023** |
| මහාචාර්ය කේ.බී. විජේසේකර | **පීඨාධිපති**<br><br>**තාක්ෂණ අධ්‍යයන පීඨය** | **25.11.2020 – 24.11.2023** |
| එම්.එෆ්. හිබතුල් කරීම් | ලේඛකාධිකාරී | **15.11.2017 to date** |
| ආචාර්ය ටී.ප්‍රතිපන් | පුස්තකාලයාධිපති (වැඩබලන) | **02.01.2023 – 01.04.2023** |
| කේ.ටී.ජේ. පෙරේරා මෙනවිය | **මූල්‍යාධිකාරී** | 03.11.2020 **date** |

## 3.8 විශ්වවිද්‍යාලයේ අංශ ප්‍රධානීන් පත්කිරීම

| නම | පීඨය | අධ්‍යයනාංශය | සේවා කාලය |
|---|---|---|---|
| **ආචාර්ය ඩී.සී මුදන්නායක** | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | සත්ව විද්‍යා | 01.01.2021 – 31.12.2023 |
| **ආචාර්ය ඒ.එම්.ඩබ්ලිව්.කේ. සෙනෙවිරත්න** | | අපනයන කෘෂිකර්මය | 29.05.2020 – 28.05.2023 |
| **ආචාර්ය ඒ.පී හේනගමගේ** | ව්‍යවහාරික විද්‍යා | විද්‍යාව සහ තාක්ෂණය | 28.05.2020 – 27.05.2023 |
| **එස්.ඩී.එච්.එස්. වික්‍රමරත්න මෙනවිය** | | පරිගණක විද්‍යා සහ තොරතුරු විද්‍යා | 30.05.2020 – 29.05.2023 |
| **ආචාර්ය ඒ.එස්. රත්නායක** | | ව්‍යවහාරික ජෛවීය විද්‍යා | 15.10.2020 – 14.10.2023 |
| **මහාචාර්ය කේ.ජී.සී. සේනාරත්න** | තාක්ෂණික අධ්‍යයන | ජෛව පද්ධති තාක්ෂණ | 27.01.2021 – 26.01.2024 |
| **ආචාර්ය එච්.එම්.සී.එම්. හේරත්** | | ඉංජිනේරු තාක්ෂණ | 03.10.2022 – 02.10.2025 |
සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;
- යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්හි ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.189,217,447 ක් වූ වත්කම් 2022 දෙසැම්බර් 31 දිනට තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යමණ්ඩලය සීමා සහිත වීම නිසා පියවර කිහිපයක් යටතේ ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව ගොඩනැගිලි සහ විද්‍යාගාර උපකරණ ප්‍රත්‍යාගණනය කර අවසන් වී ඇති අතර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු 2023 වර්ෂයේ දී නිම කිරීමට බලාපොරත්තු වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.2,173,401 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.19.2 ට අනුව රු.216,067,868 ක් 2022 වර්ෂයේ හුවමාරු නොවන ආදායම් ලෙස ද රු.2,173,402 ක් වර්ෂ අවසානයේ ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස දක්වන ලදි. මෙය ගිණුම්කරණ ප්‍රමිත සමඟ ඉදිරියේ දී සසඳා බැලීමට එකඟ වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------- | ----------- |
| (අ) | උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබුණු එකතුව රු. 20,528,699 ක් වූ වත්කම් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | මෙම ව්‍යාපෘතිය මඟින් 2022.11.01 දින සිට 2022.12.31 දින දක්වා මිලදී ගත් වත්කම් හඳුනා ගැනීම, සත්‍යාපනය සහ මූල්‍ය කමිටුව හරහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම යන කාරණා 2022 වර්ෂය තුලදීම සිදු කිරීම ප්‍රායෝගික නොවූ නිසා එම වත්කම් 2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය වෙත භාරදීමට තීරණය කරන ලද බව. | එක් එක් වර්ෂයන් තුලදී මිලදී ගත් වත්කම් එම වර්ෂයට අදාලව ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයට අදාලව ආරක්ෂක සේවා ලබාගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.4,312,139 ක් පෙර වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වර්ෂයට අදාල වියදම නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වලට අදාලව සමුච්චිත ක්ෂය ගැලපීමේදී ක්ෂය වෙන්කිරීමේ ගිණුමෙන් රු.3,321,744 ක් වැඩියෙන් ඉවත් කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිතය හා සමුච්චිත ක්ෂය එම වටිනාකමෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණන ක්‍රියාවලියේ දී විද්‍යාගාර උපකරණ ගිණුම් තුළ පිරිවැය රු.38,356,778 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හඳුනා ගන්නා ලදි. එම වත්කම් වලට අදාල ශුද්ධ අගය රු.559,012 ක් වූ අතර එම ගිණුම්කරණ දෝෂය නිවැරදි කර ඇති බැවින් වර්ෂයේ අලාභයට කිසිදු බලපෑමක් සිදු නොවේ. | අදාල ක්ෂය වටිනාකම අනුව ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් කථිකාචාර්යවරුන් තිදෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු එකතුව | කථිකාචාර්යවරුන් දෙනෙකුගෙන් අයකරගත යුතු රු.3,231,845 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් ස්ථිර වශයෙන්ම අයකරගත හැකි බැවින් එය අයකරගත යුතු මුදල් | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීමට අදාළව අයකර ගත යුතු මුළු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල |

| | | |
|---|---|---|
| රු.10,423,394ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | යටතේ දක්වා නොමැති බව. ආචාර්ය උපාධි සහතිකය ඉදිරිපත් නොකළ කථිකාචාර්යවරයාගෙන් රු.7,191,549 ක් අයකර ගත යුතු බවට විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කර ඇතත් ඒ සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන නීතිපතිගෙන් විමසා ඇති බව. එම උපදෙස් ලැබෙන තුරු බැඳුම්කර ගිවිසුම් කඩකළ ආචාර්යවරයකු ලෙස හෙළිදරව් කර නොමැති බව. | හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------- | -------------------- | ------------------ | ----------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේදී අතුරුදවුම් වශයෙන් රඳවාගෙන තිබුණු වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.49,950,980කට අදාල තැන්පතු 49 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකතුව රු.19,854,646ක් අවසන් බිල්පත්‍ර ගෙවූ පසු හා වගකීම් කාලය ඉකුත් වීමෙන් පසු නිදහස් කරන බව.<br>එකතුව රු.4,196,333ක අතරුදවුම් මේ වනවිට නිදහස් කරමින් පවතින බව<br><br>එකතුව රු.25,900,000ක අතරුදවුම් නිදහස් කිරීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය<br>-------------------- | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 184 දෙනෙකුගේ පැමිණීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දිමනා ලෙස එකතුව රු.742,937,739 ක් ගෙවා තිබුණි. | සෑම මසකම අවසානයේ දී වැටුප් අංශය මඟින් අදාල ප්‍රධානීන්ගෙන් නිලධාරීන් සේවයේ නියුක්ත බවට තහවුරුවක් වැටුප් ගෙවීමට පෙර ලබා ගන්නා බව. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | V පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 2022 දෙසැම්බර් 31 දින වන විට බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ආචාර්යවරුන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.110,016,322ක් අයකරගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් එක් එක් නිලධාරීයාගෙන් අයවිය යුතු මුදල් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලින් හා ඉතිරිය වාරික වශයෙන් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | විදේශ ප්‍රදාන මත ක්‍රියාත්මක ව්‍යාපෘති 08 ක් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීමකින් තොරව ව්‍යාපෘති 06 ක් සඳහා 2022 වර්ෂය තුළදී රු.16,137,996 ක් ලබාගෙන තිබුණි. | විදේශ ප්‍රදාන මත ක්‍රියාත්මක ව්‍යාපෘති 08 සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 19 දිනැති ලිපිය මඟින් මහා භාණ්ඩාගාරය දැනුවත් කළ බව. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව නිල නිවාස කුලී අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් උපකුලපතිවරයා ඇතුළු නිලධාරීන් 53 දෙනෙකුගෙන් එකතුව රු.4,847,532 ක් වූ නිල නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි | 2018 වර්ෂය පමණ වන තෙක් විශ්වවිද්‍යාලයේ පැවති අධ්‍යයන හා අනධ්‍යන සේවක පුරප්පාඩු හේතුවෙන් මෙම අංශවල සංවර්ධනයක් සිදු කිරීම සඳහා නිවාස මණ්ඩලයේ නිර්දේශ හා පාලක සභාවේ අනුමැතිය මත නේවාසිකාගාර /කාර්යමණ්ඩල පහසුකම් සැපයූ බව | අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.869,829,650 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. | 2016 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශය විසින් පොදු ලෙජරය වැටුප් සැකසුම, තොග සහ ස්ථාවර වත්කම් යනාදී අංශයන්ගේ ගනුදෙනු වාර්තාකරණය සඳහා පරිගණක පද්ධති 04 ස්ථාපිත කරන ලද බව. එක් එක් කාණ්ඩයේ වත්කම් ප්‍රත්‍යාගණනය අවසන් කර ස්ථාවර වත්කම් මෘදුකාංගය යාවත්කාලීන කිරීමට තීරණය කර ඇති බව. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | --------------------------------- | ----------- |
| (අ) | 2017 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයේ 181 දෙනෙකු වෙනුවෙන් ගෙවල් කුළී දීමනා ලෙස එකතුව රු.69,239,305 ක් ගෙවා තිබුණි. | මෙම ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගැනීමට දෙවන වරටත් යොමුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය මේ දක්වා ලැබී නොමැති බව | විධිමත් අනුමැතියකින් තොරව දීමනා ගෙවීමට කටයුතු නොකළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ ඉංජිනේරු තනතුරක් සඳහා 2015 දෙසැම්බර් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06 කාල පරිච්ඡේදයක් සඳහා රු.50,000 ක දීමනාවක් ගෙවීමේ පදනම මත ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරුවරයෙකු අර්ධ කාලීනව පත්කර තිබුණි. අඛණ්ඩව සේවා කාලය දීර්ඝ කරමින් 2018 ජුනි 01 දින සිට මාසික දීමනාව රු.75,000 ක් දක්වා වැඩි කර තිබූ අතර 2015 | 2016.12.30 දිනැති පත්වීම් ලිපිය අනුව එම මහතා රු. මිලියන 1,200 වටිනා ව්‍යාපෘති 05 ක ටෙන්ඩර් කටයුතු හා ඉදිකිරීම් භාරව කටයුතු කරන ලද අතර ඔහුට ගෙවීම් සිදු කරනු ලබනුයේ අදාල ව්‍යාපෘති 05 හි උපදේශන සේවා සඳහා වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන වලින් බව. | අනුමත කාර්යය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා එකතුව රු.5,325,000 ක මුදලක් ගෙවා තිබුණි. | | |
| (ඇ) | අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරකට ඉඩම් පවරා ගැනීමේ කටයුතු අධීක්ෂණය සඳහා 2017 දෙසැම්බර් 06 දින සිට විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු බඳවාගෙන 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි මාසිකව රු.50,000 ක් බැගින් පත්වීම් දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.3,050,000 ක් ගෙවා තිබුණි. තවද, 2005 ජූලි 28 දිනැති අංක 1403/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කරගනු ලබන බවට ප්‍රකාශ කිරීමෙන් පසු ඉදිරි කටයුතු ප්‍රාදේශීය ලේකම්වරයාට පැවරී තිබිය දී, උක්ත පත්වීම සිදුකර තිබුණු අතර පත්වීමෙන් පසු වසර 05 ක කාලයක් ගතවී තිබුණද ප්‍රකාශිත ඉඩම් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ අංක UGC/ IDD/ GEN/ 01 දරන ලිපිය මගින් ලබා දී ඇති නිර්දේශ අනුව විශේෂඥ දැනුම ඇති විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත 2017 දෙසැම්බර් 11 වන දින පත් කර ගන්නා ලද බව<br>මෙම නිළධාරීයා පැමිණීමෙන් පසු හෙක්ටයාර 0.8119ක ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර ඇති අතර අක්කර 12ක හා අක්කර 05ක ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ඉහත පරිදි කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඇ) | 2010 අප්‍රේල් 23 දිනැති අංක 921 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුර සඳහා 2018 ජූලි 25 දිනැති පත්වීම් ලිපිය මගින් සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවකු අවිධිමත් ලෙස බඳවාගෙන 2018 අගෝස්තු සිට 2022 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.14,061,053ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. එසේම පුහුණු තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියේ "ආ"කාණ්ඩයේ | 178 වන පාලක සභා රැස්වීමේදී මෙම කරුණ පිළිබඳව පත් කරන ලද අනු කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශ අනුව අධ්‍යාපන සුදුසුකම් සහ වසර හයක පළපුරුද්දක් අවශ්‍ය බැවින් 2018 අගෝස්තු 01 දින සිට වසර තුනක කාලයක් සහකාර පුස්තකාලයාධිපති (සංක්‍රාන්ති) තනතුරට ඇතුළත් කර 2021 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ | සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තනතුරකට සුදුසුකම් සපුරා නොමැති අයෙකු බඳවාගෙන 2016 අප්‍රේල් සිට 2021 ඔක්තෝම්බර් දක්වා රු.3,275,787 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | සහකාර පුස්තකාලයාධිපති තනතුරට උසස් කිරීමට පාලක සභාව තීරණය කරන ලද බව. | |

**1.8 අනුචිත ඇගයීම් හෝ ඇස්තමේන්තු කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | --------------------------------- | ----------- |
| ආරක්ෂක සේවය පවත්වාගෙන යාම සඳහා අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සමාගමේ ලංසුව සාධාරණ හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර තෙවන අවම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් 2020 ඔක්තෝබර් 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා ආරක්ෂක සේවා ලබාගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් රු.11,827,308 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දිනක අවම වැටුප අනුව නිවැරදිව ලංසුපත් ඉදිරිපත් කර ඇති ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කර ඇති බව. | රජයට උපරිම වාසිදායක වන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. |

**02. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.225,687,938 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.142,962,594 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.368,650,532 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.223,158,284 කින් අඩුවී තිබීම, මෙහෙයුම් වියදම් රු.256,952,249 කින් හා මෙහෙයුම් නොවන වියදම් රු.36,285,606 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | 2004 ඔක්තෝබර් 28 දිනැති අංක 2004/ED/HE/45 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර ඉදිකර ශිෂ්‍යයන් හා නිලධාරීන්ට | මූලික වශයෙන් සිසුන් 502 කට නේවාසිකාගාර පහසුකම් ඉදිකර ඇති අතර අනෙක් සිසුන් සඳහා විශ්වවිද්‍යාලය අවටින් නේවාසික පහසුකම් | සිසුන්ට නේවාසිකාගාර පහසුකම් සැලසීමට කඩිනම් පියවර ගත යුතුය. |

නේවාසික පහසුකම් සැපයිය යුතු වුවත්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හෝ සුදුසු ස්ථාන හඳුනා ගෙන නේවාසිකාගාර ඉදිකිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2018 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා බාහිර නේවාසිකාගාර පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් එකතුව රු.202,907,314 ක් කුලී ගෙවීමට සිදුවී තිබුණි.

සපයා දී ඇති බව. නේවාසිකාගාර ඉදිකිරීමට 2015 වසරේ සිට කටයුතු කරන අතර ඒ වෙනුවෙන් අක්කර 12 ක ඉඩමක් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින අතර මෙමගින් 2000 කට පමණ නේවාසිකාගාර පහසුකම් ලබා දීමට අපේක්ෂා කරන බව.


CHAMPIONS
2022





ANS TROPHY

E-TECH
ETEC ETEC ETEC ETEC
E-TECH


## 7.12 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඌන වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන හා අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

| අනු අංක | විශ්වවිද්‍යාල කළමනාකාරිත්වයේ අදහස් හා ගෙන ඇති පියවර |
|---|---|
| 1.2 (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 ප්‍රකාරව බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගත් මුදල් හා එම මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන පොළිය වසරේ ආදායමට ඇතුළත් නොකිරීමට තීරණය කර තිබුණි. එම චක්‍ර ලේඛය තුළ මුදල් ආදායමට ගැනීම පිළිබඳ සඳහන් නොවන අතර ලැබෙන මුදල් ආයෝජනය කිරීමට සුදුසු වියදම් දැරීම පිළිබඳ සඳහන් වේ. මෙම සියලු ලදුපත්, බැඳුම්කර උල්ලංඝනය කිරීම් අරමුදලේ සංචිත ලෙස පවතී. පොළී ආදායම ඉදිරියේදී ආදායමට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | විශ්වවිද්‍යාල ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.19.2 අනුව, රු. 216,067,868 ක මුදල හුවමාරු කළ නොහැකි අදායම ලෙස සැලකෙන අතර රු. 2,173,402 ක වර්ෂයේ ප්‍රාග්ධන ආදායම වසර්ෂ අවසානයේ ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස පෙන්නුම් කර ඇත. ඉදිරියේදී මෙය ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව සිදුකිරීමට එකඟ වේ. |
| (අැ) | උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම්, අවස්ථා දෙකකදී පාලක සභාවේ අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාලයට භාර දෙන ලදී. ඒ අනුව, 2018,2019 හා 2020 යන වර්ෂවලදී මිලදී ගත් ස්ථාවර වත්කම් 2021 වර්ෂයේදීත්, 2022.10.31 දක්වා මිලදී ගත් වත්කම් 2022 වර්ෂයේදීත් ගිණුම්ගත කර ඇත. 2022.11.01 2022.12.31 මුදල් කාරක සභාව හරහා පාලක සභාවේ හඳුනාගැනීම්, තහවුරු කිරීම් හා අනුමැතිය ලබාදීම ප්‍රායෝගික නොවන බැවින් 2023 වර්ෂයේදී එම වත්කම් විශ්වවිද්‍යාලයට පැවරීමට තීරණය විය. ඒ අනුව, රු. 92,186,879 ක් පහත පරිදි ගිණුම්ගත කර ඇති අතර ඒ අනුව ක්ෂය ප්‍රතිපාදන සලසා ඇත. |

| වත්කම් කාණ්ඩය | පිරිවැය(රු.) |
|---|---|
| පරිගණක | 49,677,760 |
| විද්‍යාගාර උපකරණ | 4,669,719 |
| දැව හා සවිකිරීම් | 21,340,143 |
| පොත් | 350,674 |
| ප්‍රාග්ධන අලුත්වැඩියා | 1,704,578 |
| කාර්යාල උපකරණ | 1,089,650 |
| අනෙකුත් උපකරණ | 13,354,355 |
| එකතුව | 92,186,879 |

ඒ අනුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණයට එකඟ විය නොහැකි බව කාරුණිකව දන්වමි.

(ඇ). ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (SLPSAS 01) අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ අරමුණ වන්නේ තීරණ ගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම හා සංවිධානය සත් සම්පති සම්බන්ධයෙන් සංවිධානයේ වගවීම පෙන්නුම් කිරීමයි.

i. ආයතනයේ මූල්‍ය සම්බත් මූලාශ්‍ර, ඒවා වෙන් කරන ආකාරය හා ඒවා භාවිතා කරන ආකාරය පිළිබඳ තොරතුරු සපයන්න.

ii. සංවිධානයේ විවිධ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය පහසුකම් සපයන ආකාරය හා මූල්‍ය අවශ්‍යතා සපුරන ආකාරය පිළිබඳ තොරතුරු සැපයීම

iii. ආයතනයට එහි ක්‍රියාකාරකම් සඳහා මුදල් යෙදවීමට සහ එහි වගකීම් හා වගකීම් ඉටු කිරීමට ඇති හැකියාව තීරණය කිරීමට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම

iv. සංවිධානයේ මූල්‍ය තත්ත්වය හා එහි වෙනස්වීම් පිළිබඳ තොරතුරු සැපයීම

v. සේවා පිරිවැය, කාර්යක්ෂමතාව හා කාර්යසාධනය සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම

මෙහි 18 වන පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි මෙම ප්‍රමිතිවල මූලික පරමාර්ථය ලාභ නොලබන සංවිධාන හා සම්බන්ධ වන අතර සේවා අවශ්‍යතා සපුරාලීම හා මූල්‍ය අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කළමනාකරුවන් වගකිව යුතුය. තවද, මෙහි 100 වන පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි කාලසීමාවක් තුළ සාමාන්‍යයෙන් සියලුම ආදායම් හා වියදම් අයිතම අතිරික්ත හෝ හිඟයට ඇතුළත් වේ. ඒ අනුව, 2022 වර්ෂයේදී හඳුනාගත් හිඟ වැටුප් 2022 වර්ෂයේදී වියදමක් ලෙස ගෙවීමට කටයුතු කරන ලදී.

| | |
|---|---|
| | 2022 වර්ෂයේදී රු. 48,902,832 ක් වූ මිලදී ගැනීම් සඳහා 2021 වර්ෂයේදී AHEAD ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගත් රු. 37,864,337 ක් වටිනා උපකරණ හා කෙරීගෙන යන ප්‍රාග්ධනය තුළ වූ රු. 1,944,000 ක් වටිනා ප්‍රාග්ධනිත කරන ලද විද්‍යාගාර උපකරණ, ප්‍රත්‍යාගණනය කරන ලද උපකරණ තුළ ඇතුළත් නොවේ.<br><br>2022 වර්ෂයේ මිලදී ගැනීම් මත ක්ෂය — 9,065,945<br>AHEAD ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂයේදී මිලදී ගැනීම් සඳහා ක්‍රමක්ෂය — 3,815,955<br>රසායනාගාර උපකරණවල ප්‍රාග්ධනිත කිරීම මත ක්ෂය — 64,800<br>2022.12.31 දිනට විද්‍යාගාර උපකරණවල සමුච්චිත ක්ෂය වීම — 12,946,700<br><br>ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රසායනාගාර උපකරණවල ශුද්ධ වටිනාකම සඳහා බලපෑමක් ඇති නොවේ. |
| (ඉ) | **i. <u>W.M.P.G.C. වීරකෝන් මිය</u>**<br>W.M.P.G.C. වීරකෝන් මියගෙනි අයකර ගැනීමට තිබූ ඉතිරි මුදලට ඇතුළත් වූ රු. 1,629,605 ක මුදල 2022.12.31 දින ඇයගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් පියවීමට තීරණය කරන ලද මුදල වේ. එය අය කරගැනීමට අදාළ ලියවිලි අර්ථ සාධක අරමුදල වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. මෙම මුදල නිශ්චිතවම විශ්වවිද්‍යාලය සතුව පවතින බැවින් අයකර ගත හැකි මුදල් යටතේ පෙන්නුම් නොකෙරේ. |

<table>
<tr><td></td><td>

**ii. R.W.V.P.C. රාජපක්ෂ මිය**

2022.12.31 දින වනවිට R.W.V.P.C. රාජපක්ෂ මහත්මියගෙන් අයකර ගැනීමට නියමිත ඉතිරි මුදල තුළ ඇතුළත් රු. 1,602,240 ක මුදලක් අර්ථසාධක අරමුදලින් පියවීමට තීරණය කර ඇත. එය අය කරගැනීමට අදාළ ලියකියවිලි අර්ථ සාධක අරමුදල වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. මෙම මුදල නිශ්චිතවම විශ්වවිද්‍යාලය සතුව පවතින බැවින් අයකර ගත හැකි මුදල් යටතේ පෙන්නුම් නොකෙරේ.

**iii. M. රූබවදනන් මහතා**

M. රූබවදනන් මහතා විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවකයෙකු වන අතර ඔහු ආචාර්ය උපාධිය සඳහා නිවාඩු ලබා සිටියද ආචාර්ය උපාධි සහතිකය විශ්වවිද්‍යාලයට ලබා නොදීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු බවට විශ්වවිද්‍යාල පාලක සභාව විසින් තීරණය කරන ලදී. නමුත් ඊට අදාළ නීතිමය ප්‍රතිපාදන අපැහැදිලි බැවින් නීතිපතිවරයාගෙන් නීති උපදෙස් ලබාගැනීමට විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන ලදී. එබැවින් අදාළ නීති උපදෙස් ලැබෙන් තෙක් වර්ෂ අවසාන ගිණුම් තුළ එය බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරයෙකු ලෙස හෙළිදරව් නොකරන ලදී.

</td></tr>
<tr><td>2.2.2<br>(අ)</td><td>

2023.06.30 දිනට විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබාගැනීමේදී වසර 02කට වැඩි කාලයක් රඳවාගෙන ඇති තැන්පතු පහත පරිදි වේ.

| | |
|---|---|
| තාක්ෂණික උපාධි ප්‍රවේශ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා | රු. 7,280,056.60 |
| අදියර II (ඉදිකිරීම්) | රු. 17,228,842.29 |
| අදියර II ඉතිරි වැඩ (ඉදිකිරීම්) | රු. 12,574,589.48 |
| වෙනත් | රු. 6,383,110.10 |

</td></tr>
</table>

| | |
|---|---|
| | **එකතුව** රු. **43,466,598.47**<br><br>අවසන් බිල්පත් පියවීමෙන් පසු 2023.06.30 දිනට අදාළ ශේෂය නිදහස් කරන බව දන්වා ඇත. |
| (ආ) (i) | විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් අත්සන් ලේඛනයක් හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා නොකරන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් දේශන පවත්වන්නේ අධ්‍යයන වර්ෂය ආරම්භයේදී දේශන සඳහා ලබාදෙන කාලසටහන අනුවය. දේශන වාර්තා අධ්‍යයන අංශයේ සටහන් කරන අතර සෑම මසකම වැටුප් ගෙවීමට පෙර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් එම අධ්‍යයන අංශවල සේවයේ යෙදී සිටින බවට වැටුප් දෙපාර්තමේන්තුව විසින් අදාළ අධ්‍යයන අංශ ප්‍රධානීන්ගෙන් තහවුරුවක් ලබාගනී . එම තහවුරු කිරීම මත අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. |
| (ආ) (ii) | **1. R. W. V. P. C. රාජපක්ෂ මිය**<br>R. W. V. P. C. රාජපක්ෂ මියගේ මුළු බැඳුම්කර වටිනාකමෙන් රු. 4,400,000.00 ක් අයකරගෙන ඇති අතර ඉතිරි. 1,602,240.76 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් ද රු. 3,314,560.61ක් ඇගෙන්ද අය කරගැනීමට කටයුතු කරමින් පවතී.<br>**2. W. M. P. G. C වීරකෝන් මිය**<br>W.M.P.G.C. වීරකෝන් මියගේ රු. 9,500,000 මුදලින් රු. 9,500,000.00 ක් විශ්වවිද්‍යාලයට අය කරගෙන ඇති අතර ඉතිරි රු. 1,625,605.32 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් ද රු. 1,377,811.92 ක් ඇයගෙන් ද අය කරගනිමින් පවතී.<br><br>**3. E. K. N. D. ප්‍රනාන්දු මිය**<br>E. K. N. D. ප්‍රනාන්දු මියගෙන් රු. 6,067,099.20 ක් මුදලක් අය කරගෙන ඇති අතර ඉතිරි මුදල වන රු. 676,916.96 විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලෙන් ලබාගැනීට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව පවතී.<br>**4. H. K. S. G. ගුණදාස මිය**<br>H.K.S.G. ගුණදාස මියගෙන් විශ්වවිද්‍යාලයයට රු. 14,611,200.20 ක් අය කරගැනීමට කටයුතු කරමින් පවතී.<br><br>**5. K. M. R. සිරිවර්ධන මිය** |

| | |
|---|---|
| | K. M. R. සිරිවර්ධන මියගෙන් රු. 100,000 ක් අය කරගෙන ඇති අතර ඉතිරි රු. 13,590,973.79 ක් ඇයගෙන් අය කරගැනීමට කටයුතු කරමින් පවතී. |
| | **6. A. M. සමරවීර මිය** |
| | AM සමරවීර මියගෙන් රු. 5,305,000 ක් අය කරගෙන ඇති අතර ඉතිරි රු. 7,580,596.15 ක මුදල ද ඇයගෙන් අය කරගැනීමට කටයුතු කරමින් පවතී. |
| | **7. P.B. I. A. K. බුලුමුල්ල මිය** |
| | P.B.I.A.K. බුලුමුල්ල මියගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු. 8,845,451.92 ක මුදල ඇගෙන් අය කරගැනීමට කටයුතු කරමින් පවතී. |
| | **8. S. M. I. P. G. බණ්ඩාර මිය** |
| | S.M.I.P.G. බණ්ඩාර මියගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු. 16,801,655.31 ක මුදල අය කරගැනීමට කටයුතු කරමින් පවතී. |
| | **9. R.M.C.W.M. රත්නායක මිය** |
| | R.M.C.W.M. රත්නායක මියගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු. 15.247,401.08 ක මුදල අය කරගනිමින් පවතී. |
| | **10. R. M. S. D. රත්නායක මිය** |
| | Mrs. R.M.S.D. රත්නායක මියගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු. 12,602,585.77 ඇයගෙන් අය කරගැනීමට කටයුතු කරමින් පවතී. |
| | **11. N. C. ජයසිංහ මිය** |
| | රු. 500,000.00 ක මුදලක් N.C. ජයසිංහ මියගෙන් විශ්වවිද්‍යාලයට අය කරගෙන ඇති අතර ඉතිරියෙන් රු. 1,996,103.28 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් ද රු. 1,747,671.13 ක් ඇයගෙන් ද අය කරගැනීමට කටයුතු කරමින් පවතී. |
| | **12. M. රුබවදනන් මහතා** |

| | |
|---|---|
| | M. රුබවදනන් මහතාගෙන් විශ්වවාද්‍යාලයට අයවිය යුතු රු. 7,191,548.65 ක මුදල අය කරගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් ලබාගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පාලක සභාව විසින් කටයුතු කරමින් පවතී. |
| (ආ) (iii) | 2005 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර මාර්ගයේ 2 කණුවෙහි පිහටුවීමෙන් පසු විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට එවකට පාලනාධිකාරියට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. එවකට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තනතුරු රැසක් පුරප්පාඩු වී තිබූ අතර බොහෝ අවස්ථාවලදී එම තනතුරු සඳහා රාජකාරී ආවරණයන් සිදුකර තිබුණි. එමෙන්ම බාහිර කථිකාචාර්යවරුන්ට අනෙකුත් විශ්වවිද්‍යාලවල සහයෝගය ඇතිව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු කිරීමට සිදුවිය. මෙලෙස 2018 වර්ෂය දක්වා අධ්‍යයන හා අනධ්‍යයන කටයුතු සිද්කරනු ලැබුවේ මහත් කැප කිරීමක් කරමිනි. මෙලෙස විශ්වවිද්‍යාල කටයුතු පවත්වාගෙන යාමට අධ්‍යයන හා අනධ්‍යයන අංශ සංවර්ධනය කිරීමේ උපාය මාර්ග සැපසීමට පාලනාධිකාරියට සිදුවිය. ඉන් එක් අවස්ථාවක ලෙස, නිවාස මණ්ඩලයේ නිර්දේශ මත හා පාලක සභාවේ අනුමැතිය මත නේවාසිකාගාර පහසුකම්/ කාර්ය මණ්ඩල පහසුකම්/ සුබසාධන කටයුතු සිදුකිරීමෙන් පීඨාධිපතිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය බදුල්ල ප්‍රෙද්ශයේ සේවයට ගෙන්වාගැනීම හා රඳවා ගැනීමට හැකිවිය. ඒ අනුව, මේ වනවිට විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු පිරවීමටත්, උපාධි අපේක්ෂකයන්ට/ අයදුම්කරුවන්ට අධ්‍යයන කටයුතු කරගෙන යාමටත් ඇති හැකියාව නිසා ඵලදායී උපාධිධාරීන් 5,148 ක්පමණ බිහි කිරීමට හැකිව තිබේ. තවද, මේ හරහා විශ්වවිද්‍යාලයේ දරුවන්ගේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට ද හැකිවිය. එපමණක් නොව, බාහිර උපාධි ඒකකය හා පශ්චාත් උපාධි ඒකකය පිහිටුවීම තුළින් විශාල පිරිසකට අධ්‍යාපනය ලබාදීමට අවස්ථාව ලැබී ඇත. පාලක මණ්ඩලයේ නිවැරදි තීරණ හා දූරදර්ශී වැඩපිළිවෙල හේතුවෙන් විශ්වවිද්‍යාලය හා අනෙකුත් ඒකකවල කටයුතු නියමිත වේලාවට කාර්යක්ෂමව අවසන් කිරීමටත් රාජ්‍ය මුදල් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමටත් හැකිවූ බව දන්වා සිටිමු. |
| (ඇ) | 2016 වර්ෂයේදී විශ්වවිදයාලයේ මූල්‍ය අංශය විසින් පොදු ලෙජරය, වැටුප් ලේඛනය, තොග හා ස්ථාවර වත්කම්වල ගනුදෙනු වාර්තා කිරීම සඳහා පරිගණක පද්ධති 04 ක් ස්ථාපනය කරන ලදී. මූලික වශයෙන් සියලුම පරිගණක පද්ධති ස්ථාපනය කිරීමට අපහසු බැවින් ප්‍රමුඛතා පදනම මත අදාළ පද්ධති ස්ථාපනය කරන ලදී. ඒ අනව, එක් එක් කාණ්ඩයේ වත්කම් විගණනය සම්පූර්ණ කර |

| | |
|---|---|
| | ස්ථාවර වත්කම් මෘදුකාංග යාවත්කාලීන කිරීමට තීරණය විය. රසායනාගාර උපකරණ විගණනය කිරීමෙන් පසුව රසායනාගාර උපකරණවලට අදාළ ස්ථාවර වත්කම් වාර්තා කිරීමේ පද්ධතිය නිසි ලෙස යාවත්කාලීන කර ඇත. ගෘහ භාණ්ඩ හා සවි කිරීම්, පරිගණක, කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ, ක්‍රීඩා උපකරණ, වෙනත් වත්කම් හා මෝටර් රථ ආදී අනෙකුත් වත්කම් විගණනයට ලක් කෙරෙන අතර පසුව එම ස්ථාවර වත්කම්වලට අදාළ ස්ථාවර වත්කම් වාර්තාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. කෙසේවෙතත්, මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනයක් පොදු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. |
| 2.2.5 (අ) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 2004/ED/HE/45 අනුව විශ්වවිද්‍යාල සේවක සේවිකාවන් සඳහා නවාතැන් පහසුකම් ලබාදෙමින් විශ්වවිද්‍යාලයේ දියුණුව සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට ආරම්භයේ සිටම කටයුතු කරන ලදී. මූලිකවම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව නේවාසිකාගාර ලබාදුන් අතර එය ප්‍රායෝගිකව සිදුකිරීමට අපහසු වූ බැවින් 2017 වර්ෂයේ සිට නේවාසිකාගාර ලබාගැනීම සඳහා නිවාස කුලී වශයෙන් මුදලක් විශ්වවිද්‍යාලයෙන් ලබාදෙන ලදී.<br><br>කෙසේ වෙතත්, මෙම ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගන්නා ලෙස නියෝග කර ඇත. |
| (ආ) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අරක්ෂක සේවාව ක්‍රියාත්මක වන්නේ එක් එක් ස්ථානය සඳහා වසරේ දින 365 ම ආරක්ෂක සේවා ලබාදීමේ අරමුණිනි. ඒ අනුව, ලංසු කැඳවීමේදී අවම වැටුප ගණනය කරවේතනය ගණනය කරන්නේ කෙසේදැයි ටෙන්ඩරයේ පැහැදිලිව දක්වා ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුව (කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු හා විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලන ඒකකයේ නියෝජිතයෙකු ඇතුළු පස් දෙනෙකුගෙන් යුතු කමිටුවක්) ලංසු තැබීමේදී අවම වැටුප නිවැරදිව ගණනය කර ඇති ලංසුව සඳහා සුදුසුකම් ලත් ලංසුකරුට ටෙන්ඩරය ලබාදී ඇත. මේ අනුව, 2020/2021 වර්ෂය සඳහා මුළු දින 365 සැලකිල්ලට ගනිමින් අවම දෛනික වැටුප රු. 1,035 (JSO/LSO), රු. 1,085 (OIC) හෝ ඊට වැඩි මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුට ටෙන්ඩරය ලබාදෙන ලදී. ඒ අනුව, නිවැරදිව ගණනය කර ඇති KYS ආරක්ෂක සමාගමට රු. 1,037.91 (JSO/LSO), රු. 1.085.47 (OIC) කට ලංසුව ලබාදෙන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව අවම වැටුප නොගෙවූ ලංසුකරුවන් ප්‍රතික්ෂේප කර ඇත. දක්වා ඇති පරිදි පළමු හා දෙවන අවම ලංසු ඉදිරිපත් කළ ලංසුකරවන්ගේ මිල ගණන් පහත දැක්වේ.<br><br>i. සක්සස් ලංක ආරක්ෂක සේවය -දෛනික අවම වැටුප රු.1017.00 (JSO/LSO), රු.1014.74 (OIC) |

| | |
|---|---|
| | ii. The United Guards Global (PVT) Ltd.- දෛනික අවම වේතනය රු.999.00 (JSO/LSO)<br><br>2021/2022 වසර සඳහා දෛනික අවම වැටුප රු. 1,161.50 (JSO/LSO). රු. 1.219.50 (OIC) හෝ ඊට වැඩි මුළු දින 365 ක් සඳහා ඉදිරිපත් කළ ලංසුකරුට ටෙන්ඩරය ලබාදෙන ලදී. ඒ අනුව, නිවැරදිව ගණනය කර ඇති KYS ආරක්ෂක සමාගමට ලංසුව රු.1,192.27 (JSO/LSO), රුත 1,242.27 (OIC) ලෙස ලබාදෙන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව විසින් අවම වැටුප නොගෙවූ ලංසුකරුවන් ප්‍රතික්ෂේප කර ඇත.<br><br>ඔබ විසින් දක්වා ඇති පරිදි පළමු සහ දෙවන අවම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන්ගේ මිල පහත දැක්වේ.<br><br>i. We Security Service (PVT)Ltd දෛනික අවම වේතන රු.1,134.00 (JSO/LSO), රු.1,185.00 (OIC)<br>ii. Mount Regal Security (PVT)Ltd දෛනික අවම වේතන රු.1,146.00 (JSO/LSO), රු.1,198.46 (OIC) |
| (ඇ ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා 921 චක්‍රලේඛය අනුව මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකලයාධිපති ලෙස සේවය කරන ආචාර්ය කුලතුංග මහත්මියට එම තනතුරට අදාළ සුදුසුකම් නොමැත. බඳවාගැනීම් පටිපාටියේ සුදුසුකම් සමඟ නොගැලපෙන බව සාකච්ඡා වූ බැවින් විගණන හා කළමනාකරණ කමිටුව විසින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාලක සභාව වෙත යොමු කිරීමට යෝජනා කරන ලදී. ඒ අනුව 2022 ඔක්තෝබර් 28 වන දින පැවති 178 වන පාලක සභා රැස්වීමේදී කුලතුංග සහත්මියගේ ඉහත කරුණ අධ්‍යයනය කර පාලක සභාවට වාර්තා කිරීම සඳහා සාමාජිකයන් දෙදෙනෙකුගෙන් යුත් අනු කමිටුවක් පත් කරන ලදී. අංක C/180/05/25 දරන පාලක සභා පත්‍රිකාවට අනුව අනු කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලූ පාලක සභාව ආචාර්ය කුලතුංග මහත්මියගේ පත්වීම පහත පරිදි සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා අචාර්ය කුලතුංග මහත්මියට අධ්‍යාපන සුදුසුකම් හා අදාළ ක්ෂේත්‍රෙය් වසර හයක පළපුරුද්දක් තිබිය යුතු බැවින් ඔහු සහකාර පුස්තකාලයාධිපති (අන්තර්) තනතුරට 2018 අගෝස්තු 01 දින සිට වසර 03 ක කාලයක් ඇතුළත් කර ඇත. 2021 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති II තනතුරට උසස් කිරීමට පාලක සභාව විසින් තීරණය කරන ලදී. එම තීරණය මේ වනවිටත් ක්‍රියාත්මක කර ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.<br><br>S.M.T.R. Samaratunga මහත්මියගේ විභාග ප්‍රතිඵල විෂමතාවය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවතිවන ලෙස 2021.07.07 දින බදුල්ල පළාත භාර නියෝජ්‍ය පොලිස්පති වෙත පැමිණිල්ලක් කරන ලද අතර ඊට අදාළ පරීක්ෂණ තවදුරටත් ක්‍රියාත්මක වේ. මෙම |

| | |
|---|---|
| | සිද්ධිය සම්බන්ධයෙන් බදුල්ල පොලිස් ස්ථානයේ විශේෂ අපරාධ විමර්ෂණ කොට්ඨාසයේ ස්ථානාධිපතිවරයා විසින් බදුල්ල එම්/යූ නඩු අංක 44222 යටතේ බදුල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර 2023.06.04 දිනැති අංක BD/SCIB/OIC/448/2023 යටතේ නඩුවක් ආරම්භ කර ඇත. එය අප වෙත ලිපියකින් දන්වා ඇත. ගරු මහේස්ත්‍රාත් අධිකරණය ලබාදෙන තීන්දුව අනව ඉදිරි කටයුතු සිදුකරන බව මෙයින් දන්වමි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද අංක UGC/IDD/GEN/01 ලිපියේ දක්වා ඇති නිර්දේශයන්ට අනුව අයිතිය පවරාගැනීමේ කටයුතු විධිමත් ලෙස සිදුකිරීම සඳහා විශ්වවිදයාල පාලක සභාවේ අනුමැතිය සහිතව විශේෂඥ දැනුම ඇති විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයෙකු 2017 දෙසැම්බර් 11 දින පත් කරන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා පවරාගත් ඉඩම්වල අයිතිය පවරාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පවරාගැනීමට කොමිෂන සභාව කටයුතු කරමින් පවතී. ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය (මුළු භූමි ප්‍රමානය අක්කර 64 සඳහ) එකින් එක විමර්ශනය කර මන්දගාමී වූ ඉඩම් කඩිනමින් අත්පත් කර ගැනීමට කටයුතු කරන අතර තක්සේරු දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මිනින්දෝරු පත්‍රිකා අත්පත් කරගැනීම හා ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු විධිමත් ලෙස සිදුකෙරෙන අතර මෙම නිලධාරියාගේ පැමිණීමෙන් පසුව හෙක්ටයාර 0.819 ක කළුගල්පිටිය ඉඩම් පවරාදීම නිම කර ඇති අතර අක්කර 12 කින් යුත් වේවස්ස උද්‍යානය සහ අක්කර 05 කින් යුතු මහවෙල ගම්මානය, තලගොඩ ගම්මානය යන ඉඩම් අත්පත් කරගැනීම් සිදු වෙමින් පවතී. එසේම එම නිලධාරියාගේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විශ්වවිද්‍යාල ඉඩම්, ගොඩනැගිලි,නඩත්තු කමිටුව හා පාලක සභාව විසින් සමාලෝචනය කරනු ලබන අතර ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කෙරේ. |
| (ඇ) | 2016.12.30 දිනැති පත්වීම් ලිපියට අනුව, නව ව්‍යාපෘති ඉදිකිරීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, ගෙවීම් සහතික කිරීම, ප්‍රාග්ධන කටයුතු සඳහා බිල්පත්, කෙොන්ත්‍රාත් කටයුතු, ඍජු ශ්‍රම කළමනාකරණය වැනි ව්‍යාපෘති කළමනාකරුවකු විසින් සිදුකළ යුතු විශ්වවිද්‍යාලයේ නව ඉදිකිරීමට අදාළ සියලුම උපදේශනකටයුතු සඳහා A.M.J.T. ගංගානන්ද මහතා වගකිව යුතුය. ඒ අනුව, රු. මිලියන 1200 ක් වටිනා ව්‍යාපෘති 05 ක ටෙන්ඩර් හා ඉදිකිරීම් භාරව ඔහු කටයුතු කරන ලදී. අදාළ ව්‍යාපෘති 05 සඳහා උපදේශන සේවා සඳහා වෙන් කර ඇත් මුදලින් ඔහුට ගෙවීම් කරන ලදී. ඒ අනුව මෙම විශ්වවිද්‍යාලය සඳහා ඉදිවෙමින් පවතින නව ව්‍යාපෘති හා ව්‍යාපෘතිවල අධීක්ෂණය සිදුකිරීමෙන් ඉහත සඳහන් කළ ව්‍යාපෘති ඉතා සාර්ථකව නිම කිරීමට හැකිවිය. තවද, මේ ආකාරයට අර්ධ කාලීන පදනමින් බඳවාගත් ව්‍යාපෘති ඉංජිනේරු/ ව්‍යාපෘති කළමනාකරු තනතුරට නිලධාරියාගේ කැපවීම, අධීක්ෂණය හා පළපුරුද්ද |

| | |
|---|---|
| | තුළින් විශ්වවිද්‍යාලය සඳහා අනුමත සියලුම ව්‍යාපෘති නිම කිරීමට හැකිවිය. එසේම ඔහුගේ සේවා කාලය 2023 ජුනි 01 වනදා සිට තවත් මාස තුනකට (03) දීර්ඝ කළද ඔහු එම පත්වීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් ඔහු තවදුරටත් සේවය නොකරයි. |
| (ඇ) | 2005 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ආරම්භ කරන විට ඌව පළාත අවම අධ්‍යාපන මට්ටමක් සහිත පලාතක් ලෙස වර්ගීකරණය කර තිබුණි. විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අරමුණු වන්නේ කලාපයේ/පළාතේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම හා අධ්‍යාපනික කටයුතු වලට දායකවීම, උසස් අධ්‍යාපන අවශ්‍යතා ඉහළ නැංවීම හා අනෙකුත් විශ්වවිද්‍යාලවල පවතින ගැටලුවලට විසඳුම් ලබාදෙන විශ්වවිදයාලයක් නිර්මාණය කිරීමයි. එමෙන්ම සිසුන් 502 දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම් ඉදිකර ඇත් අතර අනෙකුත් සිසුන් සඳහා විශ්වවිද්‍යාලය අවට නේවාසිකාගාර පහසුකම් ලබාදීමෙන් නෙවාසිකාගාර ලබාදිය හැක. ඒ අනුව ප්‍රදේශයේ ආර්ථික මට්ටම නංවාලීමට ද ඉවහල් විය. නමුත් දේශපාලන මැදිහත්වීම් හා උපකුලපතිවරුන්ගේ ඉල්ලීම මත 2015 වසරේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ වූ අතර මේ සඳහා විශ්වවිද්‍යාලය අසන්නයේ (පස්සර පාර, 2 කණුව) වැවස්ස වත්ත ඉඩමේ අක්කර 12 ක් පවරාගෙන ඇත. කෙසේ වෙතත්, ඉඩම ලබාගැනීමෙන් පසුව සිසුන් 2000 කට පමණ නේවාසිකාගාර පහසුකම් ලබාදීම විශ්වවිද්‍යාලයේ අපේක්ෂාවයි. එසේම විශ්වවිද්‍යාලය විසින් 2016 වසරේ පුවත්පත් දැන්වීමක් පළ කර නේවාසිකාගාර ඉදිකිරීම සඳහා පෞද්ගලික ඉඩම් හිමියන්ගෙන් ඉඩම් ලබාගැනීමට කටයුතු කරන ලදී. එක් ඉඩම් හිමියෙකු පමණක් පුවත්පත් දැන්වීමට ප්‍රතිචාර දක්වා ඇති අතර පරීක්ෂා කිරීමේදී ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කර නොතිබූ බැවින් ඉඩම මිලදී ගෙන නොතිබුණි. එමෙන්ම කාර්ය මණ්ඩල නේවාසිකාගාර සඳහා කළුගල් පිටිය අක්කර 2 ක ඉඩමක් ලබාගෙන ඇති අතර නේවාසිකාගාර ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන මේ වනවිට ලබාදෙමින් පවතී. එමෙන්ම, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විශ්වවිද්‍යාල සඳහා නේවාසිකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘති හරහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට නේවාසිකාගාර නොලැබීමට ප්‍රධානතම හේතුව වූයේ තැනිතලා ඉඩමක් සොයා ගැනීමේ දුෂ්කරතාවයයි. ඒ අනුව එම ව්‍යාපෘතියෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට නේවාසිකාගාර ලබා දී නොතිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාල පරිපාලනය නේවාසිකාගාර ඉදිකිරීම සඳහා සියලු පාර්ශවකරුවන් සමඟ අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර එම ඉඩම ද පවරාගෙන ඇති බව දන්වා සිටිමි. |

## 8 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත්කර ගැනීම

| ඉලක්කය | අරමුණු | ජයග්‍රහණ |
|---|---|---|
| **ඉලක්කය 1:**<br>කර්මාන්තක්ෂේත්‍රයේ සහ සමාජයේ අවශ්‍යතා සපුරාලීමට දැක්මක් සහ හැකියාවක් ඇති දක්ෂ උපාධිධාරීන් බිහි කිරීම. | 1.1 ජීවිතය සඳහා වෘත්තීයභාවය සහ දැක්ම ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය කුසලතා, ආකල්ප සහ වටිනාකම් සමඟ විෂය දැනුම, කුසලතා සහ නිපුණතා වැඩිදියුණු කිරීම | 1.1.1 අධ්‍යයන වැඩසටහන් සඳහා යාවත්කාලීන විෂයමාලා සංවර්ධනය කර පවත්වාගෙන යාම.<br><br>1.1.2 අත්‍යාවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම සහ මනා දක්ෂතාවලින් හෙබි උපාධිධාරීන් බිහි කිරීම සඳහා පුළුල් සාමාන්‍ය අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම.<br><br>1.1.3 අගය එකතු කිරීම පිළිබඳ දැනුමට අමතරව අත්‍යවශ්‍ය කුසලතා සහ පුළුල් සාමාන්‍ය අධ්‍යාපනය ලබා දීම |
| | 1.2 සිසුන්ගේ ව්‍යවසායකත්ව සහ තාක්ෂණික කුසලතා විශිෂ්ටතා මට්ටමට වැඩිදියුණු කිරීම | 1.2.1 සම්මන්ත්‍රණ, වැඩමුළු, කර්මාන්ත ප්‍රධානීන් සමඟ චාරිකා, පාඨමාලා, ඉන්කියුබේෂන් ව්‍යාපෘති සංවිධානය කිරීම, කර්මාන්ත ස්ථානගත කිරීම් සහ ව්‍යවසායක දැනුම නිර්මාණය කිරීම |
| | 1.3 ඉල්ලුම මත පදනම් වූ නව උපාධි වැඩසටහන් හඳුන්වා දීමෙන් අධ්‍යාපනය ලබාදීමේ විෂය පථය පුළුල් කිරීම | 1.3.1 ජාතික සම්පත් පදනමට ඉහළ අගය එකතු කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගනිමින් නව උපාධි වැඩසටහන් හඳුන්වා දීම |
| | | |
| **ඉලක්කය 2:**<br>**විදේශීය සිසුන් සඳහා උසස් අධ්‍යාපනය සඳහා අවස්ථා පුළුල් කිරීම මගින් ගෝලීය පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීම** | 2.1 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විදේශීය සිසුන් සඳහා ආකර්ශනීය විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම | 2.1.1 උසස් මට්ටමේ ඉගෙනුම් පහසුකම් ඇති කිරීම<br><br>2.1.2 සිසුන් / කාර්ය මණ්ඩලය හුවමාරු කිරීමේ වැඩසටහන් සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කරීම |
| | 2.2 සංස්කෘතික විවිධත්වය තුළින් තිරසාර සංවර්ධනයක් සහතික කිරීම | 2.2.1 දැනුම, සිසුන් සහ කාර්ය මණ්ඩලය හුවමාරු කර ගැනීම මගින් ලෝක අධ්‍යාපනය සහ ගෝලීය අවශ්‍යතා පිළිබඳ වඩා හොඳ දැනුමක් සඳහා බහු සංස්කෘතික පරිසරයක් නිර්මාණය කිරීම |

| | | |
|---|---|---|
| | | |
| **ඉලක්කය 3:**<br>**අධ්‍යයන වැඩසටහන් ඵලදායී ලෙස ලබා දීමට සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට නව්‍ය සහ නම්‍යශීලී යාන්ත්‍රණ ස්ථාපිත කිරීම** | 3.1 ජාතික හා ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා අධ්‍යයන වැඩසටහන්වල අන්තර් විෂයීක ස්වභාවය වර්ධනය කිරීම | 3.1.1 අඛණ්ඩව අධ්‍යයන වැඩසටහන් සමාලෝචනය කිරීම<br><br>3.1.2 නව අධ්‍යයන පාඨමාලා ආරම්භකර රජයේ අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම |
| | 3.2 බාහිර සහයෝගීතා ශක්තිමත් කිරීම, පර්යේෂණ සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ හවුල්කාරිත්ව ඇතිකර ගැනීම සහ ගිවිසුම්වලට එළඹීම | 3.2.1 රාජ්‍ය ප්‍රමුඛතා සහ පෞද්ගලික අංශයේ අවශ්‍යතා තීරණය කිරීම සහ ජාතික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් පර්යේෂණ ආරම්භ කිරීමට සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට සෘජු අභියෝග ඉදිරිපත් කිරීම<br><br>3.2.2 පුද්ගලික අංශය සමඟ සමීපව වැඩ කිරීමේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම<br><br>3.2.3 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය (UBL) හරහා දේශීය කර්මාන්ත සඳහා සහාය වීම<br>3.2.4 කර්මාන්ත සමඟ සබඳතා ගොඩනැගීම |
| | 3.3 කාර්ය මණ්ඩලයේ ඉගැන්වීම්, පර්යේෂණ සහ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම | 3.3.1 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය හරහා සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කුසලතා වර්ධනය කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම<br><br>3.3.2 රජයට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කාර්ය මණ්ඩල සාමාජිකයින් පෙළඹවීම සහ ජාතියට සහයෝගය දැක්වීමට පෙළඹවීම |
| | | |
| **ඉලක්කය 4:**<br>**ආදර්ශමත් සේවා ප්‍රසම්පාදනකරුවෙකු සහ සේවා යෝජකයෙකු වීම** | 4.1 විශ්වවිද්‍යාලයේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළ සුදුසුකම් ලත් ශ්‍රම බලකායක් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම | 4.1.1 සුදුසුකම් ඇති සහ උචිත ශ්‍රම බලකායක් රඳවා ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම |
| | 4.2 2021 වර්ෂය වන විට ඉගැන්වීමේ, පර්යේෂණවල සහ පරිපාලනයේ ප්‍රමිතීන් විශිෂ්ටතා | 4.2.1 කර්මාන්ත සේවකයින් සඳහා දැනුම, කුසලතා සහ වෘත්තීය පුහුණුව ලබා දීම |

| | | |
|---|---|---|
| | මට්ටමට දියුණු කිරීම | |
| **ඉලක්කය 5:**<br>**ප්‍රධාන පෙළේ තාක්‍ෂණයේ සහාය ඇතිව ඉගෙනීමට, ඉගැන්වීමට සහ පර්යේෂණ සඳහා හොඳම පරිසරයක් සපයන වඩාත් ආකර්ශනීය සහ හොඳින් සැලසුම් කළ විශ්ව විද්‍යාලයක් බවට පත්වීම** | 5.1 ඉගැන්වීමේ සහ ඉගෙනීමේ කාර්යයන් පහසු කිරීම සඳහා හිතකර භෞතික හා සමාජ පරිසරයක් නිර්මාණය කිරීම | 5.1.1 ඵලදායි සන්නිවේදනය සඳහා නවීන දේශන ශාලා ස්ථාපිත කිරීම සහ දේශන ශාලා සඳහා අති නවීන ඉගැන්වීම් ආධාරක සහ සන්නිවේදන උපකරණ සහිත පහසුකම් සැලසීම<br><br>5.1.2 අංගසම්පූර්ණ ඉගැන්වීම්, මූලික හා උසස් පර්යේෂණ විද්‍යාගාර සංකීර්ණ ස්ථාපිත කිරීම<br><br>5.1.3 කාර්ය මණ්ඩලය සඳහා විශිෂ්ට පහසුකම් සහිත කාර්ය පරිසරයක් නිර්මාණය කිරීම<br><br>5.1.4 උපාධි වැඩසටහන් වලට අදාළ කාර්මික පුහුණුව |
| | 5.2 විශ්වවිද්‍යාල ප්‍රජාවගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම | 5.2.1 විශ්වවිද්‍යාලයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මූලාශ්‍රගත සේවාවන් කළමනාකරණය කිරීම |
| | 5.3 විශ්වවිද්‍යාලය තුළ නවක වදයෙන් තොර පරිසරයක් නිර්මාණය කිරීම | 5.3.1 සිසුන් සඳහා අඛණ්ඩ උපදේශන ක්‍රියාවලිය පවත්වාගෙන යාම සහ සදාචාර විරෝධී හැසිරීම් නිරීක්ෂණය කිරීම සඳහා සමාජ කණ්ඩායම් නිර්මාණය කිරීම. |
| | 5.4 ඉගැන්වීම, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම | 5.4.1 සංවර්ධිත පුස්තකාල තොරතුරු පද්ධතිය සහ දැනුම පදනම් කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම |
| | 5.5: ඉගැන්වීම, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සැපයීම | 5.5.1 සියලුම දේශන ශාලා සහ නේවාසිකාගාර සම්බන්ධ කරමින් සංවර්ධිත විශ්වවිද්‍යාල තොරතුරු තාක්ෂණ පහසුකම් ඇතිකිරීම |
| | | |
| **ඉලක්කය 6:** | 6.1 මූල්‍ය කාර්යක්ෂමතාව සහ සඵලතාවය සහතික කිරීම | 6.1.1 මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණ පද්ධති ස්ථාපිත |

| | | |
|---|---|---|
| **අධ්‍යයන, මූල්‍ය සහ පරිපාලන කාර්යක්ෂමතාව සහ සඵලතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික ධාරිතාව ඉහළ නැංවීම** | | කිරීම සහ මූල්‍ය අවශ්‍යතා සඳහා වි.වි.ප්‍ර.කො./භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවීම. |
| | 6.2 කාර්යක්ෂම පරිපාලන පද්ධතියක් පවත්වාගෙන යාම | 6.2.1 දැක්ම සමග පෙලගැසීමට සියලුම කාර්ය මණ්ඩලයට නායකත්වය දීම සහ අභිප්‍රේරණය කිරීම සහ පිහිටවූ ඉලක්ක වෙත කාර්යසාධනය සම්බන්ධ කිරීම.<br>6.2.2 මෙහෙයුම් සාර්ථකත්වය සඳහා පරිපාලනයේ නව උපාය මාර්ග අනුගමනය කිරීම.<br>6.2.3 6.2.3 මූල්‍ය අංශ, වත්කම් කළමනාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පාදක පද්ධති ස්ථාපිත කිරීම සහ විභාග සහ සිසුන්ගේ සංඛ්‍යාලේඛන සඳහා අඛණ්ඩව පද්ධති සංවර්ධනය කිරීම. |
| | 6.3 අධ්‍යයන සේවාවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | 6.3.1 ඌව වෙල්ලස්ස තේමාව මත පදනම්ව ශක්තිමත් අන්තර් විෂයීක සහ ව්‍යවසායකත්වය ලක්ෂණ සහිත සියලුම උපාධි වැඩසටහන් සකස් කිරීම.<br>6.3.2 දේශන හා උපදේශනය, පර්යේෂණ සහ සමාජ වගකීම සම්බන්ධයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය ඇගයීෙ |
| | 6.4 සියලුම ක්‍රියාකාරී ක්ෂේත්‍ර ආවරණය කරමින් ඵලදායී තත්ත්ව සහතික පද්ධතියක් පවත්වාගෙන යාම | 6.4.1 ක්‍රියාකාරී ක්ෂේත්‍ර සඳහා තත්ත්ව සහතික කණ්ඩායමක් / ඒකකයක් ස්ථාපිත කිරීම සහ ක්ෂේත්‍රවල ගුණාත්මකභාවය සමාලෝචනය කිරීම.<br>6.4.2 විශ්වවිද්‍යාල කළමනාකරණ මට්ටමින් අධීක්ෂණ ක්‍රියාවලි සමාලෝචනය කිරීම සහ නිවැරදි කිරීමේ මාර්ග හඳුනා ගැනීම. |
| | | |